# වාර්ෂික වාර්තාව

# 2017

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**අංක 117- සුභද්‍රාරාම පාර - ගංගොඩවිල**

**නුගේගොඩ**

# පටුන


- වාර්තාව ගරු ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීම- ———— 01
- සභාපතිතුමාගේ පනිවුඩය ———— 02
- ආයතනයේ දර්ශනය හා මෙහෙවර ප්‍රකාශය- ———— 03
- අධ්‍යක්ෂ මණ්ඩලය- ———— 04
- ආයතනයේ සංවිධාන ව්‍යුහය- ———— 05
- පෙරවදන- ———— 06

**අංශභාර අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා**

- මෙහෙයුම් අංශය- ———— 09
- රක්ෂණ අංශය- 16
  - ❖ කෘෂිකාර්මික රක්ෂණ කටයුතු සහ පශු සම්පත් රක්ෂණ කටයුතු
- ගොවි විශ්‍රාම වැටුප් අංශය- 20
  - ❖ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- පරිපාලන හා මානව සම්පත් අංශය- 27
- අභ්‍යන්තර විගණන අංශය 32
- සැලසුම් අංශය 35
- මුදල් අංශය 41

**ගිණුම්**

- පෙර වසර පහක මූල්‍ය තොරතුරු 43
- සමස්ත යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන- 47
- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- 50
- ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- 73
- ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- 89

**විගණකාධිපති වාර්තා**

- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- 105
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- 118
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- 132

**විගණකාධිපති වාර්තා සඳහා පිළිතුරු**

- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- 142
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- 171
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 180

විදුලි පණිවිඩ / தந்தி } රක්ෂණ / ரக்ஷண
117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd, Gangodavila, Nugegoda

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை**
**AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD**

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. } AAIB/8/C
ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. }
දිනය / திகதி / Date } 2019.04.10

ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය,
නො 288,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

<u>වාර්ෂික වාර්තාව - 2017</u>

2017 වසර තුළ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පරිපාලනය,මෙහෙයුම් හා මූල්‍ය කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය සහ වර්ෂය තුල සිදුකරන ලද සියළුම ක්‍රියාකාරකම් ඇතුලත් 2017 මණ්ඩලීය වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

සුමිත් වර්ණකුලසූරිය
සභාපති
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය



| දුරකථන / தொலைபேசி / **Telephones** | සභාපති / தலைவர் / **Chairman** | අධ්‍යක්ෂ ජනරාල් / **Director General** | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் / **Head Office** |
|---|---|---|---|
| ෆැක්ස් / பெக்ஸ் / **Fax** | 011-2812571<br>011-2812572<br>011-2812573 | 011-5732397<br>011-2812574 | 011-5384000 |

## ගරු සභාපතිතුමාගේ පණිවුඩය

දේශගුණික හා කාලගුණික විපර්යාසයන් හේතුවෙන් හටගන්නා වළක්වාගත නොහැකි ස්වභාවික විපත් හමුවේ දේශීය කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමෙහිලා රජය වෙත පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා 1973 අංක 27 දරන කෘෂිකාර්මික රක්ෂණ පනත මඟින් පිහිටුවන ලද කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් සිය කාර්යභාරය 2017 වර්ෂයේදීද මැනවින් ඉටුකර ඇත. ඒ අනුව, 2016/2017 මහ කන්නයේදී දිවයින පුරා පැවති දැඩි නියඟයෙන් විපතට පත් ගොවීන් 523,336දෙනෙකු වෙත වගා හානි වන්දි වශයෙන් රු.මි.5,233ක මුදලක් මණ්ඩලය විසින් 2017 වර්ෂයේදී ගෙවීමට කටයුතු කරන ලදී. එමෙන්ම, ගොවි විශ්‍රාම වැටුප්ලාභීන් 148,085 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් වශයෙන් රු.මි.2,686ක්ද, ධීවර විශ්‍රාම වැටුප්ලාභීන් 4,037 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් වශයෙන් රු.මි.59.8ක්ද 2017 වර්ෂයේදී මණ්ඩලය විසින් ගොවි ජනතාව වෙත ප්‍රදානය කර ඇත.

2018 වාර්ෂික අයවැය සඳහා මෙම මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව වී, බඩඉරිඟු, සෝයා, ලොකුළුණු, මිරිස් හා අර්තාපල් වගාවන්ට ගංවතුර, නියඟය හා වන අලින්ගෙන් සිදුවන හානි වෙනුවෙන් ගොවීන්ගෙන් අක්කරයකට රු.675/-ක රක්ෂණ වාරික මුදලක් පමණක් අයකර අක්කරයකට රු.40,000/-ක වන්දි මුදලක් ගෙවීමේ රක්ෂණ යෝජනා ක්‍රමයක් මණ්ඩලය මඟින් සැලසුම් කර 2017/2018 මහ කන්නයේ සිට දිවයින පුරා ක්‍රියාත්මක කිරීම 2017 වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරකම් අතර සුවිශේෂ ක්‍රියාකාරකමක් වනු ඇත.

2017 වර්ෂයේදී කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය රු.මි. 42.3ක ශුද්ධ ලාභයක් උපයාගෙන ඇත. එමෙන්ම, මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ලද තෙවන පාර්ශවීය රථ වාහන රක්ෂණ යෝජනා ක්‍රමය ඇතුළු අනෙකුත් රක්ෂණ යෝජනා ක්‍රම මඟින් 2017 වර්ෂය තුළදී මණ්ඩලය ඉපයූ ආදායම රු.මි. 60.8ක් වූ අතර, එය 2016 වර්ෂයට සාපේක්ෂව 79%ක වර්ධනයකි.

ඒ අනුව තිරසර අරමුණු සපුරාගැනීමත්, ඒ තුළින් දේශීය කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමත් උදෙසා ඉටුකළ මණ්ඩලීය කාර්ය සඵලතාවයන්හි වර්ධනයක් ළඟාකර ගත හැකි වූ සාර්ථක වසරක් ලෙස 2017 වසර හැඳින්විය හැකිය.

**සභාපති,**

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.**

# කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

## දැක්ම

දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා වීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීම.

## මෙහෙවර

කෘෂිකාර්මික රක්ෂණය සහ ආරක්ෂණය සැලසීම සඳහා සාමූහික ප්‍රයත්නයන් හා අදාල ආයතන සම්බන්ධීකරණය තුළින් ජාත්‍යන්තරව පිළිගත හැකි විශිෂ්ඨ සේවාවක් සැපයීම.

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2017

| | නම | තනතුර |
|---|---|---|
| 01. | සිඩ්නි ගජනායක මහතා<br>සභාපති<br>කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | සභාපති |
| 02. | චම්පා බාලසූරිය මහත්මිය<br>අධ්‍යක්ෂ<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව,<br>මහා භාණ්ඩාගාරය,<br>කොළඹ 01 | සාමාජික |
| 03. | කේ.බී.රාජපක්ෂ මහතා<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර බැංකු කටයුතු),<br>මහජන බැංකුව,<br>අංක 75, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,<br>කොළඹ 02 | සාමාජික |
| 04. | එස්. බාලසුබ්‍රමනියම් මහතා<br>අතිරේක ලේකම් (සංවර්ධන),<br>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය,<br>නව මහලේකම් කාර්යාලය,<br>මාලිගාවත්ත, කොළඹ 10<br>(2016.11.04 සිට 2017.04.27 දක්වා) | සාමාජික |
| 05. | එන්.බී.එම්.රණතුංග මහතා<br>අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණික),<br>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය,<br>නව මහ ලේකම් කාර්යාලය,<br>මාලිගාවත්ත, කොළඹ 10<br>(2017.06.21 සිට) | සාමාජික |
| 06. | පී.එස්.කේ.ආර්.වීරකෝන් මහතා<br>අතිරේක ලේකම් (පාලන හා මානව සම්පත්),<br>කෘෂිකර්ම අමාත්‍යාංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර මාවත,<br>රාජගිරිය | සාමාජික |
| 07. | ඩී.වී.බන්දුලසේන මහතා<br>ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් (වැ.බ.),<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>කොළඹ 07 | සාමාජික |
| 08. | ඩබ්.ඒ.ජී.සිසිර කුමාර මහතා<br>අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන),<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,<br>පේරාදෙණිය | සාමාජික |
| 09. | එස්.එම්.ජී.සමරකෝන් මහතා<br>අංක 120, හුරුළුමීගහපිටිය,<br>මෙගොඩවැව,<br>අනුරාධපුරය | සාමාජික |

# ආයතනික ව්‍යුහය



කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ආයතනික ව්‍යුහය
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
පාලන හා මානව සම්පත් අංශය
මුදල් අංශය
මෙහෙයුම් අංශය
රක්ෂණ අංශය
විශ්‍රාම වැටුප් අංශය
මෙහෙයුම් හා ඇගයුම් අංශය
පරිගණක අංශය
නීති අංශය
අභ්‍යන්තර විගණන අංශය
අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත්)
අධ්‍යක්ෂ (මුදල්)
අධ්‍යක්ෂ (මෙහෙයුම්)
අධ්‍යක්ෂ (රක්ෂණ)
අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (රක්ෂණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිගණක)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
ප්‍රධාන කාර්යාලය
දිස්ත්‍රික් කාර්යාල
සහකාර අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත්)
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්)
සහකාර අධ්‍යක්ෂ (දි.කා)
සහකාර අධ්‍යක්ෂ (අලෙවි)
සහකාර අධ්‍යක්ෂ (වගා රක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ (පශු රක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ (වන්දි රක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
පරිපාලන නිලධාරී
මූල්‍ය නිලධාරී
පරිපාලන නිලධාරී
සැලසුම් නිලධාරී
පද්ධති පරිපාලක
ගොවි විශ්‍රාම වැටුප් අංශය
ධීවර විශ්‍රාම වැටුප් අංශය
සැපයුම් නිලධාරී
සංවර්ධන නිලධාරී
අභ්‍යන්තර විගණන නිලධාරී
ප්‍රවාහන සහකාර කළමනාකරණ සහකාර (තාක්ෂණික)
ලේකම් කළමනාකරණ සහකාර (තාක්ෂණික)
පොත් තබන්නා කළමනාකරණ සහකාර (තාක්ෂණික)
තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘෂ්‍ය) කළමනාකරණ සහකාර (තාක්ෂණික)
දත්තාංග හා ජාලකරණ ශිල්පී කළමනාකරණ සහකාර (තාක්ෂණික)
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ගබඩා භාරකරු
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)
මුදල් අයකැමි (තාක්ෂණික නොවන)
ක්ෂේත්‍ර නිලධාරී (තාක්ෂණික නොවන)
රියදුරු
කාර්යාල සහායක

# පෙරවදන

දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂිරක්ෂණ ආයතනය වීමේ දැක්ම පෙරදැරි කොටගෙන දේශීය කෘෂිකර්මාන්තයේ අඛණ්ඩ පැවැත්මට විශාල දායකත්වයක් සපයමින් මණ්ඩලය ක්‍රියාත්මක වෙමින් පවතින අතර, මෙම පසුබිම තුළ ආයතනයේ ස්ථිරසාර පැවැත්ම හා තෘප්තිමත් පාරිභෝගික සේවාවක් අඛණ්ඩව පවත්වාගෙන යාම වැනි අභියෝග ඉතා සාර්ථක ලෙස ජයගත් වසරක් ලෙස 2017 වසර සඳහන් කළ හැක. 2017 වර්ෂය තුල මණ්ඩලයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය රු.මි.42.3 ක ශුද්ධ ලාභයක් ඉපයීමට සමත් විය. මෙම ප්‍රගතිය ළඟා කරගැනීමට මූලික හේතුවනුයේ 2017 වර්ෂය තුල කෘෂි රක්ෂණ යෝජනා ක්‍රම මඟින් උපයාගත් රු.මි.80.9 ක මෙහෙයුම් ලාභයයි.

2014/2015 මහ කන්නයේ සිට මණ්ඩලය විසින් රජයේ සහනාධාර පොහොර වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද “කෙතට අරුණ” අනිවාර්ය වගා රක්ෂණ යෝජනා ක්‍රමය 2017 වර්ෂයේ සිට රජයේ තීරණ මත මණ්ඩලයට ක්‍රියාත්මක කිරීමට නොලැබීම හේතුකොට ගෙන මණ්ඩලයේ සමස්ථ අදායම රු.මි.156.4 දක්වා අඩුවීමක් පෙන්නුම් කර ඇත. එසේ වුවද, මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් වගා රක්ෂණ යෝජනා ක්‍රමයන්ගේ සීඝ්‍ර ප්‍රගතියක් 2017 වර්ෂයේදී පෙන්නුම් කළ අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව 79%ක වර්ධනයකි.

එමෙන්ම, 2016/2017 මහ කන්නයේදීද ජාතික ව්‍යසනයක්ව දිවයින පුරා පැවති දැඩි නියඟයෙන් විපතට පත් ගොවීන් 523,336 දෙනෙකු වෙත වගා හානි වන්දි වශයෙන් රු.මි.5,233ක මුදලක් 2017 වර්ෂයේදී ගෙවීමටද මණ්ඩලය විසින් කටයුතු කරන ලදී. වළක්වාගත නොහැකි ආපදාවන් හේතු කොටගෙන සිදුවන වගා හානි වලදී ගොවි ජනතාවගේ ආර්ථිකය ස්ථායී කිරීමේ රජයේ වගකීම ඉටුකිරීම පැවරී ඇති රාජ්‍ය ආයතනය වශයෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් එම වගකීම මැනවින් ඉටුකළ අවස්ථාවක් ලෙස මෙම වගා හානි වන්දි මුදල් ගෙවීම හැඳින්විය හැක.

**වාර්ෂික වාරික ආදායම 2013 සිට 2017 දක්වා**

| රක්ෂණ ක්‍රමය | 2013 (රු.මිලි.) | 2014 (රු.මිලි.) | 2015 (රු.මිලි.) | 2016 (රු.මිලි.) | 2017 (රු.මිලි.) |
|---|---|---|---|---|---|
| වගා රක්ෂණ යෝජනා ක්‍රම | 82.18 | 94.25 | 104.6 | 94.85 | **95.66** |
| පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය | 8.90 | 13.74 | 9.00 | 10.56 | **13.39** |
| ගබඩා/ කෘෂි උපකරණ හා තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රම | 1.53 | 0.62 | 1.08 | 7.82 | **42.11** |
| සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රම | 1.26 | 7.67 | 16.43 | 15.61 | **5.31** |
| පොහොර සහනාධාර රක්ෂණ යෝජනා ක්‍රම | 0.00 | 0.00 | 1006.4 | 608.19 | **0.00** |
| **එකතුව** | **93.87** | **116.28** | **1,137.51** | **737.03** | **156.47** |

**වාර්ෂික ශුද්ධ ලාභය 2013 සිට 2017 දක්වා**

| | 2013 (රු.මිලි.) | 2014 (රු.මිලි.) | 2015 (රු.මිලි.) | 2016 (රු.මිලි.) | 2017 (රු.මිලි.) |
|---|---|---|---|---|---|
| මුළු ආදායම | 101.50 | 122.5 | 1,156.10 | 782.20 | 5735.1 |
| මෙහෙයුම් වියදම | (170.90) | (75.50) | (1,116.10) | (404.50) | (5654.2) |
| මෙහෙයුම් අතිරික්තය | (69.40) | 47.30 | 40.00 | 377.70 | 80.9 |
| රාජ්‍ය ප්‍රදානහාඅනෙකුත්අදායම් | 76.80 | 74.80 | 100.80 | 122.50 | 130.1 |
| මුළු වියදම් (වෙන් කිරීම්ද ඇතුළුව) | (89.30) | (104.00) | (132.00) | (160.30) | 168.7 |
| **වාර්ෂික ශුද්ධ ලාභය/ අලාභය** | (81.90) | 17.80 | 8.80 | 339.90 | 42.3 |

2018 වාර්ෂික අයවැය සඳහා මෙම මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව වී, බඩඉරිඟු, සෝයා, ලොකුළුෑණු, මිරිස් හා අර්තාපල් වගාවන්ට ගංවතුර, නියඟය හා වන අලින්ගෙන් සිදුවන හානි වෙනුවෙන් අක්කරයකට රු.40,000/-ක උපරිම වන්දි මුදලක් ගෙවීමේ දායකත්ව රක්‍ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට 2018 අයවැය යෝජනා මඟින් තීරණය විය. ඒ අනුව, ගොවීන්ගෙන් අක්කරයක් සඳහා රු. 675/-ක රක්‍ෂණ වාරික මුදලක් පමණක් අයකර ඉතිරි රු.2,925/-ක රක්‍ෂණ වාරික මුදල රජය මඟින් යෙදවීමට යටත්ව ඉහත බෝග සඳහා අක්කරයකට රු. 40,000/-ක වන්දි මුදලක් ගෙවීමේ රක්‍ෂණ යෝජනා ක්‍රමයක් මණ්ඩලය මඟින් සැලසුම්කර 2017/2018 මහ කන්නයේ සිට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද අතර, එය 2017 වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරකම් අතර සුවිශේෂී ක්‍රියාකාරකමක් වශයෙන් සඳහන් කළ හැක.

මණ්ඩලයීය රක්‍ෂණ යෝජනා ක්‍රම ක්‍ෂේත්‍ර මට්ටමින් ව්‍යාප්ත කිරීම සඳහා පෙර වර්ෂවලදී මෙන්ම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ගොවි සංවිධාන, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය ඇතුළු ආයතනවල හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ඇතුළු එම ආයතනවල නිලධාරීන්ගේ සහයෝගය 2017 වර්ෂයේදීද අඛණ්ඩව ලබා ගන්නා ලදී. ඊට අමතරව තෙවන පාර්ශවීය රථ වාහන රක්‍ෂණ යෝජනා ක්‍රමය ඇතුළු සාමාන්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රම ව්‍යාප්ත කිරීම සඳහා මණ්ඩලය විසින් පවත්වාගෙන යන ලද බාහිර නියෝජිත ජාලයට ගොවි සංවිධාන නියෝජිතයින් ප්‍රමුඛව බාහිර නියෝජිතයන් විශාල ප්‍රමාණයක් බඳවාගෙන එම නියෝජිත ජාලය පුළුල් කිරීමටද කටයුතු කර ඇත. ඒ අනුව, සහනාධාර පොහොර වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක වූ අනිවාර්ය වගා රක්‍ෂණ යෝජනා ක්‍රමය යටතේ ආදායම් මණ්ඩලයට අහිමි වුවද, අනෙකුත් රක්‍ෂණ යෝජනා ක්‍රම සීඝ්‍ර ලෙස වර්ධනය කර ගැනීමට 2017 වර්ෂයේදී හැකියාව ලැබී ඇත. එහිදී කෘෂි උපකරණ හා තෙවන පාර්ශවීය රථවාහන රක්‍ෂණ යෝජනා ක්‍රමය යටතේ 2016 වර්ෂයේදී මණ්ඩලය උපයාගත් රු.මි.7.82ක ආදායම 2017 වර්ෂයේදී රු.මි. 42.11 දක්වා වර්ධනය කර ගැනීමට හැකිවී ඇති අතර, බාහිර නියෝජිත ජාලය පුළුල් කිරීම ඒ සඳහා බෙහෙවින් ඉවහල් වී ඇති බව සඳහන් කළ යුතුය.

වළක්වා ගත නොහැකි විපත් මඟින් වගා හානි සිදුවීම් අඛණ්ඩව වර්ධනය වෙමින් පවතින බැවින්, හානි තක්සේරු කිරීම සඳහා යොදාගත් ඇස් මට්ටමේ පරීක්ෂාව වෙනුවට නව විද්‍යාත්මක හා තාක්ෂණික ක්‍රමවේදයක් යටතේ නිවැරදි හා කඩිනමින් හානි තක්සේරු කිරීමේ ක්‍රමවේදයක අවශ්‍යතාවය පැන නැඟුණි. ඒ අනුව, කාළගුණික හා දේශගුණික දත්ත අනුව දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමේ ව්‍යාපෘතියක් ලෝක බැංකුව හා අනුබද්ධ ජාත්‍යන්තර මූල්‍ය සමාගමේ (IFC) තාක්ෂණික සහාය ඇතිව ක්‍රියාත්මක කිරීම මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී. එහිදී කාළගුණික දත්ත ලබාගැනීමේ හැකියාව ගොවි ප්‍රජාවගේ පැතිරීම හා කෘෂිකාර්මික වගා බිම් ව්‍යාප්තිය යන සාධකයන්ට අනුව අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, වව්නියාව හා අම්පාර යන දිස්ත්‍රික්ක මෙම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගන්නා ලදී. අදාල දිස්ත්‍රික්කවල මණ්ඩලීය කාර්ය මණ්ඩලය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා කාළගුණ විද්‍යා දෙපොර්තමේන්තුව ඇතුළු ආයතනවල නිලධාරීන් හා ගොවි සංවිධාන වල නියෝජිතයින් සහභාගී කරවා ගනිමින් තොරතුරු හුවමාරු කර ගැනීමේ හා පුහුණු වැඩ සටහන් පවත්වා 2017 වර්ෂයේදී මෙම දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය වැඩි වර්ධනය කිරීමට කටයුතු කරන ලදී.

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ බඳවාගැනීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උද්ගත වූ ගැටළු මඟහරවා ගැනීම සඳහා එම යෝජනා ක්‍රමය ප්‍රතිසංවිධානය කරන ලෙස මණ්ඩලය වෙත ලද උපදෙස් අනුව, උද්ධමනය හා මූර්ත අගය සැලකිල්ලට ගනිමින් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කර අමාත්‍යාංශය මඟින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලදී. එම යෝජනා ක්‍රමය විද්වත් කමිටුවකට යොමු කර උපදෙස් ලබා ගත යුතු බවට අතිගරු ජනාධිපතිතුමා හා ගරු අග්‍රාමාත්‍යතුමා විසින් නිරීක්ෂණ ඉදිරිපත් කර ඇති බැවින් යෝජිත එම නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය විද්වත් කමිටුවකට ඉදිරිපත් කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමුකරන ලදී. ඒ අනුව, 2017 වර්ෂයේදීද ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට නව බඳවා ගැනීම් සිදුනොවූ නමුදු එම වර්ෂයේදී විශ්‍රාම වැටුප්ලාභීන් 148,085 දෙනෙකු වෙත රු.මි.2,686ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා ඇති අතර දායකයන් 419 දෙනෙකු වෙනුවෙන් මරණ පාරිතෝෂික වශයෙන් රු.7,987,296/-ක මුදලක් ගෙවා ඇත.

2017 වර්ෂය අවසන් වන විට ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මුළු දායක සංඛ්‍යාව 69,046ක් වූ අතර විශ්‍රාම වැටුප්ලාභීන් 4,037 දෙනෙකු වෙත රු.මි.59.8ක් ධීවර විශ්‍රාම වැටුප් වශයෙන්ද, දායකයන් 40 දෙනෙකු වෙනුවෙන් රු. 495,800/-ක මුදලක් මරණ පාරිතෝෂික වශයෙන්ද ගෙවා ඇත.

2017 වර්ෂයේදී මියගිය හා සේවයෙන් ඉවත් වූ මණ්ඩලීය සේවක සංඛ්‍යාව 15ක් වන අතර, නව බඳවාගැනීම් වශයෙන් සංවර්ධන නිලධාරී තනතුරු 10ක් සඳහා අභ්‍යන්තරිකව බඳවා ගැනීම් පමණක් සිදුකර ඇත. අනුමත කාර්ය මණ්ඩල සංයුතියට අනුව නියමිත කාර්ය මණ්ඩලය 421ක් වුවද, ඒ වන විට

සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 302ක් පමණක් විය. ඒ අනුව, පුරප්පාඩු සේවක සංඛ්‍යාව 119කි.

දේශීය කෘෂිකර්මාන්තයේ හා කෘෂිකාර්මිකයාගේ සුරක්ෂිතභාවය උදෙසා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන ලද 2017 වර්ෂයේදී මණ්ඩලීය ක්‍රියාකරකම් හා කාර්යය සඵලතා මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලබයි.

# මෙහෙයුම් අංශය

**<u>මෙහෙයුම් අංශය - 2017</u>**

දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා වීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීමේ නියත දැක්ම පෙරදැරිකරගෙන කෘෂිකාර්මික රක්ෂණය හා ආරක්ෂණය සැලසීම සඳහා සාමූහික ප්‍රයත්නයක් හා අදාල ආයතන සම්බන්ධීකරණය තුළින්, ජාත්‍යන්තරව පිළිගත් දේශීය කෘෂිකර්මාන්තය නඟාසිටුවා කෘෂිකර්මාන්තයේ අවදානම් කළමනාකරණය සිදුකර දේශීය කෘෂි නිෂ්පාදනය ඉහළනැංවීමේ මුඛ්‍ය කර්තව්‍යය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් සිදු කරනු ලබයි. නියං තත්ත්ව, ගංවතුර උවදුර හා වනඅලි හානි වැනි ආපදා තත්ත්වයන් වලදී කෘෂිකාර්මිකයා මුහුණදෙන ආර්ථික ගැටළුවලට මනා විසඳුමක් ලෙස කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමවේදය මුල්කොට ගැනේ. විශේෂයෙන් කෘෂි ආර්ථික රටාවක් පවතින අප රටේ කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය වඩාත් ප්‍රායෝගික වැඩපිළිවෙලක් වන අතර එමඟින් දේශීය කෘෂිකාර්මිකයාගේ අනාගතය සුරක්ෂිත කිරීමට මහඟු පිටිවහලක් වේ. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වගා රක්ෂණය, පශු රක්ෂණය, සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණය කෘෂි උපකරණ රක්ෂණය, ගබඩා රක්ෂණය හා තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණය වැනි විවිධ වූ වැඩි ප්‍රතිලාභ සහිත රක්ෂණ ක්‍රමවේද තුළින් කෘෂිකාර්මිකයා සුරක්ෂිත කර දේශීය කෘෂිකර්මාන්තයේ සුරක්ෂිත භාවය තහවුරු කර ඇත.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සේවාවන් ගොවිජනතාව අතරට ව්‍යාප්ත කිරීමේදී වඩාත් වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට මෙහෙයුම් අංශයට පැවරී ඇත. මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ඉදිරි වැඩපිළිවෙල ඇතුළත් සංයුක්ත සැලැස්ම, ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව සියළුම ආයතනික සැලසුම් සකස් කිරීම, එම සැලසුම් ක්‍රියාත්මක කරවීම සඳහා දීප ව්‍යාප්තව පැතිරී ඇති දිස්ත්‍රික් කාර්යාල මෙහෙයවීම, එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන සියළු අවශ්‍යතා පූරණය කර ගැනීම වැනි වැදගත් කාර්යයභාරයක් මෙහෙයුම් අංශය මඟින් ඉටු කරනු ලබයි.

- ❖ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රක්ෂණ සේවා සපයන එකම රාජ්‍ය ආයතනය වශයෙන් දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමේ හා කෘෂිකාර්මිකයාගේ ආර්ථිකය ස්ථායී කිරීමෙහිලා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම උපරිම ආකාරයෙන් ඉටු කිරීම අරමුණු කර ගනිමින් , 2017 වර්ෂයේදී ද රක්ෂණ යෝජනා ක්‍රම රාශියක් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් අංශය කටයුතු කර ඇත.

**ක්‍රියාත්මක කර ඇති රක්ෂණ යෝජනා ක්‍රම**

01. වගා රක්ෂණ යෝජනා ක්‍රමය

- වී වගා රක්ෂණ යෝජනා ක්‍රමය

- බඩ ඉරිඟු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- අතිරේක බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (මුං, රටකජු, උඳු)
- ලොකු ළූණු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- උක් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- අපනයන බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- වැවිලි බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (තේ වගාව)
- පොල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- අර්තාපල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- මල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- ඉඟුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- මිරිස් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- එළවළු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- කෙසෙල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- පළතුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය

02. ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමය

03. කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රමය

04. පශු රක්ෂණ යෝජනා ක්‍රමය

- ගව
- එළු

05. හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය

06. සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

07. තෙවන පාර්ශවීය රථ වාහන රක්ෂණ යෝජනා ක්‍රමය

නියඟය, ගංවතුර හා වන අලින්ගෙන් සිදුවන ආපදාවලින් වගා කටයුතුවලට ඇතිවිය හැකි හානි නිසා ගොවි ප්‍රජාවට මුහුණු දීමට සිදුවන දුෂ්කරතා වලට පිළියමක් වශයෙන් වී, බඩ ඉරිඟු, අර්තාපල්, ලොකු ළූණු, සෝයා හා මිරිස් වගාවන් සඳහා අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමයකට ගොවීන් දායක කර ගැනීමට 2017/18 මහ කන්නයේ සිට සිදු වූ අතර, අක්කරයකට රු.675/-ක අවම වාරිකයක මුදලක් අයකර ගැනීමටත්, රු.40,000/- (අක්කරයක් සඳහා) රක්ෂණ ආවරණයක් ලබා දීමට කටයුතු කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය, රාජ්‍ය හා රාජ්‍ය නොවන බැංකු ඇතුළු අදාල සියළු ආයතන සම්බන්ධීකරණයෙන් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

**මෙහෙයුම් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්**

❖ <u>"වස විස නැති රටක්" ග්ලිරිසීඩියා පැළ බිලියනයක් අලුතින් සිටුවීමේ ජාතික වැඩසටහන.</u>

ජනාධිපති කාර්යාලය මඟින් මෙහෙයවන ලද මෙම වැඩසටහන සාර්ථක කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, සියළු දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කර ගොවිජන සේවා මට්ටමින් මෙම වැඩසටහන සාර්ථක කිරීමට කටයුතු කරන ලදී. විශේෂයෙන් ගොවි සංවිධාන හරහා ග්‍රාමීය වශයෙන් ග්ලිරිසීඩියා වගාව ප්‍රචලිත කිරීමටත්, නව වගාවන්ට අවශ්‍ය දඬු ලබා ගැනීම සඳහා ගොවි සංවිධාන හරහා කටයුතු සිදු කළ අතර වැඩිදුරටත් ගොවීන් දැනුවත් කිරීමට කටයුතු කිරීමෙන් සිදුවන ප්‍රායෝගික අපහසුතා මගහැරීමට කටයුතු කරන ලදී. දේශීය කෘෂිකර්මාන්තයේ නිෂ්පාදනවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම උදෙසා කාබනික පොහොර ප්‍රචලිත කිරීම මූලික අරමුණ කර ගනිමින් සහ පාංශු සංරක්ෂණය විධිමත් කිරීම, කෘෂි නිෂ්පාදනවලට වෙළඳපල වැඩි වටිනාකමක් ලබා දීමට, පාංශු පෝෂක සමතුලිතතාවය ඇති කිරීම මූලික කරමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

❖ <u>වැන්දඹු හා කාන්තා ගෘහමූලික පවුල් සවිබල ගැන්වීම සඳහා තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සැකසීම.</u>

ශ්‍රී ලංකාවේ කල් පවත්නා සංවර්ධන අපේක්ෂාවන් මුදුන්පත් කරගනිමින් කාන්තාවන් කෙරෙහි බලපා ඇති සංවර්ධන, ආර්ථික හා සමාජයීය විෂමතාවයන් අවම කිරීම සඳහා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්ව ඇති සම්මුතීන්, ප්‍රතිපත්තීන් හා උපාය මාර්ගයන් සැලකිල්ලට ගනිමින් යුද්ධය හා වෙනත් සමාජ , ආර්ථික හේතූන් නිසා කාන්තාවන් වැන්දඹු/ගෘහ මූලිකයන් බවට පත්ව සිටින පවුල් සවිබල ගැන්වීම සඳහා තුන් අවුරුදු ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සිදුවන අතර, අප මණ්ඩලීය දායකත්වය පිළිබඳ විස්තර අදාල ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී ලබා දීමට කටයුතු කෙරිණ. මෙහිදී, තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී බඳවාගනු ලබන බාහිර නියෝජිත ජාලය සඳහා වැන්දඹු හා කාන්තා ගෘහ මූලික පවුල්වල සාමාජිකයින් වෙනුවෙන් ප්‍රමුඛත්වය ලබා දීම සිදුවේ. එය ස්වයං රැකියා අවස්ථාවක් ලෙසින් අමතර ආදායම් මාර්ගයක් ලෙසට පවත්වා ගත හැකිය.

❖ <u>ජාතික ගොවි සතිය වෙනුවෙන් 2017 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම එළිදැක්වීම - බෙත්තාරාම ක්‍රීඩාංගණය</u>

2017 වර්ෂයට අදාල කෘෂිකර්ම අමාත්‍යාංශයේ ක්‍රියාත්මක සැලැස්ම එළිදැක්වීමේ උත්සවය, අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017.01.18 දින බෙත්තාරාම ක්‍රීඩාංගණයේදී

පැවැත්විණ. මෙහිදී, "ගොවි සතියට" සමගාමීව කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය මගින් දීප ව්‍යාප්තව වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මක කළ අතර, ගොවි විශ්‍රාම වැටුප්ලාභීන් වෙත ප්‍රතිලාභ ලබා දීම මෙන්ම වගා රක්‍ෂණ ප්‍රතිලාභ ලබාදීමද සිදු කරන ලදී.

❖ <u>"2017 වසර දිළිඳුකමින් නිදහස් කිරීමේ වසර" වැඩසටහන යටතේ ක්‍රියාකාරකම් සිදු කිරීම.</u>

රටේ ජීවනාලිය බඳු කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීමේදී කෘෂිකාර්මික අවදානම අවම කිරීම දේශීය කෘෂිකර්මාන්තයේ උන්නතිය හා කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීමට ප්‍රබල දායකත්වයක් ලබා දේ. වගා රක්‍ෂණ යෝජනා ක්‍රම , පශු රක්‍ෂණ යෝජනා ක්‍රම වැනි වඩාත් ප්‍රායෝගික රක්‍ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම හා ගොවීන් අතර ප්‍රචලිත කිරීම මගින් කෘෂිකර්මාන්තයේ අවදානම අවම කර නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් කෘෂි ආර්ථිකය තිරසාර මට්ටමකට පවත්වා ගැනීමේ හැකියාව ලැබේ. එමගින්, ග්‍රාමීය ජනතාවගේ ආදායම් මට්ටම ඉහළනංවා ඔවුන්ගේ දිළිඳුකම අවම කිරීමේ හැකියාව ලැබේ. සමස්ථයක් ලෙස රටේ පවතින දිළිඳුබව තුරන් කිරීමට මහත් පිටිවහලක් වේ.

❖ <u>බාහිර අලෙවි නියෝජිත ජාලය වර්ධනය කිරීම.</u>

මණ්ඩලයේ ක්‍රියාත්මක වන වගා රක්‍ෂණ, පශු රක්‍ෂණ, සමාජ ආරක්‍ෂණ හා සාමාන්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රම ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් අනුයුක්ත කර සිටින ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට අමතරව බාහිර නියෝජිත ජාලයක් ස්ථාපිත කිරීම 2016 වර්ෂයේ ආරම්භ කරන ලදී. 2016 වර්ෂයේ 408ක් වූ මෙම නියෝජිත සංඛ්‍යාව 2017 වර්ෂයේදී 1693ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකියාව ලැබී ඇත. විශේෂයෙන් ගොවි සංවිධාන සාමාජිකයන් බාහිර නියෝජිත ජාලය සමඟ සම්බන්ධ වූ නිසා සංඛ්‍යාත්මක ලෙස වැඩි වූ අතර එමගින්,

- මණ්ඩලීය රක්‍ෂණ යෝජනා ක්‍රම ගොවීන් අතර ප්‍රචලිත කිරීම
- ලෝක බැංකුවේ උපදේශනය හා සහයෝගීතාවය ඇතිව හඳුන්වා දෙන කාලගුණික හා දේශගුණික දත්ත මත පදනම් වූ (Index Based) රක්‍ෂණ ක්‍රමය ගොවීන් අතරට ගෙන යාම වැනි වඩාත් වැදගත් කර්තව්‍යයන් බොහොමයක් මෙම නියෝජිත ජාලය හරහා සිදු කර ගැනීමට අපේක්‍ෂා කෙරේ.

## අලෙවි කටයුතු - 2017

❖ මණ්ඩලීය රක්‍ෂණ යෝජනා ක්‍රම ගොවිජනතාව අතරට රැගෙන යාම සඳහා ගොවි සංවිධාන නියෝජිත සමුළුවක් 2017.01.15 දින පුත්තලම නගර ශාලාවේදී පවත්වන ලදී. ගොවි සංවිධාන

නියෝජිතයන් 125දෙනෙකු සහභාගී වූ අතර මණ්ඩලයේ ගරු සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.

- 69 වන අභිමානවත් නිදහස් සමරු උළෙල 2017.02.04 දින පොළොන්නරුව, ගල්ලැල්ල ජාතික ක්‍රීඩාංගණයේදී උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට කටයුතු කෙරිණ. මේ සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන උපරිම දායකත්වය ලබා දුන් අතර, දැයේ නිදහස සියළු ජනතාවගේ ජීවනෝපාය ශක්තිමත් කිරීමට මහත් දායකත්වයක් ලබා දෙන හෙයින්, නිදහස් සමරු උළෙල සාර්ථක කරලීම සඳහා ශබ්ද විකාශන පහසුකම් සැපයීම වෙනුවෙන් මණ්ඩලීය දායකත්වය ලබා දුන් අතර, මණ්ඩලයේ නිලධාරීන්ගේ සහභාගීත්වය හා සහයෝගය ලබා දෙන ලදී.

- මණ්ඩලීය රක්ෂණ යෝජනා ක්‍රම ගොවිජනතාව අතරට පහසුවෙන් හා කාර්යක්ෂමව රැගෙන යාම සඳහා බාහිර නියෝජිත ජාලය පුළුල් කිරීමේ වැඩසටහන යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවි සංවිධාන මට්ටමින් තෝරාගත් නියෝජිතයන් 116 දෙනෙකු සඳහා පත්වීමේ ලිපි ප්‍රදානය කිරීම, මණ්ඩලයේ ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017.02.12 දින බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී සිදු කරන ලදී.

- 2016 යල කන්නයේ “කෙතට අරුණ” පොහොර සහනාධාර ක්‍රමය යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ වගා හානි වූ ගොවීන් වෙත වන්දි ප්‍රදානය කිරීම හා ගොවි සංවිධාන සාමාජිකයන්ට රක්ෂණ නියෝජිත තනතුරු ලබා දීම 2017.02.13 දින අම්පාර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වික්‍රම ශාලාවේදී පැවැත්විණ. මණ්ඩලයේ ගරු සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, අම්පාර දිස්ත්‍රික් දිසාපති තුමා, ගොවිජන සේවා සහකාර කොමසාරිස්තුමිය ඇතුළු ආරාධිත අමුත්තන් බොහොමයක් ඊට සහභාගී විය.

- තිරසාර සංවර්ධන ඉලක්කයන් තේමා කරමින් ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් සංවිධානය කරන ලද “තිරසාර යුගයක් - ජාතික මංගල්‍ය ප්‍රදර්ශනය” 2017 මාර්තු 31 දින සිට අප්‍රේල් 04 වන දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වුණු අතර, එහි මණ්ඩලය නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යන ලදී. එහිදී අත්පත්‍රිකා, බැනර්, පෝස්ටර් හා මල්ටිමීඩියා පොජෙක්ටර් භාවිතා කරමින් මණ්ඩලය මඟින් ක්‍රියාත්මක වන සියළු වැඩසටහන් ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන සියලු ප්රේක්ෂකයන්ට ලබා දීමට කටයුතු කරන ලදී.

- 2016/17 මහ කන්නයේ වී අස්වැන්න නෙළා ගැනීමෙන් අනතුරුව අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස ජාතික අලුත් සහල් මංගල්‍යය 2017.04.07 සහ 08 දෙදින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, පිරිත් මණ්ඩපය ඉදිකිරීම, ශබ්ද විකාශන පහසුකම් සැපයීම ඇතුළු කාර්යයන් බොහොමයක් මණ්ඩලයේ අනුග්‍රහයෙන් හා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී.

- මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රදේශයේ 2017 යල කන්නයට අදාලව ලොකු ඇණු වගාහානි වන්දි ප්‍රදානය කිරීම 2017.10.12 දින ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය වසන්ත අළුවිහාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මණ්ඩලීය සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සහභාගීත්වයෙන් දඹුල්ලේදී සිදු කරන ලදී. මෙම අවස්ථාව සඳහා ගොවි සංවිධාන, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් ඇතුළු නිලධාරී මහත්ම මහත්මීන් විශාල සංඛ්‍යාවක් සහභාගී විය.

- ජනපති නිල මෙහෙවර ජංගම සේවය - වව්නියාව දිස්ත්‍රික්කය 2017 වර්ෂයේදී පොදුජනතාවට මුහුණු දීමට සිදුවන පරිපාලනමය ගැටළු නිරාකරණය කිරීම සඳහා 2017.10.21 දින වව්නියාව දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් ජංගම සේවය පවත්වාගෙන යන ලදී.

- තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමය ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් නියෝජිතයන් පත්කිරීම සිදු කරන ලදී. එහිදී මාතර, කුරුණෑගල, ගාල්ල,මහනුවර, ගම්පහ, බදුල්ල, පොළොන්නරුව, මහව, යාපනය, කොළඹ හා මාතලේ යන දිස්ත්‍රික්කයන් තුළ රක්ෂණ නියෝජිතයන් පත්කිරීම මණ්ඩලයේ ගරු සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.

- දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන විශේෂ ප්‍රචාරක හා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය වන පෝස්ටර්, බැනර් හා අත්පත්‍රිකා දිස්ත්‍රික් කාර්යාල මඟින් පිළියෙළ කර ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කර දී ඇති අතර මාතර, අනුරාධපුරය, කළුතර හා මහව යන දිස්ත්‍රික් කාර්යාල කිහිපයකින් ලැබුණු ඉල්ලීම අනුව අදාල අවශ්‍යතා මෙහෙයුම් අංශය මඟින් සපයා දීමට කටයුතු කර ඇත.

# රක්ෂණ අංශය

## කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය
## හා
## පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය

__රක්‍ෂණ අංශය - 2017__

1. සෙසු වර්ෂවලදී මෙන්ම මෙම වර්ෂයේදී ද වන්දි ගෙවීම් කාර්යයන් සඳහා වැඩි අවධානයක් යොමු කර රාජකාරි සිදු කිරීමට රක්‍ෂණ අංශයට සිදුවිය. 2016 යල කන්නයේ මෙන්ම 2016/2017 මහ කන්නයේ දීද, රක්‍ෂිත වාගාවට ස්වභාවික විපත් හේතුවෙන් හානි වූ බැවින් අසරණ වූ ගොවිජනතාවට කඩිනමින් වන්දි මුදල් නිදහස් කිරීම පිණිස ක්‍රියාත්මක විමට සිදු විය.

2. එසේම, නියඟය හේතුවෙන් හානියට පත් වගාවන් සඳහා මෙන්ම නියඟය හේතුවෙන් වගා කිරීමට නොහැකිවූ ගොවීන් සඳහා වන්දි ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන රජයෙන් ලබා දුන් බැවින් එම මුදල් අදාල ගොවි මහත්ම මහත්මීන්ට කඩිනමින් ගෙවීමසඳහා රක්‍ෂණ අංශයෙන් ලබා දිය යුතු අවශ්‍ය සහයෝගය සපයන ලදී.

3. භාෂාමය ගැටලුව පවතින බැවින් හා අංශය තුල හෝ ප්‍රධාන කාර්යාලයේ ප්‍රමාණවත් දෙමළ මාධ්‍ය නිලධාරීන් නොමැති බැවින් මෙවරද මඩකලපු දිස්ත්‍රික්කයේ හානි වූ රක්‍ෂිත වගාවන්ට වන්දි මුදල් නිදහස් කිරීම සඳහා ජංගම වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඒතුලින් වගා ණය යටතේ රක්‍ෂිත ගොවීන්ට අදාල වන්දි ලේඛන සඳහා මුදල් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.

4. එසේම 2017 යල කන්නයේ ද නියඟය හා සමහර පළාත්වල ගංවතුර හේතුවෙන් වගාවන් හානියට පත් විය.මෙහිදී රක්‍ෂිත වගාවන්ට වන්දි මුදල් නිදහස් කල අතර රක්‍ෂණය නොවූ වගාවන් සඳහා හානි වාර්තා ලබාගෙන ජාතික රක්‍ෂණ භාර අරමුදලින් ඒ සඳහා මුදල් ලබා ගැනීමට මේ වන විට සැලසුම් කර ඇත.

5. සෙසු දිස්ත්‍රික්කයන්හි වන්දි මුදල් නිදහස් කිරීම ප්‍රධාන කාර්යාලයේදී සිදු කරන ලදී. එසේම මණ්ඩලය මගින් රක්‍ෂණය කරන ලද වගාවන් සඳහාද වන්දි මුදල් නිදහස් කිරීමට කටයුතු කරන ලදී .

6. එසේම පශු රක්‍ෂණ, සුවසෙත රක්‍ෂණ හා හදිසි අනතුරු රක්‍ෂණ යටතේද වන්දි මුදල් නිදහස් කරන ලදී. සාරාංශය පහත පරිදි වේ.

7. මේ යටතේ 2017 යල කන්නයේ වැඩිම හානියක් වූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්දි මුදල් ගණනය කිරීම සඳහා ජංගම වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් හානි වූ වගාවන් සඳහා වන්දි මුදල්ගණනය කරන ලදී.

8. එසේම උක් වගාව,කිර වගාව,රතුළූණු වගාව සඳහා යෝජනා ක්‍රම සකස් කර කෙටුම්පත් කර ඇත. ඒවා 2018 වර්ෂයේදී වෙළඳපොළට නිකුත් කිරීමට කටයුතු කෙරේ.

9. නිලධාරීන් දිරිගැන්වීම සඳහා දිරි දීමනා ක්‍රමවේදයන් සකස් කරන ලද අතර එය 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

10. 2018 අයවැය යෝජනා අනුව ක්‍රියාත්මක කිරීමට පවතින යෝජනා ක්‍රමයට අදාල වන්නාවූ යෝජනා ක්‍රමය, රක්‍ෂණ සහතික, මුදල් කුවිතාන්සිය, ආකෘති පත් සකස්කර යාවත්කාලීන කර අවසන් කරන ලදී. ඉදිරියේදී එයසෙසු වගා රක්‍ෂණ කටයුතු සඳහා ද යොදාගැනීමට අපේක්ෂිතය.

11. එසේම, වයඹ පළාතේ ගංවතුරින් හානි වූ වගාවන් සඳහා වයඹපළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් බිත්තර වී ලබා දීම වෙනුවෙන් සිදු කර තිබූ වියදම් වගා රක්‍ෂණ අරමුදලින් ගෙවීමට කළමනාකරිත්වයේ ලද උපදෙස් පරිදි කටයුතු කරන ලදී. ඒ සඳහා රුපියල් මිලියන 11.7ක් වැය විය.

<u>**2017 වර්ෂය තුල වන්දි ගෙවීම් සාරංශය පහත පරිදි වේ.**</u>

**A** වගා ණය රක්‍ෂණ

| රක්‍ෂණ වර්ගය | ගොවීන් සංඛ්‍යාව | අක්කර සංඛ්‍යාව | වන්දි මුදල රු.මිලියන |
|---|---|---|---|
| වී | 4,901 | 14,734 | 128 |
| බඩඉරිගු | 2,162 | 7,286 | 47 |
| අර්තාපල් | 139 | 143 | 5.7 |
| සෙසු වගා රක්‍ෂණ | 275 | 422 | 9.3 |
| **සෙසු රක්ෂණ** | | | |
| සුවසෙත හා හදිසි අනතුරු රක්‍ෂණ | 70 | - | 0.27 |
| **මුළු එකතුව** | **7,547** | **22,585** | **190.27** |

**B** ගංවතුරින් හානි වූ ගොවීන්ට නැවත වගාව සඳහා වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් එම ගොවීන් වෙත බිත්තර වී ලබා දීම වෙනුවෙන් වැයවී තිබූ රුපියල් මිලියන**11.7** මුදල එම ආයතනයට ප්‍රතිපූරණය කිරීම.

**C 2017 වර්ෂය තුල කෙතට අරුණ රක්‍ෂණ වන්දි ගෙවීම්**

| කන්නය | ගොවීන් සංඛ්‍යාව | වන්දි මුදල රු.මිලියන |
|---|---|---|
| 2016 යල | 10,629 | 50 |
| 2016 /17 මහ | 523,336 | 4,527 |
| **එකතුව** | **533,965** | **4,577** |

**D පශු රක්ෂණ**

| පශු රක්ෂණ වන්දි ගෙවීම - 2017 | | |
|---|---|---|
| **වර්ගය** | **සතුන් ගණන** | **වන්දි ගෙවීමරු.මිලි.** |
| ගව | 89 | 4.9 |
| එළු | 27 | 0.2 |
| **එකතුව** | **116** | **5.1** |

ඒ අනුව 2017 වර්ෂය තුල ගොවින් 541,628 දෙනෙකු සඳහා රක්‍ෂණ වන්දි ගෙවීමට කටයුතු කර ඇති අතර, වර්ෂය තුල මුළු වන්දි ගෙවීම රු. මි.**4,785**ක් විය.

ඉහත සඳහන් පරිදි රාජකාරි ඉටු කරන ලද අතර 2017 වර්ෂයට අංශය වෙත යොමු කර තිබූ විගණන වාර්තා සඳහා පිළිතුරු යවා අවසන් කරනලදී.

# ගොවි විශ්‍රාම වැටුප් අංශය

## ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## සහ

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## <u>ගොවි විශ්‍රාම වැටුප් අංශය - 2017</u>

❖ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ බඳවා ගැනීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උද්ගත වූ ගැටළු මගහරවා ගැනීම සඳහා ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිසංවිධානය කොට උද්ධමනය සහ මූර්ත අගය සැලකිල්ලට ගනිමින් නව රජයේ දින 100 වැඩසටහන යටතේ නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලෙස මණ්ඩලය වෙත උපදෙස් ලැබුණි.

ඒ අනුව, නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස්කොට කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කරන ලදී. එහිදී මෙම යෝජනා ක්‍රමය විද්වත් කමිටුවට යොමු කිරීමෙන් උපදෙස් ලබාගත යුතු බව අතිගරු ජනාධිපතිතුමා සහ අග්‍රාමාත්‍යතුමා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇති බැවින් යෝජිත නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය විද්වත් කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

| | | |
|---|---|---|
| 2017 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම | - | රු. 2,686,770,810.00 |
| 2017 ගොවි මරණ හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම | - | රු. 8,007,627.00 |

❖ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

2017 වර්ෂය අවසන් වන විට මුළු දායකයින් සංඛ්‍යාව 69,046 වන අතර විශ්‍රාම වැටුප් ලාභීන් 4,037 ක් සඳහා රුපියල් මිලියන 60,065,272.00 මුදලක් ධීවර විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා ඇත.

| | | |
|---|---|---|
| 2017 ධීවර මරණ බෙලහීන ප්‍රතිලාභ ගෙවීම | - | රු. 495,800.00 |

## ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් - 2017

| | දිස්ත්‍රික්කය | දායක සංඛ්‍යාව | ගෙවූ මුදල |
|---|---|---|---|
| 1 | කොළඹ | 5187 | 89,670,249.00 |
| 2 | ගම්පහ | 10753 | 191,211,918.00 |
| 3 | කළුතර | 8557 | 161,914,419.00 |
| 4 | මහනුවර | 14646 | 258,188,101.00 |
| 5 | මාතලේ | 4384 | 71,143,823.00 |
| 6 | නුවරඑළිය | 2938 | 58,442,444.00 |
| 7 | ගාල්ල | 13134 | 239,166,887.00 |
| 8 | මාතර | 9302 | 188,159,979.00 |
| 9 | හම්බන්තොට | 7885 | 152,356,229.00 |
| 10 | යාපනය/කිලිනොච්චි | 2387 | 49,131,550.00 |
| 11 | මන්නාරම | 89 | 2,716,292.00 |
| 12 | වවුනියාව | 513 | 14,706,460.00 |
| 13 | මුලතිව් | 133 | 12,114,171.00 |
| 14 | මඩකලපුව | 1056 | 17,769,520.00 |
| 15 | අම්පාර | 3843 | 74,355,460.00 |
| 16 | ත්‍රිකුණාමලය | 842 | 38,665,088.00 |
| 17 | කුරුණෑගල-මහව | 17445 | 286,271,485.00 |
| 18 | පුත්තලම | 5343 | 91,587,856.00 |
| 19 | අනුරාධපුරය/මහවැලි H | 7309 | 121,211,296.00 |
| 20 | පොලොන්නරුව- B G | 4892 | 84,366,329.00 |
| 21 | බදුල්ල/මහවැලි සී | 6368 | 107,646,879.00 |
| 22 | මොණරාගල | 4885 | 91,841,928.00 |
| 23 | රත්නපුරය/උඩවලව | 6933 | 128,709,437.00 |
| 24 | කෑගල්ල | 9261 | 155,423,010.00 |
| | එකතුව | **148085** | **2,686,770,810.00** |

| ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මරණ බෙලහීන ප්‍රතිලාභ ගෙවීම 2017 | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් කාර්යාලය | මරණ සංඛ්‍යාව | මුදල | බෙලහීන සංඛ්‍යාව | මුදල | මුළු සංඛ්‍යාව | මුළු මුදල |
| ගාල්ල | 16 | 268714 | | | 16 | 268714 |
| කොළඹ | 2 | 36397 | | | 2 | 36397 |
| හම්බන්තොට | 8 | 144722 | | | 8 | 144722 |
| කළුතර | 16 | 304991 | 1 | 20331 | 17 | 325322 |
| මාතර | 17 | 339294 | | | 17 | 339294 |
| මොණරාගල | 21 | 402143 | | | 21 | 402143 |
| ඇඹිලිපිටිය | 9 | 132136 | | | 9 | 132136 |
| ගම්පහ | 25 | 458429 | | | 25 | 458429 |
| මනම්පිටිය | 11 | 217854 | | | 11 | 217854 |
| අම්පාර | 9 | 159777 | | | 9 | 159777 |
| බදුල්ල | 14 | 266667 | | | 14 | 266667 |
| රත්නපුරය | 15 | 299170 | | | 15 | 299170 |
| කෑගල්ල | 20 | 311537 | | | 20 | 311537 |
| පුත්තලම | 17 | 314049 | | | 17 | 314049 |
| යාපනය | 19 | 340825 | | | 19 | 340825 |
| තඹුත්තේගම | 7 | 114460 | | | 7 | 114460 |
| කුරුණෑගල | 31 | 603056 | | | 31 | 603056 |
| මාතලේ | 29 | 762078 | | | 29 | 762078 |
| නුවරඑළිය | 12 | 198661 | | | 12 | 198661 |
| ත්‍රිකුණාමලය | 5 | 111140 | | | 5 | 111140 |
| පොළොන්නරුව | 10 | 178096 | | | 10 | 178096 |
| වවුනියාව | 11 | 197930 | | | 11 | 197930 |
| අනුරාධපුරය | 31 | 603705 | | | 31 | 603705 |
| මහනුවර | 30 | 550592 | | | 30 | 550592 |
| මහව | 29 | 567379 | | | 29 | 567379 |
| මන්නාරම | 1 | 21911 | | | 1 | 21911 |
| මඩකලපුව | 4 | 81583 | | | 4 | 81583 |
| | **419** | **7,987,296** | **01** | **20,331** | **420** | **8,007,627** |

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2017.12.31 දිනට බඳවා ගැනීම්

| දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | වයස අනුව දායක සංඛ්‍යාව | | | | | | 2017 මුළු දායක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | 18-29 | 30-35 | 36-45 | 46-50 | 51-54 | 55-59 | |
| කළුතර | 1213 | 721 | 772 | 197 | 105 | 59 | 3067 |
| ගාල්ල | 1082 | 676 | 840 | 221 | 118 | 95 | 3032 |
| මහවැව | 3253 | 1702 | 2036 | 613 | 256 | 240 | 8100 |
| මාතර | 1750 | 980 | 1232 | 346 | 201 | 164 | 4673 |
| කොළඹ | 576 | 360 | 478 | 140 | 63 | 38 | 1655 |
| තංගල්ල | 2514 | 1389 | 1628 | 411 | 201 | 168 | 6311 |
| පුත්තලම | 2167 | 1156 | 1222 | 255 | 107 | 61 | 4968 |
| මීගමුව | 2538 | 1599 | 2167 | 735 | 419 | 378 | 7836 |
| මඩකලපුව | 2248 | 1390 | 1630 | 555 | 272 | 266 | 6361 |
| ත්‍රිකුණාමලය | 654 | 516 | 550 | 129 | 81 | 78 | 2008 |
| මන්නාරම | 2066 | 1227 | 1343 | 429 | 222 | 257 | 5544 |
| කල්මුනේ | 1565 | 1109 | 1515 | 479 | 244 | 207 | 5119 |
| මුලතිව් | 88 | 79 | 141 | 50 | 27 | 44 | 429 |
| කිලිනොච්චි | 519 | 340 | 540 | 250 | 185 | 183 | 2017 |
| යාපනය | 2185 | 1117 | 1444 | 668 | 402 | 617 | 6433 |
| **මිරිදිය ධීවර ජලාශ** | | | | | | | |
| නුවරඑළිය | 29 | 28 | 47 | 7 | 1 | 3 | 115 |
| පොළොන්නරුව | 45 | 35 | 27 | 11 | 2 | 1 | 121 |
| රත්නපුර | 27 | 15 | 9 | 1 | 3 | - | 55 |
| මොණරාගල | 17 | 14 | 10 | 1 | - | - | 42 |
| කුරුණෑගල | 45 | 24 | 24 | 1 | - | 2 | 96 |
| අනුරාධපුර | 169 | 81 | 84 | 17 | 7 | 5 | 363 |
| මාතලේ | 31 | 14 | 23 | 5 | 2 | 3 | 78 |
| නුවර | 13 | 12 | 25 | 5 | 3 | 3 | 61 |
| කෑගල්ල | 1 | 1 | 2 | - | - | - | 4 |
| බදුල්ල | 59 | 33 | 33 | 3 | - | 3 | 131 |
| වව්නියා | 59 | 33 | 41 | 15 | 4 | - | 152 |
| මඩකලපුව මිරිදිය | 84 | 52 | 67 | 27 | 20 | 25 | 275 |
| මුළු එකතුව | **24997** | **14703** | **17930** | **5571** | **2945** | **2900** | **69046** |

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

මරණ හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම් - 2017 වර්ෂය තුල

| දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම් | |
|---|---|---|
| | දායක සංඛ්‍යාව | මුදල රු |
| කළුතර | | |
| ගාල්ල | 1 | 10,000.00 |
| මහවැව | 4 | 58,000.00 |
| මාතර | 3 | 36,000.00 |
| කොළඹ | 1 | 8,000.00 |
| තංගල්ල | | |
| පුත්තලම | 1 | 10,000.00 |
| මීගමුව | 1 | 8,000.00 |
| මඩකලපුව | 1 | 8,000.00 |
| ත්‍රිකුණාමලය | 1 | 10,000.00 |
| මන්නාරම | 9 | 118,000.00 |
| කල්මුනේ | 3 | 50,000.00 |
| මුලතිව් | | |
| කිලිනොච්චි | 4 | 70,000.00 |
| යාපනය | 11 | 109,800.00 |
| | | |
| **මිරිදිය ධීවර ජලාශ** | | |
| නුවරඑළිය | | |
| පොළොන්නරුව | | |
| රත්නපුර | - | - |
| මොණරාගල | - | - |
| කුරුණෑගල | - | - |
| අනුරාධපුර | - | - |
| මාතලේ | - | - |
| නුවර | - | - |
| කෑගල්ල | - | - |
| බදුල්ල | - | - |
| වව්නියා | - | - |
| මඩකලපුව මිරිදිය | - | - |
| එකතුව | 40 | 495,800.00 |

**යීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

යීවර විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිබඳ වාර්තාව

| දිස්ත්‍රික් යීවර ව්‍යාප්ති කොට්ඨාශය | 2017 දෙසැම්බර් දක්වා විශ්‍රාම වැටුප් ලබන දායක සංඛ්‍යාව | 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ගෙවූ මුදල (රු) |
|---|---|---|
| කළුතර | 95 | 1,340,802.00 |
| ගාල්ල | 124 | 1,769,477.00 |
| මහවැව | 354 | 5,106,454.00 |
| මාතර | 292 | 4,077,528.00 |
| කොළඹ | 55 | 746,942.00 |
| තංගල්ල | 229 | 3,309,828.00 |
| පුත්තලම | 54 | 888,428.00 |
| මීගමුව | 557 | 7,573,624.00 |
| මඩකලපුව | 411 | 5,865,796.00 |
| ත්‍රිකුණාමලය | 90 | 1,274,709.00 |
| මන්නාරම | 362 | 5,036,450.00 |
| කල්මුනේ | 318 | 4,524,690.00 |
| මුලතිව් | 60 | 2,434,931.00 |
| කිලිනොච්චි | 244 | 4,515,608.00 |
| යාපනය | 737 | 10,776,162.00 |
| | | - |
| **මිරිදිය යීවර ජලාශ** | | - |
| | | - |
| නුවරඑළිය | 7 | 89,004.00 |
| පොළොන්නරුව | 3 | 63,150.00 |
| රත්නපුර | 2 | 29,025.00 |
| මොණරාගල | - | 6,000.00 |
| කුරුණෑගල | 1 | 14,004.00 |
| අනුරාධපුර | 4 | 52,044.00 |
| මාතලේ | 4 | 56,370.00 |
| නුවර | 7 | 121,474.00 |
| කෑගල්ල | - | - |
| බදුල්ල | 4 | 52,200.00 |
| වව්නියා | 1 | 59,160.00 |
| මඩකලපුව මිරිදිය | 22 | 281,412.00 |
| එකතුව | 4037 | 60,065,272.00 |

# පරිපාලන හා මානව සම්පත් අංශය

## පරිපාලන හා මානව සම්පත් අංශය - 2017

### කාර්ය මණ්ඩලය

2017.12.31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

### කාර්ය මණ්ඩල සංයුතිය

| සේවාගණය | තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ | | | | |
| **HM** | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | - |
| **HM** | අධ්‍යක්ෂ | 5 | - | 5 |
| කළමනාකරණ | | | | |
| **MM** | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | 45 | 41 | 4 |
| කනිෂ්ඨ කළමනාකරණ | | | | |
| **JM** | පරිපාලන නිලධාරි | 2 | 1 | 1 |
| | පද්ධති පරිපාලක | 1 | - | 1 |
| | මූල්‍ය නිලධාරි | 1 | 1 | - |
| | සැලසුම් නිලධාරි | 1 | - | 1 |
| ආශ්‍රිත නිලධාරි | | | | |
| **ASS.O** | සංවර්ධන නිලධාරි | 55 | 39 | 16 |
| | සැපයුම් නිලධාරි | 1 | 1 | - |
| | අභ්‍යන්තර විගණන නිලධාරි | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | | | | |
| **MA - Tech** | ප්‍රවාහන සහකාර | 1 | 1 | - |
| | ලේකම් | 1 | 1 | - |
| | පොත් තබන්නා | 4 | 1 | 3 |
| | දෘඩාංග හා ජාලකරණ ශිල්පී | 1 | 1 | - |
| | කාර්මික ශිල්පී (ශ්‍රව්‍ය/දෘශ්‍ය) | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | | | | |
| **MA - NonTech** | කළමනාකරණ සහකාර | 220 | 159 | 61 |
| ප්‍රාථමික (ශිල්පීය) | | | | |
| **PL - Skilled** | රියදුරු | 38 | 26 | 12 |
| ප්‍රාථමික (ශිල්පීය නොවන) | | | | |
| **PL - Non Skilled** | කාර්යාල සහායක | 42 | 29 | 13 |
| | | **421** | **302** | **119** |

## 2017.12.31 දිනට කාර්ය මණ්ඩල විශ්ලේෂණය

### කාර්ය මණ්ඩලයේ ස්ත්‍රී /පුරුෂ විශ්ලේෂණය




පුරුෂ -180

ස්ත්‍රී - 122

එකතුව - 302

### වයස් විශ්ලේෂණය

| වයස් කාණ්ඩය | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 56 - 60 | 48 | 16% |
| 51 - 55 | 58 | 19% |
| 46 - 50 | 34 | 11% |
| 41 - 45 | 49 | 16% |
| 36 - 40 | 56 | 19% |
| 31 - 35 | 37 | 12% |
| 30 ට අඩු | 20 | 7% |
| එකතුව | 302 | 100% |




### සේවා කාලය අනුව විශ්ලේෂණය

| අවුරුදු | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 30 ට වැඩි | 52 | 2% |
| 26 - 30 | 31 | 14% |
| 21 - 25 | 25 | 23% |
| 16 - 20 | 12 | 8% |
| 15 ට අඩු | 182 | 53% |
| එකතුව | 302 | 100% |




### 2017 වර්ෂය තුළ විශ්‍රාම යාම්, මිය යාම් හා සේවයෙන් ඉවත්වීම්

පුරුෂ - 11

ස්ත්‍රී - 04

එකතුව - 15

**<u>2017 වර්ෂය තුළ බඳවා ගැනීම් හා උසස් කිරීම්</u>**

- බාහිර බඳවා ගැනීම් - -
- අභ්‍යන්තර බඳවා ගැනීම් - 10
- උසස් වීම් - -

- සංවර්ධන නිලධාරි තනතුරු 10 ක් සඳහා අභ්‍යන්තරිකව බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කරන ලදී.
- සහකාර අධ්‍යක්ෂ, සංවර්ධන නිලධාරි II හා III ශ්‍රේණිය, කළමනාකරණ සහකාර II හා III ශ්‍රේණි වලට අදාළව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කරන ලදී.

**<u>සේවක පුහුණු හා අධ්‍යාපන කටයුතු</u>**

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ රක්ෂණ පදනම් පාඨමාලාව සඳහා මණ්ඩලයේ නිලධාරින් 53 දෙනෙකු සහභාගී කරවන ලදී.

ප්‍රාග් ඉන්ස්ටියුට් ආයතනය විසින් පවත්වු ලැබු බඳවාගැනීමේ පරිපාටිය පිළිබඳ එක් දින පුහුණු වැඩමුළුවක් සඳහා සංවර්ධන නිලධාරී ඒ.ජයනි නිසංසලා මිය හා කළමනාකරණ සහකාර එච්.නිල්මිණි ප්‍රියංගනී මෙය සහභාගි කරවන ලදී.

දර්ශක මත පදනම් වු රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අදාළව ඉන්දුනිසියාවේ ජකර්තා නුවර 2017 මැයි මස 15/19 දින දක්වා පැවැත්වු පුහුණු වැඩසටහන සඳහා සහකාර අධ්‍යක්ෂ එස්.එම්.යු.ජී.එස්.කේ.සුහසිංහ මයා, සහකාර අධ්‍යක්ෂ ඩී.කේ. දිසානායක මෙය සහ කළමනාකරණ සහකාර එම්.සී.පී.කුමාර මයා සහභාගී කරවන ලදී.

Actuarial Association of Sri Lanka මඟින් සංවිධානය කරනු ලැබු 1st South Asian Actuarial Conference - 2017 සඳහා 2017/07/12 හා 13 දිනයන්හිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ අයි.යු.කේ.කළුආරච්චි මයා, සහකාර අධ්‍යක්ෂ එස්.එම්.යු.ජී.එස්.කේ.සුහසිංහ මයා, සහකාර අධ්‍යක්ෂ ඩී.කේ.දිසානායක මෙය සහභාගි කරවන ලදී.

කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලබන JAVA SE පාඨමාලාවක් සඳහා දෘඩාංග හා ජාලකරණ ශිල්පී අයි.එස්.ඊ.ජයසුරිය මහතා සහභාගී කරවන ලදී.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් පවත්වනු ලැබු ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුවට සහකාර අධ්‍යක්ෂ ඩී.එස්.ආර්.හෙට්ටිආරච්චි මෙය සහභාගී කරවන ලදී.

**<u>සේවක සුභසාධනය</u>**

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා උදේ, සවස තේ සැපයීමේ වැඩපිළිවෙල හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය පෙර වර්ෂයේදී මෙන්ම මෙම වර්ෂය තුළද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. තව ද 2017 බක්මහ උළෙල හම්බන්තොට, වවුනියාව, අම්පාර, බදුල්ල, නුවරඑළිය, අනුරාධපුර යන දිස්ත්‍රික්කවල දී සියළුම කාර්ය මණ්ඩල සහභාගීත්වයෙන් 2017අප්‍රේල් මස 28 දින පවත්වන ලදී.

## ප්‍රසම්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍රය

### සැපයුම් අංශය

මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ යෝජනා ක්‍රම වලට අදාළව කුවිතාන්සි පොත්, තෙවන පාර්ශව රක්ෂණ ආවරණ පොත්, තෙවන පාර්ශව කාඩ්පත්, තෙවන පාර්ශව අයදුම්පත්, රක්ෂණ සහතික පත්, බැනර්, අත්පත්‍රිකා විධිමත් මාර්ගෝපදේශ වලට අනුකූලව සැපයුම්කාර ආයතන මඟින් සිදුකරන ලදී.

මණ්ඩලයේ රියදුරු, කාර්යාල කාර්ය සහයක තනතුරු දරණ සේවකයින් වෙත 2017වසරට හිමි නිල ඇඳුම් ලබා දීමට හැකි විය.

මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා වේලා සටහන් යන්ත්‍ර සවි කිරීමට කටයුතු කිරීම.

මාතලේ, කළුතර සහ ප්‍රධාන කාර්යාලයේ පැවති භාවිතයට ගත නොහැකි අබලි කාර්යාලීය උපකරණ හා ලී බඩු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් අපහරණය කිරීමට කටයුතු කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල වල ඉල්ලීම් පරිදි ලී බඩු, කාර්යාලීය උපකරණ සහ පරිගණක උපකරණ එකිනෙක අවශ්‍යා පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය භාවිතා කර මිලදී ගැනිමට කටයුතු කරන ලදි.

### කාර්යාල ගොඩනැගිලි

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය මෙම වසර තුලදීද නො:117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන ලදී. මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල 29ක් පවත්වාගෙන යනු ලබන අතර, ඉන් මණ්ඩලයට අයත් ගොඩනැගිලි 06කි. අනෙක් කාර්යාල මාසික කුලී පදනම මත රාජ්‍ය හා පෞද්ගලික ගොඩනැගිලි තුළ තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ.

# අභ්‍යන්තර විගණන අංශය

**<u>අභ්‍යන්තර විගණන පරීක්ෂණ - 2017</u>**

2017 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාත්මක රක්ෂණ සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා ඒ ඒ අංශ සහ දිස්ත්‍රික් කාර්යාල අනුව පිළියෙල කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහනටඅනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව අභ්‍යන්තර විගණන අංශයේ සහකාර අධ්‍යක්ෂ, විගණන නිලධාරී -වැ.බ. සහ සංවර්ධන නිළධාරී - විගණන,අභ්‍යාසලාභී පුහුණුවන්නන් දෙදෙනාගේ සේවයද සහිතව 2017 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන පරීක්ෂණ33 ක් ප්‍රධාන කාර්යාලීය එක් එක් අංශ සහ භූගෝලීය මට්ටමින් ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික් කාර්යාල 26 පදනම් කොට ගෙන සිදු කරන ලදී.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සඳහා පවතින අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණ මූලික කොට ගෙන එක් එක් අංශ සහ දිස්ත්‍රික් කාර්යාලවල කටයුතු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණාත්මකභාවය, නිවැරදිතාවය හා ඒවායේ ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා පහත එක් එක් ක්ෂේත්‍ර යටතේ අභ්‍යන්තර විගණන පරීක්ෂණ සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී.

පාලන අංශය ආවරණය වන පරිදි සේවක වෛද්‍යාධාර ගෙවීම් පරීක්ෂාව, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සේවකයින් විශ්‍රාම ගැන්වීම, ගබඩා තොග පත් පරීක්ෂාව, මිශ්‍ර අත්තිකාරම් පරීක්ෂාව, ජංගම නොවන වත්කම් තහවුරු කර ගැනීම,අතිකාල දීමනා ගෙවීම් පරීක්ෂාව- 2017 යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විගණන පරීක්ෂණ සිදු කර ඇත.

මුදල් අංශයේ කටයුතු වලට අදාලව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වාර මුදල් රැස්කිරීම පිළිබඳ පරීක්ෂාව,සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට මුදල් ප්‍රේෂණය කිරීම, මිශ්‍ර අත්තිකාරම් පරීක්ෂාව,ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය- ආයෝජන පරීක්ෂාව, දිස්ත්‍රික් කාර්යාලීය රැස් කිරීමේ ගිණුම් පරීක්ෂාව, දිස්ත්‍රික් කාර්යාලීය පරිපාලනගිණුම්පරීක්ෂාව, බැංකු සැසඳුම් පරීක්ෂාව, ජංගම නොවන වත්කම් තහවුරු කර ගැනීම යන ක්ෂේත්‍ර වලට අදාලව විගණන පරීක්ෂණ සිදු කොට ඇත.

රක්ෂණ අංශයේ හා මෙහෙයුම් අංශයේ කටයුතු ආවරණය වන පරිදි අතිරේක භෝග සඳහා වන්දි ගෙවීම්, වී වගා හානි වන්දි ගෙවීම්- 2016 යල, පශු රක්ෂණ වන්දි ඉල්ලීම් නිරාකරණය කිරීම්, සුවසෙත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයේ වන්දි ගෙවීම් හා ඉදිරි වැඩ සටහන් පරීක්ෂාව යන පරීක්ෂණ සිදු කොට ඇත.

ගොවි විශ්‍රාම වැටුප් අංශයට අදාලව ශුද්ධ වාරික ගෙවීම පරීක්ෂාව, ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම පරීක්ෂාව යන විගණන පරීක්ෂාවන් සිදු කොට ඇත.

දිස්ත්‍රික් කාර්යාල කටයුතු පරීක්ෂාවන් යටතේ ගාල්ල, පුත්තලම යන දිස්ත්‍රික් කාර්යාලවල කටයුතු පරීක්ෂා කරන ලදී.

2017 වසරට අදාලව විශේෂ විමර්ශන කටයුතු 4ක් සිදු කර ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදුකොට ඇත.

**<u>විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.</u>**

2017 වර්ෂයට අදාලව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ විගණන කළමනාකරණ කමිටුව පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනාගෙන් සමන්විත විය.

චම්පා බාලසූරිය මහත්මිය - කමිටු සභාපති - අධ්‍යක්ෂ - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
පී.එස්.කේ.ආර්.වීරකෝන් මහතා - කමිටු සාමාජික - අතිරේක ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය
ඩී.වී.බන්දුලසේන මහතා - කමිටු සාමාජික -කොමසාරිස් ජනරාල් - ගොවිජන සංවර්ධනදෙපාර්තමේන්තුව

2017 වර්ෂයට අදාලව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පවත්වා ඇති අතර වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන අංශය සිදු කර ඇති විගණන පරීක්ෂණ වාර්තා සමාලෝචනය කිරීම, රජයේ විගණන විමසුම් සමාලෝචනය කිරීම, මූල්‍ය වාර්තා වලට අදාල විගණකාධිපති වාර්තා සමාලෝචනය කිරීම පසුගිය විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වාර වලදී සිදු කර ඇත.

# සැලසුම් අංශය

## සැලසුම් අංශය - 2017

2015 වර්ෂයේදී ආරම්භ කරන ලද සැලසුම් අංශය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර අනුව යමින්, මණ්ඩලයේ සියලු අංශයන් සම්බන්ධීකරණය කොට අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සැලසුම් කිරීම, දත්ත හා සංඛ්‍යාති කාල ක්‍රමනුගතව රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, නිගමන හා නිර්දේශ ඉදිරිපත් කිරීම, පර්යේෂණ කටයුතු සිදු කිරීම ආදී වූ කටයුතුවල නියුක්ත විය.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ඉදිරි වැඩපිළිවෙල ඇතුලත් සංයුක්ත සැලැස්ම, ක්‍රියාත්මක සැලැස්ම ඇතුලුව, සියළුම ආයතනික සැලසුම් සකස් කිරීම ආදියද, එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මතුවන සියලු අවශ්‍යතා පූර්ණය කර ගැනීම ආදී සුවිශාල කාර්යභාරයක් සැලසුම් අංශය මගින් ඉටු කරනු ලබයි.

තවද මණ්ඩලයේ අනිකුත් අංශ සමඟ මනා සබඳතාවයක් පවත්වා ගනිමින් රේඛීය අමාත්‍යාංශය වන කෘෂිකර්ම අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය ප්‍රධාන කොට ගෙන අනිකුත් අමාත්‍යාංශ හා ආයතන සම්බන්ධීකරණය කිරීම, ඒ ඒ අමාත්‍යාංශ හා ආයතන සඳහා ලබා දිය යුතු මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්තා හා අනිකුත් වාර්තා සකස් කිරීම යනාදිය සැලසුම් අංශය මගින් සිදු කරනු ලබයි.

මීට අමතරව සැලසුම් අංශය මගින් සිදු කරනු ලබන ප්‍රමුඛතාව ලද ප්‍රධානතම කාර්යභාරයක් වන්නේ ලෝක බැංකුව හා අනුබද්ධ ජාත්‍යන්තර මූල්‍ය සමාගමේ (IFC) තාක්ෂණික සහාය ඇතිව,දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමේ ව්‍යාපෘතිය (ව්‍යාපෘති අංක 600663) සැලසුම් කිරීමය.මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ කෘෂිකාර්මික රක්ෂණයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සහ එමගින් ශ්‍රී ලංකාවේ කෘෂි රක්ෂණය, රක්ෂණ වෙළඳපොළ තුළ ව්‍යාප්ත කිරීමයි.

කාලගුණ දත්ත ලබා ගැනීමේ හැකියාව, ගොවිප්‍රජාවගේ පැතිරීම සහ කෘෂිකාර්මික වගාබිම් ව්‍යාප්තිය යන සාධකයන්ට අනුව අනුරාධපුර, පොලොන්නරුව, කුරුණෑගල, වව්නියාව සහ අම්පාර වැනි දිස්ත්‍රික්කයන් මෙම දර්ශක මත පදනම් වූ රක්ෂණ ව්‍යාපෘතියේ නියමු ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලදී. මෙම නියමු ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද දිස්ත්‍රික් කාර්යාලවල කාර්ය මණ්ඩල සාමාජිකයින් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල ඉහත දිස්ත්‍රික්කයන්හි අදාළ විෂයභාර නිලධාරීන් සහභාගී කරවා ගනිමින් තොරතුරු හුවමාරු කර ගැනීම හා දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමය පිළිබඳව දැනුම වැඩිදියුණු කිරීම සඳහා 2017 වර්ෂයේද වැඩමුළු සහ පුහුණු සැසි කිහිපයක් පැවැත්වීමට කටයුතු කරන ලදී. මේ වනවිට වව්නියාව දිස්ත්‍රික් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සැලසුම් අංශය, කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා එක්ව කාලගුණ තොරතුරු හුවමාරු කරගැනීමද සිදු කරන ලදී.

මෙම දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රියාවලියේ මුලික අරමුණ ස්වභාවික විපත් වලින් නිරන්තරයෙන් හානි සිදුවන කෘෂිකර්මාන්තය ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් දක්වා නගාසිටුවීමත්, ගොවිතැනෙන් ඇත් වන වර්තමාන ගොවිජනතාව ඒ සඳහා නැවත යොමු කිරීමත්ය. මේ සඳහා ඇපකැප වන අනෙකුත් රාජ්‍ය ආයතන, වර්ෂාපතන දත්ත ලබා දෙන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරමින් පවතින අතර ඉහත දෙපාර්තමේන්තුවලින් ලැබෙන දත්ත හා තොරතුරු ජාලගත කර එම ආයතන වලටත් ගොවිජනතාවටත් ලබාගත හැකි අයුරින් පවත්වාගැනීම හා යාවත්කාලීන තොරතුරු නිරන්තරයෙන් හුවමාරු කරගැනීමට දිස්ත්‍රික්ක තුල නිරන්තර සබැඳියාවක් ඇතිකිරීම මූලික අරමුණවිය.

ගොවිජනසේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ වවුනියා දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ශාඛා වන ඕමන්තෙයි, උළුක්කුලම්, චෙඩ්ඩිකුලම් හා නදුන්කනි යන ශාඛාවන් ජාතික කාලගුණ විද්‍යා දත්ත ජාලයට එකතු කරන ලදී. මෙලෙස දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම ක්‍රමවත් කිරීම ප්‍රධාන අරමුණ විය.

මීට අමතරව දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමයේ වන්දි නිර්ණය කිරීමේ කටයුතු ඉතා නිරවද්‍යව සිදුකිරීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ වර්ෂාපතන දත්ත ලබාගැනීමේ පරාසයන් පුළුල් කිරීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේද සහයෝගය ඇතිව වැඩපිළිවලක් ක්‍රියාත්මක කිරීම මෙහි මූලික පරමාර්ථයවූ අතර එම වැඩපිළිවෙල තවදුරටත් පුළුල් කිරීම සඳහා කෘෂිකර්ම, මහවැලි හා වාරිමාර්ග දෙපාර්තමේන්තු වලද සහයෝගය ලබා ගනිමින් දැනටමත් වවුනියා දිස්ත්‍රික්කයේ සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම තුළින් කාළගුණික තත්ත්වයන් අනුව කෘෂිකර්මාන්තයට වන බලපෑම විද්‍යාත්මකව හා තාක්ෂණික වශයෙන් තක්සේරු කර කඩිනමින් හානි පූර්ණය කිරීමට හැකිවන බැවින් පවතින ක්‍රමයේදී මෙන් මාස ගණනාවකට පසු අගතියට පත් පාර්ශවයන් බලායනය කිරීම වෙනුවට හානියට පත් පාර්ශවයන් ඉතා කෙටි කාලයක් තුලදී හානි පූර්ණය කිරීමේ ක්‍රමවේදයක් සකස්වනු ඇත. මෙයට අමතරව වළක්වාගත හැකි කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය කිරීමේ තොරතුරුද කෘෂිකර්මාන්තයට ලබා දීම තුළින් සිදුවන අවදානම කළමනාකරණය කර ගැනීමට කල් ඇතිව දැනුම් දීමේ ක්‍රමයක්ද සකස් වෙමින් පවතී.

සියලු දේපළ, පිරියත සහ උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් හෝ වටිනාකමේ සමුච්චිත හානිවීම් අඩුකර පිරිවැයටය.  වත්කමක වැදගත් සංරචක වෙනම හඳුනාගනු ලැබ ක්ෂය කරනු ලැබේ. දේපළක, පිරියතක හෝ උපකරණයක සැලකිය යුතු කොටස් යම් කාල අන්තර තුළ ප්‍රතිස්ථාපනක කරනු ලැබීමට අවශ්‍ය වූ විට, ප්‍රතිස්ථාපිත කොටස පිළිගැනීමෙන් ඉවත් කර නව කොටස එය ආශ්‍රිත ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ක්ෂයවීම සහිතව අස්තිත්වය මගින් පිළිගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

රු. 691,945.42 ක මුළු ඓතිහාසික පිරිවැයක් සහිත සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් දේපළ, පිරියත හා උපකරණවල ඇතුලත් කර තිබේ.

**(ආ)	පිරිවැය**

දේපල, පිරියත හා උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගැනීමේ මිලෙන් සහ අදාළ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙන ඒම සඳහාවූ කිසියම් සෘජුවම ආරෝපණීය වූ පිරිවැයෙන් සමන්විත වේ.

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද තදනන්තර වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන පරීක්ෂා කිරීම් ඇතුළුව වෙනම ගිණුම් තබා ඇති දේපල, පිරියත හෝ උපකරණ අයිතමයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලාඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

**(ඇ) ක්ෂයවීම්**

සරල මාර්ග ක්‍රමය මත පහත දැක්වෙන වාර්ෂික අනුපාතයන්ට එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත්කිරීම පිණිස, ක්ෂයවීම් විස්තිරණ ආදායම් ප්‍රකාශයේ වැයබරක් සේ දක්වනු ලබයි.

| | |
|---|---|
| කාර්යාල උපකරණ | 10% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |
| සුබසාධන උපකරණ | 10% |
| පරිගණක | 20% |

**2.2 අස්පෘශ්‍ය වත්කම්**

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්වයක් තිබේනම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී.ල.ගි.ප්‍ර. -38 අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිළිගනු ලැබේ. ඒ අනුව මෙම වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් සමුච්චිත හානි අගය අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ.

පරිගණක මෘදුකාංග සරල රේඛීය ක්‍රමය මත වසර 5 ක කාල සීමාවක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

**2.3 වටේටෝරු භාණ්ඩ**

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය.

මෙම පිරිවැයට තොග හා භාණ්ඩ අත්කරගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට ගෙන ඒමට දරන ලද වියදම්ද ඇතුලත්ය.

**2.4 මූල්‍ය වත්කම්**

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභය හෝ පාඩුව, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරීම තෙක් රඳවා ගත් ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හෝ ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස නම් කරනු ලැබූ ව්‍යුත්පන්න හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සිය මූල්‍ය වත්කම්හි මූලික පිළිගැන්ම මත අධ්‍යක්ෂ මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකම ධන ලෙසත් ලාභහෝ පාඩු මගින් වත්කම් සාධාරණ වටිනාකමට නොවන අවස්ථාවන්හිදී ඍජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැයටත් ආරම්භයේදී පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පත් ආරම්භයේදී ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී පිළිගනු ලැබේ. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ සහ පාඩු හරහා සාධාරණ වටිනාකමට නිමිත කළ වත්කම් ඇතුළුව) ආරම්භයේදී පිළිගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසානවීමේදී හෝ මූල්‍ය වත්කමක හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැළකියයුතු ලෙස පවරනු ලබන විටකදී ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදි මණ්ඩය මූල්‍ය වත්කම පිළිගැනීම ඉවත්කරනු ලැබේ. පවරනු ලැබූ මූල්‍ය වත්කමක මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවාගනු ලැබූ යම් බැඳියාවක් වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස පිළිගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇතිවිටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකර බැරකම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතුදෑ ඇතුලත් වේ.

**(අ) ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්**

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳහා සඳහා රඳවා ගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මුල් පිළිගැනීම මත නම් කළ මූල්‍ය වත්කම් ඇතුළත් වේ.

මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇත්නම්, ඒවා වෙළඳාම සඳහා රඳවාගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට හෝ මූල්‍ය වියදමට පිළිගනු ලැබූ සාධාරණ වටිනාකමේ වෙනස්කම් සහිතව සාධාරණ වටිනාකමට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වනු ලැබේ.

**(ආ) ණය සහ ලැබිය යුතු මුදල්**

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතාකරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.

ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කර ගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධිකාශයක් සහ සඵල පොළී අනුපාතයේ අනුකලක කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි.සඵලපොළී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හීනවීම් හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබිය යුතු දෑ, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, අනෙකුත් ලැබිය යුතු දෑ සම මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

**(ඇ) කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන**

ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම් මණ්ඩලයට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් ඇතිවිටදී ඒවා කල්පිරීම දක්වා රඳවා ගැනීම සේ වර්ගීකරණය කරනු ලැබේ.

මූලික ගණනය කිරීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.

සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතුකොටගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල අයෝජන, කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබේ.

**(ඈ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන**

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකුණුම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික පිළිගැනීමට පසුව, ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ. විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී අනුපාතය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ. ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට, අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

### 2.5.1 මූල්‍ය වත්කම් හානි

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ .

## 3. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ  ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ .

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී,  දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත .අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් පිළිගනු ලැබේ .

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ‘විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය’ අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත .කෙසේ වෙතත්, 1983  අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ  පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

### 3.2 බදුකරණය

1990 අංක 22 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන ප්‍රකාරව මණ්ඩලය ආදායම් බද්දෙන් නිදහස් කර තිබේ .

### 3.3 ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ .

මණ්ඩලයේ ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

### 3.4 ගොවි විශ්‍රාම අරමුදලේ බැරකම්

ගොවි විශ්‍රාම අරමුදලේ බැරකම් 2007 දී සිදුකරන ලද ආයුගණක ගණනය කිරීම මත වත්මන් වටිනාකම පාදකව මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කර ඇත.

## 4. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

### 4.1 ආදායම

අ) මණ්ඩලයේ ආදායම රක්ෂණ වාරික, භාණ්ඩාගාර බිල්පත්වලින් සහ සේවක ණය සඳහා පොළී ආදායම සහ අනෙකුත් විවිධ ආදායම් නියෝජනය කරයි.

ආ) වාරික එකතු කිරීමෙන් ලත් සියලු ආදායම් මුදල් පදනමකින් පිළිගනු ලැබේ.

ඇ) 1996 වසරේදී සිදුකළ ආයෝජනවලින් 2017 වසරේදී දළ පොළී ආදායම ලෙස ලංකා බැංකුවෙන් රු.37,642,911.04 ක් ලැබී ඇති අතර ඒ සඳහා කොළඹ දිසා අධිකරණයේ MR 21843,MR 21844,MR 21845 යන නඩුනැවත විමර්ශනය කරනු ලැබේ.

**4.2 ආදායම පිළිගැනීම**

අ) විශ්‍රාම වැටුප් වාරික ආදායම බඳවා ගන්නා අවස්ථාවේදී පිළිගනු ලැබේ .

ආ) ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර අදාළ වියදම් සමග ගලපනු ලැබේ.

ඇ) පොළී ආදායම කාල පදනමකින් උපචිත වේ .

## 4.3 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

දරන ලද වියදම් වෙනුවෙන් මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන එම වියදම් පිළිගනු ලැබූ කාල සීමාව තුළ ආදායම් ලෙස විස්තීර්ණ ආදායමේ පිළිගනු ලැබේ. වත්කමක පිරිවැය සඳහා මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

## 4.4 වියදම

ධීවර විශ්‍රාම වැටුප් සහ රක්ෂණ යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වා ගෙන යාමේදී දරන ලද සියලු වියදම් වර්ෂය සඳහා අතිරික්තය හෝ හිඟය තීරණය කිරීමේදී උපචිත පදනමකින් ආදායමට වැය බරක් සේ දක්වා ඇත.

අංක 401/4 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන් කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම් පහත දැක්වෙන පරිදි වේ.

| වියදම | අනුපාත |
|---|---|
| කුලී දුරකථන | 5% |
| තැපැල් ගාස්තු, ජල ගාස්තු | 5% |
| විදුලිය | 5% |
| ප්‍රධාන කාර්යාල උපකරණ | 5% |
| ගොඩනැගිලි නඩත්තුව | 5% |
| වාහන නඩත්තුව | 3% |
| ඉන්ධන | 2% |
| ලිපි ද්‍රව්‍ය | 2% |
| නිල ඇඳුම් | 2% |
| ආරක්ෂක | 5% |
| පරිගණක වියදම් | 5% |
| | |

**5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර ඇත්තේ "වක්‍ර ක්‍රමය "යොදා ගනිමිනි.

**6. වාර්තාකරණ දිනයෙන් පසුසිදුවීම්**

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්වල ප්‍රමාණවත් බව සලකා බලා ඇති අතර අවශ්‍ය තැන්හිදී ගිණුම්වල යෝග්‍ය ගැලපීම් සිදුකර ඇත.

## 7. ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ආශ්‍රිත පාර්ශව ලෙස සලකනු ලැබේ. මෙම ආශ්‍රිත පාර්ශව සමඟ සිදුකළ ගනුදෙනු සාධාරණ වටිනාකම මත පදනම්ව හෙළිදරව් කරනු ලැබේ. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට රු. 518,000,000 ක ණයක් ලබා දී ඇත.

## 8. අනිශ්චිත අවස්ථා

### ලැබිය යුතු පොළී

1996 දී භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජනය මත පොළී අහිමිවීම සම්බන්ධයෙන් මණ්ඩලය ලංකා බැංකුවට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ පවරනු ලැබූ පහත දැක්වෙන නඩු සඳහා නැවත විමර්ශන පවත්වන ලෙස නියෝග කොට ඇත.

| නඩු අංකය | මුදල (රු.) |
|---|---:|
| MR 21843 | 1,454,670.84 |
| MR 21844 | 1,172,602.46 |
| MR 21845 | 2,784,657.55 |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**<u>මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්</u>**

**<u>සටහන -01</u>**
2017 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

| විස්තරය | කාර්යාල උපකරණ | සුබසාධන උපකරණ | ලීබඩු සහ සවිකිරීම් | පරිගණක | එකතුව |
|---|---|---|---|---|---|
| | | | | | |
| 2017 ජනවාරි 01 දිනට පිරිවැය | 528,648.50 | 1,325.00 | 78,876.92 | 269,485.00 | 878,335.42 |
| | | | | | |
| එකතු කළා එකතු කිරීම් | - | - | - | - | - |
| | | | | | |
| අඩුකළා බැහැර කිරීම් | - | - | - | - | - |
| | | | | | |
| **2017 දෙසැ.31 දිනට මුළු පිරිවැය** | **528,648.50** | **1,325.00** | **78,876.92** | **269,485.00** | **878,335.42** |
| | | | | | |
| ක්ෂයවීම් අනුපාතය | 10% | 10% | 10% | 20% | |
| | | | | | |
| සමුච්චිත ක්ෂය වීම 2016 ජනවාරි 1 දිනට | 381,202.46 | 1,325.00 | 55,364.42 | 262,422.92 | 700,314.80 |
| | | | | | |
| අඩුකළා බැහැර කිරීම් | - | - | - | - | - |
| | | | | | |
| වර්ෂය සඳහා ක්ෂයවීම | 7,558.50 | | 2,850.00 | 1,994.00 | 12,402.50 |
| | | | | | |
| **මුළු ක්ෂය වීම** | **388,760.96** | **1,325.00** | **58,214.42** | **264,416.92** | **712,717.30** |
| | | | | | |
| **ශුද්ධ වටිනාකම** | **139,887.54** | **-** | **20,662.50** | **5,068.08** | **165,618.12** |

දේපළ, පිරියත හා උපකරණවලට 2017 දෙසැම්බර් 31 දිනට රු 691,945.42 ක ඓතිහාසික පිරිවැයක් සහිත තවමත් භාවිතයේ පවතින පූර්ණව ක්ෂයකරන ලද වත්කම් ඇතුලත් වේ.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**2017.12.31 දිනට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| සටහන 02 - තොග | 2017.12.31<br>රු.ශත | 2016.12.31<br>රු.ශත |
|---|---|---|
| | | |
| මුද්‍රණ ද්‍රව්‍ය | 176,121.67 | 191,245.12 |
| | | |
| | **176,121.67** | **191,245.12** |
| | | |
| **සටහන 03 - ලැබිය යුතු දෑ** | | |
| | | |
| ගොවි විශ්‍රාම වැටුප් ණය | 663,905,406.44 | 649,510,627.28 |
| ලැබිය යුතු දෑ-FSH දෙපාර්තමේන්තුව | - | 1,500,000.00 |
| මරණ පාරිතෝෂික අත්තිකාරම් | 50,000.00 | 50,000.00 |
| | | |
| | **663,955,406.44** | **651,060,627.28** |
| | | |
| | | |
| **සටහන 04 -** | | |
| **කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍ය සාධන පත්‍ර** | | |
| | | |
| භාණ්ඩාගාර බිල්පත් -ලංකා බැංකුව | 35,026,923.08 | 11,210,577.22 |
| | | |
| | **35,026,923.08** | **11,210,577.22** |
| | | |
| **සටහන 05- බැංකුවේ ඇති මුදල්** | | |
| | | |
| ගි.අංක.164790 ලංකා බැංකු යුනියන් පෙදෙස | 144,211.79 | 200,411.11 |
| ගි.අංක.164795 ලංකා බැංකු යුනියන් පෙදෙස | 451,683.80 | 416,512.07 |
| එකතු කිරීම් ගිණුම | 66,486.00 | 44,335.00 |
| | **662,381.50** | **661,258.18** |
| | | |
| **සටහන 06 - ධීවර විශ්‍රාම වැටුප් අරමුදල** | | |
| | | |
| ඉදිරියට ගෙනා ශේෂය | (2,418,370,198.12) | (2,174,633,659.27) |
| විශ්‍රාම වැටුප් බැරකමේ වත්මන් වටිනාකම - 2009 දක්වා | | |
| පෙර වසරේ ගැලපුම | | - |
| | (2,418,370,198.12) | (2,174,633,659.27) |
| වර්ෂය තුළදී එකතු කිරීම් | | |
| වසර සඳහා මුළු අතිරික්තය/(හිඟය) | (238,237,436.38) | (243,736,538.85) |
| | (2,656,607,634.50) | (2,418,370,198.12) |
| | | |
| | **(2,656,607,634.50)** | **(2,418,370,198.12)** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**2017.12.31 දිනට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | 2017.12.31<br>රු.ශත | 2016.12.31<br>රු.ශත |
|---|---|---|
| | | |
| **සටහන 7 - මරණ පාරිතෝෂික අරමුදල** | | |
| | | |
| ඉදිරියට ගෙනා ශේෂය | 24,012,849.70 | 22,780,199.70 |
| එකතු කළා: | | |
| වසර සඳහා දායක මුදල් | 1,766,725.00 | 1,761,650.00 |
| අඩුකළා: | | |
| මරණ පාරිතෝෂික ගෙවීම් | (463,800.00) | (529,000.00) |
| | (463,800.00) | (529,000.00) |
| | **1,302,925.00** | **1,232,650.00** |
| | | |
| | **25,315,774.70** | **24,012,849.70** |
| | | |
| **සටහන 08 - ගෙවියයුතු දෑ** | | |
| | | |
| ගෙවිය යුතු -විශ්‍රාම වැටුප් ගෙවීම | 1,712,004.00 | 762,063.00 |
| ගෙවිය යුතු- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය | 27,780,,919.99 | 21,842,501.57 |
| ගෙවිය යුතු - මරණ පාරිතෝෂිකය | 118,413.00 | 242,839.00 |
| ගෙවිය යුතු - මරණ පාරිතෝෂිකය | 148,000.00 | 180,000.00 |
| ගෙවිය යුතු - ආබාධිත පාරිතෝෂිකය | - | - |
| ගෙවිය යුතු -දිරි දීමනා | 16,650.00 | 12,636.00 |
| ගෙවිය යුතු - දායක මුදල් මත ආපසු ගෙවන පොළිය | 175,044.00 | 190,799.00 |
| ගෙවිය යුතු - සේ.අ.අ./සේ.භා.අ. | 435,806.46 | 532,571.50 |
| | | |
| | **30,386,837.45** | **23,763,410.07** |
| | | |
| | | |
| | | |
| **සටහන 9 - උපචිත වියදම්** | | |
| | | |
| මුද්‍රණ ගාස්තු | 515,000.00 | 465,000.00 |
| නෛතික ගාස්තු | 17,000.00 | 17,000.00 |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 1,417,697.00 | 1,606,025.00 |
| | | |
| | **1,949,697.00** | **2,088,025.00** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**2017.12.32 දිනට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | **2017.12.31**<br>රු.ශත | **2016.12.31**<br>රු.ශත |
|---|---|---|
| **සටහන 10 - පරිපාලන වියදම්** | | |
| වැටුප් සහ වේතන | 2,475,351.59 | 2,166,131.75 |
| සේ.අ.අ දායක මුදල් | 245,012.38 | 205,316.51 |
| සේ.භා.අ. දායක මුදල් | 61,203.10 | 51,279.22 |
| අතිකාල | 1,947.00 | 37,229.00 |
| TAC සාමාජිකයන්ට දීමනා | - | - |
| විශේෂ දීමනා | 438,428.00 | 521,928.00 |
| පාරිතෝෂික | 149,926.00 | 166,594.56 |
| නෛතික ගාස්තු | - | 21,656.75 |
| ඉන්ධන | 186,250.96 | 144,656.70 |
| ලිපි ද්‍රව්‍ය | 119,290.82 | 74,305.31 |
| මුද්‍රණ | 99,959.45 | 153,338.21 |
| නෛතික ගාස්තු | 413,500.00 | |
| කාර්ය මණ්ඩල නිලඇඳුම් | 6,157.81 | 5,761.50 |
| කුලී | 641,028.51 | 554,126.03 |
| දුරකථන | 221,487.08 | 119,638.13 |
| තැපැල් ගාස්තු | 108,487.44 | 79,953.70 |
| ජල බිල්පත් | 22,331.00 | 16,660.16 |
| ආරක්ෂක | 38,783.15 | 41,745.00 |
| විදුලිය | 168,590.37 | 135,649.06 |
| රථ වාහන නඩත්තුව | 419,250.72 | 346,612.08 |
| ගොඩනැගිලි නඩත්තුව | 92,206.55 | 6,013.85 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 33,357.75 | 47,778.34 |
| පරිගණක වියදම් | 79,490.74 | 597.00 |
| ක්ෂයවීම | 12,402.50 | 5,169.00 |
| විගණන ගාස්තු | 150,000.00 | 175,000.00 |
| | **6,184.443.64** | **5,077,139.86** |
| | | |
| **සටහන 11 - මූල්‍ය ගාස්තු** | | |
| | | |
| බැංකු ගාස්තු | 7,540,00 | 7,500.00 |
| | **7,540.00** | **7,500.00** |
| | | |
| **සටහන 12- අනෙකුත් ආදායම** | | |
| | | |
| ලංකා බැංකුවෙන් ලැබුණු පොළී ආදායම | 37,672,911.04 | - |
| | **37,672,911.04** | - |
| | | |

C-50 Final

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. ඒපීඑල්/ඊ/ඒඒඅයිබී/1/17/27 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2018 අගෝස්තු 15 දින |

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

DG/D(F)

පිටපත් :- 01. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය

02. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ඒපීඑල්/ඊ/ඒඒපීයිබී/1/17/27
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2018 අගෝස්තු 15 දින

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ 28 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව 2018 මැයි 30 දින ආයතනයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම.

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන.

### 2.1 තත්ත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ප්‍රමිතයේ 51 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.22,397,384 ක්වූ මෝටර් රථ 17 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද ඒවා තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18**

ප්‍රමිතයේ 13 වන ඡේදය ප්‍රකාරව අවසන් ගිණුම් ප්‍රකාශනයන්හි ගිණුම් ශේෂ වෙන් වෙන්ව දැක්වීම වෙනුවට පිළිවෙලින් රු.7,757 ක් හා රු.41,904,480 ක්වූ කෘෂිකාර්මික උපකරණ රක්ෂණය හා තෙවන පාර්ශව රක්ෂණ ආදායම කෘෂි උපකරණ රක්ෂණය යටතේ එකතුව රු.41,912,237 ක් ලෙස පෙන්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

ප්‍රමිතයේ 59 ඡේදය ප්‍රකාරව වර්තමාන හොඳම ඇස්තමේන්තුව හඳුනා ගැනීමට සත්‍ය ගොවි දායකයින් පිළිබඳව ආයුගණක තක්සේරුවක් කිරීමෙන් තොරව ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.21,175,440 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

2014 වර්ෂයේ දී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පවරන ලද රජයේ වටිනාකම තක්සේරු කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර 5 ත් වසර 26 අතර කාලයක සිට පැවත එන එකතුව රු.676,194 ක් වූ සේවක ණය සහ අත්තිකාරම් සේවක පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් කාලීනව අයකර ගැනීමකින් තොරව ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) වසර 5 ත් වසර 13 අතර කාලයක සිට ඉදිරියට එමින් පැවතුණු එකතුව රු.708,347 ක ලැබිය යුතු ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) ගොවි හා ධීවර විශ්‍රාම යෝජනා ක්‍රම වලට පරිපාලන වියදම් දැරීම සඳහා පෙර වර්ෂවලදී ලබා දී තිබුණු එකතුව රු. 124,340,973 ක් අයකර ගැනීමකින් තොරව අඛණ්ඩව ඉදිරියට ගෙනඑමින් පැවතුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ත් වර්ෂ 14 ත් අතර කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණු එකතුව රු.1,925,074 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු ගෙවීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 6.3 උප වගන්තිය | 2002 වර්ෂයේ වැඩ තහනම් කරනු ලැබූ නිලධාරියෙකුට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් චෝදනා පත්‍රයක් නිකුත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2010 මාර්තු 30 දිනැති අංක DMS/34(ii) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වන ආයතනයේ විධායක නිලධාරීන් සඳහා 2009 වර්ෂයේ සිට දිනකට රු.2500 බැගින් යැපීම් දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන හිමිකම් නොමැති මධ්‍යම මට්ටමේ කළමනාකාරවරුන් සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් කාර්යාල ස්ථානයේ සිට යාමට සහ ඒමට කිලෝමීටර් 100 ක උපරිමයකට යටත්ව සැපයීම කළ යුතු වුවද ප්‍රවාහන දීමනාවට හිමිකමක් නොමැති, අංශ ප්‍රධානියෙකු හා විධායක නිලධාරියෙකු වෙනුවෙන් පිළිවෙලින් මාසයකට රු.8,000 ක් හා රු.4,000 ක් ද බැගින් එකතුව රු.1,948,000 ක් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 තුළ දී ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රතිඵලය රු.49,930,208 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.355,825,300 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.305,895,093 ක එනම් සියයට 86 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීම සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී වී වගා රක්ෂණ ආදායම් ලැබීම් රු.580,565,015 කින් අඩු වීම ද කෙතට අරුණ වන්දි ගෙවීම් හැර වී වගා හා වන්දි ගෙවීම් රු.198,433,350 කින් වැඩි වීමද හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ දී ඌනතාවයක් පැවතියද 2014 වර්ෂයේදී නැවත අතිරික්තයක් බවට පත්වී 2017 වර්ෂය දක්වා උච්චාවචනයන් සහිතව වර්ධනය වී තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු. 20,510,517 ක සෘණ අගයක් වූ ආයතනයේ දායකත්වය 2014, 2015, 2016 හා 2017 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.89,041275 ක්, රු.93,025,769 ක්, රු.450,004,279 ක් හා රු.145,733,936 ක් වශයෙන් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

යෝජනා ක්‍රමයේ ප්‍රධාන අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සියළුම රක්ෂණ ක්‍රම වලින් රු.210,000,000 ක් ඉපයීමට ඉලක්ක කර සිටියද තථ්‍ය ඉපයීම රු.156,474,160 ක් වීමෙන් ආදායම රු.13,525,840 කින් එනම් සියයට 25 කින් අඩු වී තිබුණි.

(ආ) සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණ ක්‍රමයේ ආදායම් ඉපයීමේ ඉලක්කය රු.29,833,000 ක් වුවද එය ඉටු කර ගැනීම රු.5,313,362 ක් වුයෙන් එහි ප්‍රගතිය සියයට 18 කට වඩා අඩු මට්ටමක් විය. මෙය පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 66 ක අඩුවීමකි.

(ඇ) කෘෂි උපකරණ රක්ෂණය සඳහා දිස්ත්‍රික්ක 16 කින් රු.2,343,000 ක ආදායමක් ඉපයීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී දිස්ත්‍රික්ක 7 කින් රු.40,055 ක් පමණක් උපයා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 05 කින් වී ගබඩා 490 ක් රක්ෂණය කිරීමට අපේක්ෂා කර තිබුණ ද එක් ගබඩාවක් පමණක් රක්ෂණය කර තිබුණි.

(ඉ) වන්දි ලබා ගැනීමේදී ගොවි ජනතාව පත්වන අපහසුතාවය මගහරවා, ඉතා කෙටි කාලසීමාවක් තුළ හානි තක්සේරු කර අදාල වන්දි මුදල් ලබා දීම සඳහා දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමයක් දිස්ත්‍රික්ක 5 ක ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය ලෝක බැංකුවට අනුබද්ධිත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ 2016 මැයි 05 වන දින ගිවිසුමකට එළඹ තිබුණි. අදාළ ව්‍යාපෘති කටයුතු 2019 මැයි 04 නිමවීමට නියමිත නමුදු, වාර්තාවේ දින වන විටද වවුනියා දිස්ත්‍රික්කයේ පමණක් මෙය ක්‍රියාත්මක කර තිබුණි.

(ඊ) රතු ළූනු, කුරක්කන්, උඳු, රටකජු, කව්පි, මුං, තල, බුලත්, ගම්මිරිස්, ඉඟුරු, කොකෝවා, තේ, පොල්, එළවළු, පළතුරු, මල් වගා, කජු, උක් හා පුවක් යන රක්ෂණ යෝජනා ක්‍රම සංයුක්ත සැලැස්මේ සඳහන්ව තිබුණ ද ඒවා ක්‍රියාත්මක වී නොතිබුණි.

(උ) ධීවර සහ වන වගා නිෂ්පාදනයට රක්ෂණය ආරම්භ නොකිරීම , තරඟකාරී නව රක්ෂණ ක්‍රම අවශ්‍යතා හඳුනාගෙන ක්‍රියාත්මක නොකිරීම හා වාණිජ බැංකු කෘෂිකාර්මිකයාට ලබාදෙන ණය යෝජනා ක්‍රම අධ්‍යයනය කර වඩා ඵලදායී රක්ෂණ ක්‍රම හඳුන්වා දී ගොවීන් රක්ෂණ ක්‍රමවලට පොළඹවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්.**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ඇඹිලිපිටිය දිස්ත්‍රික් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ලබා දී ඇති ඉඩම සඳහා වර්ෂ 31 ක් වෙනුවෙන් රු.2,764,344 ක හිඟ බදු මුදලක් ගෙවිය යුතු බවත් එසේ නොවුවහොත් 2017 මාර්තු 31 දිනෙන් පසුව සියයට 10 ක අධිභාරයක් ද එකතුවන බව මහවැලි අධිකාරිය මගින් මණ්ඩලයට ලිඛිතව දන්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද මේ සඳහා කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) 2005 වසරේ සිට වසර 13 කට ආසන්න කාලයක සිට අනිවාර්යය නිවාඩු යවා තිබූ නිලධාරින් දෙදෙනෙකු සම්බන්ධයෙන් විනය පරීක්ෂණ කටයුතු 2018 ජූනි 30 දින වන විට ද ආරම්භ කර නොතිබුණි.

(ඇ) 2016 / 2017 මහ කන්නයේදී නියඟයෙන් පීඩාවට පත් වූ ගොවි ජනතාවට සහන සැලසීම සඳහා එක් ගොවියෙකුට රු.10,000 බැගින් වන්දි මුදලක් ගෙවීමට රජය තීරණය කර තිබුණි. එම වන්දි මුදලින් රක්ෂණ වාරික වශයෙන් රු.1,350 ක් අඩු කර රු.8,650 බැගින් දිස්ත්‍රික් කාර්යාල විසින් විද්‍යුත් මාධ්‍ය ඔස්සේ එවූ හානි වාර්තා පදනම් කරගෙන අන්තර් බැංකු ගනුදෙනු මගින් (SLIP Transaction) ගෙවීම සිදුකර තිබුණද එම මුල් වාර්තා මණ්ඩලය විසින් නැවත පරීක්ෂාවකට ලක් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i). අතුරු භෝග වගාකර හානි වූ ගොවීන් 32 දෙනෙකුට හිමි රු.276,800 ක මුදලක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව මහජන බැංකු ශාඛාවේ එක් ගොවියෙකුගේ ගිණුමකට බැර වී තිබුණු අතර 2018 ජූනි 30 දින දක්වා එය නිරවුල් කර නොතිබුණි.

(ii). වන්දි ගෙවීම් කරන විට ජාතික හැඳුනුම්පත් අංක ද්විගණනය නොවන ලෙස ගෙවීම් කළ යුතු බව දන්වා තිබුණ ද දිවයිනේ දිස්ත්‍රික්ක 10 ක ගොවීන් 414 දෙනෙකුට එකම හැඳුනුම්පත් අංකය හා එකම නම සඳහන් වීම හේතුවෙන්

රු.3,581,100 ක් වැඩිපුර ගෙවා තිබුණ බව විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iii). වන්දි ලාභීන්ගේ හැඳුනුම්පත් අංක , නම වෙනස්වීම නිසා ගොවීන් 9,587 දෙනෙකුට ගෙවූ එකතුව රු.82,927,550 ක මුදලක් බැංකු මගින් ප්‍රතික්ෂේප වී තිබූ අතර, 2018 ජුනි 30 දින වන විට ඉන් ගොවීන් 6,461 කට අදාළව රු. 57,366,800 ක මුදලක් තව දුරටත් ගෙවිය යුතුව තිබුණි.

(ඈ) ගොවි නියෝජිතයන් වෙත බෙදාහැරීම සඳහා මණ්ඩලයේ මාතර දිස්ත්‍රික් කාර්යාලය වෙත භාරදීමට 2017 මාර්තු 01 දින අධ්‍යක්ෂ (අලෙවි) විසින් රැගෙන ගිය අවම අලෙවි වටිනාකම රු.470,000 ක් වූ රක්ෂණ කාඩ්පත් 1,000 ක්, වටිනාකම රු.31,970 ක් වූ ටී ෂර්ට් 46 ක් හා රථ වාහන අයදුම්පත් 2,000 ක් අස්ථාන ගතවී තිබුණි.

(ඉ) 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් අය කර ඇති රු.30 බැගින් වූ ගොවි විශ්‍රාම වැටුප් රක්ෂණ වාර මුදල් එකතුව රු.194,619,125 ක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2015 වර්ෂයේදී කළමනාකරණ සහකාර බඳවා ගැනීම් 44 ක් වෙනුවෙන් පුවත්පත් දැන්වීම් පළ කිරීමට රු.137,640 ක් හා දිස්ත්‍රික් මට්ටමින් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට රු.843,298 ක් වැයකර තිබුණ ද 2018 ජුනි 30 දින වන තෙක් කිසිදු බඳවා ගැනීමක් සිදු කර නොතිබීමෙන් සමස්ථ වියදම වූ රු.980,938 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

(උ) 2010 වර්ෂයේ සිටම ආයතනයේ කාර්යසාධනය වර්ධනය කිරීමට පවතින බාධාවන් වශයෙන් පහත සඳහන් දුර්වලතා හඳුනාගෙන තිබුණ ද ඒවා මගහැර ගැනීමට කළමනාකරණය මෙතෙක් අපොහොසත් වී තිබුණි.

(i). ජීවසණක හා පර්යේෂණ කටයුතු සඳහා විශේෂඥ දැනුමක් ඇති ස්ථිර නිලධාරියෙකු නොමැති වීම.

(ii). නිපුණතාවයක් ඇති කාර්ය මණ්ඩලයේ හැකියාවන් ක්‍රියාත්මක කිරීමට ඇති බාධාවන්.

(iii). නව තාක්ෂණයට අනුව කටයුතු කළ හැකි කාර්යය මණ්ඩලයේ හිඟකම.

(iv). ආයතනය සතුව ඇති ගොඩනැගිලි ප්‍රමාණවත් නොවීම හා ප්‍රධාන කාර්යාලය සඳහා ස්ථිර කාර්යාලයීය ගොඩනැගිල්ලක් නොමැති වීම.

(v). තරඟකාරී ආයතන සමඟ සසඳන කල ආයතනය සතු කාර්යාලයීය උපකරණ ඉහළ තාක්ෂණික මට්ටමින් හා අවශ්‍ය කරන ප්‍රමිතීන්ගෙන් යුක්ත නොවීම.

**4.3** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

ගොවි නියෝජිතයන් හට බෙදාදීම සඳහා 2017 මැයි මාසයේදී මිලදී ගත් වටිනාකම රු.157,920 ක් වූ ටී ෂර්ට් 282 ක් 2018 ජුනි 30 දින වන විටද බෙදාහැර නොතිබුණි.

**4.4** **නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සතුව ධාවනය කළ හැකි සංචිත වාහන 7 ක් පැවතිය ද සේවයේ නියුක්ත රියදුරන් සංඛ්‍යාව තිදෙනෙකු පමණක් වීම හේතුවෙන් එම වාහන ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) වර්ෂ 30 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින ඇඹිලිපිටියේ පිහිටි නිල නිවාසයක් අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කර භාවිතයට ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

**4.5** **අනාර්ථික ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වගා භූමියේ හා වගාවේ තොරතුරු ලබා ගැනීමට අමාත්‍යාංශය යටතේ සිටින ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ජංගම තාක්ෂණ උපකරණ 1000 ක් මිලදී ගැනීමට හා වගා හානි වෙනුවෙන් ප්‍රතිරක්ෂකයෙකු තෝරා ගැනීම වෙනුවෙන් ලංසු කැඳවීම සඳහා පුවත්පත් මගින් දැන්වීම් පළ කිරීමට පිළිවෙලින් රු.115,115 ක් හා රු.32,000 ක් වැය කර තිබුණි. එසේ වුවද එම කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් පුවත්පත් දැන්වීම් සඳහා දරා තිබූ මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදල් සඳහා දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් 2006 ජනවාරි සිට 2013 අප්‍රේල් දක්වා සේවකයාගේ හා සේවායාගේ හිඟ දායකය ලෙස රු.29,409,723 ක් හා අධිභාර ලෙස රු.14,704,862 ක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) මණ්ඩලයට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ජලය සපයා ගැනීම වෙනුවෙන් 2008 ජුනි 04 දින ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට රු.565,800 ක් ගෙවා තිබුණද මුදල ව්‍යාපෘතිය අත්හැරීම නිසා අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි. එසේ වුවද එම වටිනාකම ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් දක්වා තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තනතුරු නාම 12 ක පැවති පුරප්පාඩු 119 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් සම්පූර්ණ කර නොතිබුණි. තවද 2018 වර්ෂය තුළ නිලධාරීන් 09 ක් විශ්‍රාම යාම හා කොන්ත්‍රාත් හා අනියම් පදනමින් නිලධාරීන් 49 ක් සේවයේ යොදවා සිටීම ආදිය හේතුවෙන් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ සමස්ථ කාර්යසාධන මට්ටම අවම තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව හා මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ ව්‍යාපාර සංවර්ධන කළමනාකාර තනතුරු සඳහා නිලධාරීන් හතරදෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තෙවැනි පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සේවයේ නියුක්ත කර තිබුණි. භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ඔවුන්ට රු.40,000ක මාසිකව දීමනාවක්, රු.35,000ක වාහන දීමනා, ලීටර් 250 කට සමාන ඉන්ධන දීමනා ලෙස 2015 හා 2016 වර්ෂයන්හිදී එකතුව රු.8,071,022 ක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් නිලධාරීන් දෙදෙනෙකුට පමණක් රු.3,769,660 ක මුදලක් ගෙවා තිබුණි.

**5. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟා වීම මැන බැලීම සඳහා රක්ෂණය වූ ගොවීන් පිළිබඳව හා වගා බිම් පිළිබඳව නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2017 වර්ෂය දිළිඳුකමින් නිදහස් කිරීමේ වර්ෂය ලෙස හඳුනාගෙන තිබුණු අතර අරමුණ අනුව කෘෂිකාර්මික හා ගොවිජන යෝජනා ක්‍රමය විසින් දරිද්‍රතා මට්ටම උග්‍ර ලෙස පවතින දිස්ත්‍රික්ක ලෙස නම් කර ඇති මන්නාරම, මුලතිව්, කිලිනොච්චි, මඩකලපුව, බදුල්ල හා මොනරාගල දිස්ත්‍රික්ක හරහා ප්‍රචාරක වැඩසටහන් හා ව්‍යාපෘතීන්වලට ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කරන බව දක්වා තිබුණ ද ප්‍රචාරණ වැඩසටහන් වලදී වැඩි ප්‍රමුඛතාවයක් ලබාදී තිබුණේ තෙවන පාර්ශව රක්ෂණ ආදායම් වැඩි කර ගැනීම සඳහා පමණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඇ) තිරසර සංවර්ධන අරමුණු යටතේ දේශගුණික විපර්යාස හා එහි බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම සඳහා හඳුනාගත් ඉලක්කය ලෙස දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වා දීම මගින් වන්දි ගෙවීම කාර්යක්ෂම කිරීමට සැළසුම හඳුනාගෙන තිබුණද, වර්තමානය වනවිටත් එය වවුනියා දිස්ත්‍රික්කයේ පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 68 ත් සියයට 419 ත් අතර විචලනයක් වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 6.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම

2016 පෙරවාරි 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ 13 වැනි රැස්වීම් වාර්තාව අනුව ආයතනයේ නිලධාරීන්ට අදාළ තනතුරට හිමි වැටුප් හා දීමනාවලට අමතරව වෙනත් දීමනාවක් ලබා ගැනීමට හිමිකම නොතිබුණ ද, 2017 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් විශේෂ දීමනාව වශයෙන් රු.438,428ක් ද ගොවි විශ්‍රාම වැටුප් විශේෂ දීමනා වශයෙන් රු.812,250 ක්ද රක්ෂණ කොමිස් හා දිරිදීමනා ලෙස රු.11,995,426 ක්ද එම නියෝගයට පටහැනිව ගෙවා තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මානව සම්පත් කළමනාකරණය | පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) වන්දි ගෙවීම | (i). ප්‍රමාදයකින් තොරව වන්දි ගෙවීමට කටයුතු නොකිරීම. |

11

| | | |
|---|---|---|
| | | (ii). චන්දි ගෙවීමේදී පුද්ගලයන් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | රක්ෂණය | (i). කන්නය ආරම්භයත් සමග රක්ෂණය සඳහා කටයුතු නොකිරීම. |
| | | (ii). වගා රක්ෂණයට ගොවීන් නැඹුරු කිරීම සඳහා වැඩසටහන් දියත් කිරීමට කටයුතු නොකිරීම |
| (ඈ) | ලැබිය යුතු ගිණුම් | ණය හා අත්තිකාරම් අය කරගැනීමට කටයුතු නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ජීපීඑල්/ටී/එෆ්පීඑස්/01/17/04

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය 2018 ජූලි 12 දින

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

DG

පිටපත - 1. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය

2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒජීඑල්/ඊ/එෆ්පීඑස්/01/17/04 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 ජූලි 12 දින

සභාපති,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මේ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් 2018 අප්‍රේල් 11 දින මණ්ඩලයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

**1.3 විගණකගේ වගකීම**

----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් ප්‍රකාශනයේ, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය ව්‍යාවනය**

--------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------

**2.2.1 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම**

-------------------------------------

2016 හා 2017 වර්ෂ වලදී ගොවි දායකත්ව ආදායම පිළිවෙලින් රු. 35,198,320 ක් හා රු. 29,381,645 ක් වූ අතර විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිවෙලින් රු. 2,611,078,145 ක් හා රු. 2,616,581,105 ක් වී තිබුණි. ගොවි දායකත්වයට එරෙහිව විශ්‍රාම වැටුප් ගෙවීම් ඉහළ යාම නිසා 2016 හා 2017 වර්ෂ වලදී පිළිවෙලින් රු. 2,450,000,000 ක් හා රු. 2,520,000,000 ක් භාණ්ඩාගාරය මගින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වැය කර තිබුණි. ඒ අනුව භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතී.

එසේම සමාලෝචිත වර්ෂය අවසානයට යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් වගකීම රු.63,220,697,989 ක් වූ අතර එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 6.1 ක වැඩි වීමකි. එසේම යෝජනා ක්‍රමයේ ශුද්ධ වත්කම් රු.67,771,138,975 ක සෘණ අගයක් වී තිබුණි. ඒ සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 අනුව ආයුගණක තක්සේරුව, 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම හා පැරණි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය අනුව දායක මුදල් අයකිරීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ඒ අනුව මෙම අහිතකර මූල්‍ය තත්ත්වය ඉදිරියේදී තවදුරටත් වර්ධනය විය හැකි බැවින්ද මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බවට ආයතනය විසින් තහවුරු කර නොමැති බැවින්ද යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

**2.2.2 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම**

---------------------------------------------------------

මණ්ඩලය යටතේ පවතින කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයට සමූහ ජීවිත රක්ෂණ වෙනුවෙන් ගෙවිය යුතු රු.194,619,125 ක වටිනාකම පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු ගිණුම් සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

-----------------------------------

ප්‍රමිතයේ 79 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.2,102,060 ක්වූ මෝටර් රථ සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද ඒවා තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි.ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

-----------------------------------

(i). ප්‍රමිතයේ 59 වන ඡේදය ප්‍රකාරව සක්‍රිය දායකයන් හා ගොවි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් සඳහාම සමාලෝචනය කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව එය සිදුකර නොතිබුණි. ඒ අනුව විශ්‍රාම වැටුප් වගකීම සඳහා වෙන්කිරීමේ දී ඒ සඳහා සැලකිය යුතු බලපෑමක් කළ හැකි පොළී අනුපාතය, බඳවා ගැනීම්, ඉවත්වීම්, මරණ, අබලතාවයන් වැනි මූලික සංරචකයන් සහ සක්‍රිය දායකයන්ගේ සහ ගොවි විශ්‍රාමිකයන්ගේ වෙනස්වීම් කෙරෙහි සැලකිල්ලක් දක්වා නොතිබීම හේතුවෙන් 2007 වර්ෂයේදී රු.29,473,158,000 ක් වූ ප්‍රතිපාදනය 2017 වර්ෂයේදී රු.63,220.697,989 ක් දක්වා එනම් සියයට 115 කින් වැඩිවී තිබුණි.

(ii). 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනත අනුව වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු වුවද ඊට පටහැනිව විශ්‍රාම වැටුප සකස් කළ දින සිට ගෙවීම් සිදු කර තිබුණි. 2017 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලය තුල ගොවීන් 9,927 දෙනෙකු විශ්‍රාම වැටුප් ඉල්ලුම් කර තිබුණු අතර ඔවුන් වෙනුවෙන් නොගෙවූ හිඟ මුදල් එකතුව රු.244,034,838 ක් වී තිබුණි. එසේ වුවද ප්‍රමිතයේ 14 වන ඡේදය ප්‍රකාරව ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන වල කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි.

### 2.2.4 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-----------------------

ප්‍රාග්ධන ප්‍රදාන වත්කමේ ඵලදායී ජීවිත කාලය තුල ක්‍රමානුකූල පදනමකින් ආදායමට බැරකිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වුවද 1989 වර්ෂයට පෙර එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් ලැබී තිබුණු රු.547,885 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.3,295,285 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු තුල ඇතුළත් 1997 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අයත් විගණන ගාස්තු සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයන්හි ජංගම වගකීම් යටතේ දක්වා ඇති රු.3,257,634,369 ක ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ශේෂය තුළ 2012 සහ 2013 වර්ෂ වෙනුවෙන් ගොවීන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් එකතුව රු.3,033,329,200 ක් ඇතුළත්ව තිබුණු අතර එම වටිනාකම නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් හා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයෙන් 2010 හා 2011 වර්ෂවල දී පිළිවෙලින් රු.518,000,000 හා රු.295,230,441 ක ණය මුදලක් ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ අනුව එම ණය සඳහා පොළියද ඇතුළත්ව ජංගම වගකීම් යටතේ පිළිවෙලින් රු. 663,905,406 ක් හා රු.398,274,007 ක් ලෙස දක්වා තිබුණි. එසේ වුවද එම ණය වෙනුවෙන් අයකරන පොළී ප්‍රතිශතය, ආපසු ගෙවිය යුතු කාලය, ණය මුදල ආවරණය වන වාරික ගණන , වාරිකයක වටිනාකම ආදී කොන්දේසි ඇතුළත් කර ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත. | |
| (අ) 15 (2),(3) වගන්ති | පනතේ විධිවිධාන ප්‍රකාරව වාරික ගෙවීම් පැහැර හරින සාමාජිකයන්ගේ සාමාජිකත්වය අහෝසි කිරීම සම්බන්ධයෙන් අදාල සාමාජිකයාට දැනුම් දීමට කටයුතු කර නොතිබුණු අතර ඒ හේතුවෙන් අවලංගු වූ සහතිකයක් නැවත වලංගු කරවා ගැනීමට දායකයෙකුට ඇති අයිතිය ද උල්ලංඝණය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී වාරික ගෙවීම් පැහැර හරින ලද සාමාජිකයන් 3024 ක් වෙනුවෙන් ශුද්ධ වාරික වශයෙන් රු.18,839,792 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. |
| (ආ) 20 වගන්තිය | උපදේශක කමිටුව සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සංයුක්ත විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී සාමාජිකයන් 10 දෙනෙකු පමණක් පත්කර තිබූ අතර එක් රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි . |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 42,640,061 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 74,030,438 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.31,390,377 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ආදායම රු.13,159,679 කින් අඩු වී වියදම රු.26,471,566 කින් වැඩි වී තිබුණ ද රජයෙන් ලබා දෙන ලද ප්‍රදානය රු.70,000,000 කින් වැඩි වීම මෙම ඌනතාවයේ අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූලා ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ ඌනතාවය 2014 වර්ෂයේදී අතිරික්තයක් බවට පත්ව නැවත 2015 වර්ෂයේ සිට මූලා ඌනතාවයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද මූලා ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදි රු. 1,678,119,540ක් වූ සෘණ දායකත්වය 2014 සිට 2017 වර්ෂය දක්වා පිළිවෙලින් රු. 74,364,024 ක් රු (159,604,332 ) රු. 20,328,449 ක් හා රු. 54,958,066 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි වර්ෂය තුළ දී ගොවීන් 700 ක් බඳවා ගැනීම හා ඔවුන්ගෙන් රු.1,106,400 ක දායක මුදල් ලබාගැනීමට සැලසුම් කර තිබුණ නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

ආයතනයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනතේ 4 වන වගන්තිය අනුව නියමිත සුදුසුකම් දරන්නාවූ ද වයස අවු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 59 නොවැඩි යම් ගොවියෙකු මෙම යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම ඇති බව දක්වා ඇතත්, 2012 වර්ෂය අවසන් වනවිට යෝජනා ක්‍රමයේ සක්‍රීය ගොවීන් සංඛ්‍යාව 959,254 ක් වූ අතර, ඉන් පසුව කිසිදු සාමාජිකයෙකු යෝජනා ක්‍රමයට බඳවාගෙන සාමාජිකත්වය වර්ධනය කර ගැනීමට ප්‍රමාණවත් හා විධිමත් වූ ක්‍රමවේදයක් අනුගමනය කිරීමට ආයතනය කටයුතු කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දී ඉල්ලා අස්වීම්, මරණ, බෙලහීන හා වාරික නොගෙවීම් මත යෝජනා ක්‍රමයෙන් ගොවීන් 3,025 ක් අඩු වී තිබුණ ද 2012 වර්ෂයෙන් පසු තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන නොයාම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සක්‍රීය සමාජික සංඛ්‍යාව කොපමණද යන්න තහවුරු කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ආ) 2012 වර්ෂයෙන් පසු සාමාජිකයින්ගේ වාරික මුදල් අයකිරීම්, සාමාජිකත්වය අහෝසි කිරීම්, ප්‍රතිලාභ ලබා දීම් හා ගොවියන්ගේ පෞද්ගලික තොරතුරු ආදිය පරිගණක පද්ධතියේ නිසි පරිදි යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් යෝජනා ක්‍රමයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා තොරතුරු ලබා ගැනීමට හැකියාවක් නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව 2014 ජනවාරි 01 දින සිට නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැරණි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අනුව දායක මුදල් අයකර විශ්‍රාම වැටුප් ගෙවීම් නව යෝජනා ක්‍රමය අනුව සිදුකරමින් පැවතුණි. මෙම තත්ත්වය මත 2014 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රු.7,664,298,940 ක විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර තිබූ අතර රු.92,443,207 ක් පමණක් දායකත්වය වශයෙන් අය වී තිබුණි.මෙම යෝජනාක්‍රමයේ ඉදිරි පැවැත්ම උදෙසා නව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට හෝ සංශෝධනය කර එය ක්‍රියාවට නැංවීමට 2018 මැයි 30 දින වන විටත් කළමණාකරණය අපොහොසත් වී තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායකත්වය ලබාගැනීමේ හා ප්‍රතිලාභ ලබාගැනීමේ වයස පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ආයතනය විසින් පවත්වා ගෙන ගොස් නොතිබීම හේතුවෙන් වයස අවුරුදු 61 ත් 68 ත් අතර කාලය තුල අයදුම්කරුවන් 10 දෙනෙකු දායකත්ව අයදුම්පත් ඉදිරිපත් කර තිබුණු බව කලුතර දිස්ත්‍රික් කාර්යාල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) විශ්‍රාම වැටුප් ගෙවීම් අයදුම්පත් 50 ක නියැදියක් පරීක්ෂාවේදී ඉන් අයදුම්පත් 08 ක් ඒවා ඉදිරිපත් කල දින සිට ගෙවීම් සිදු කිරීම සඳහා මාස 07 සිට වර්ෂ 02 කට වැඩි කාලයක් ගත කල අවස්ථා පැවති බව නිරීක්ෂණය විය. } Delays.

(ඈ) යෝජනා ක්‍රමය සඳහා දායකත්වය ලත් දායකයින්වෙත පිරිනමනු ලබන ඔප්පුව අනුව දායකයා වයස අවුරුදු 80 ට පෙර මියගියහොත් ඔහුගේ අසූවෙනි උපන් දිනය යෙදෙන මාසය දක්වා කලත්‍රයාට විශ්‍රාම වැටුප් හිමිවන බව දක්වා තිබුණද 2014 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් දක්වා කලත්‍රයා හිමිකම් ඉල්ලුම් කල අයදුම්පත් කොපමණ ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලය වෙත ලැබී තිබේද යන්න පිළිබඳ සංඛ්‍යාමය දත්තයන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් කාර්යාල වලින් විශ්‍රාම වැටුප් අංශයට විශ්‍රාම වැටුප් ඉල්ලුම්පත් 6,680 ක් ලැබී තිබූ අතර ඉන් 4,917 කට පමණක් විසඳුම් ලබා දී තිබුණි. නුවර හා මාතලේ දිස්ත්‍රික්කයන්හි විශ්‍රාම වැටුප් ඉල්ලීම් 584 ක් සඳහා කිසිදු තීරණයක් ලබා දී නොතිබුණි.

(ඊ) හිමිකම් නොපාන ලද විශ්‍රාම වැටුප් ඊට පසුව එළඹෙන මාසයේ පළමුවන දින මණ්ඩලය වෙත නැවත එවිය යුතු වුවද, කළමනාකරණය විසින් ඒ පිළිබඳ පසු විපරම් කටයුතු සිදුනොකිරීම හේතුවෙන් නොගෙවන ලද විශ්‍රාම වැටුප් එකතුව රු.10,997,732 ක් මාස 03 කට වැඩි කාලයක් නිෂ්කාර්යව බාහිර තැපැල් කාර්යාලවල රඳවා පැවති බව නිරීක්ෂණය විය.

(උ) බැංකු ගිණුම් 03 කට අදාලව 1992 වර්ෂයේ සිට පැවත එන තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.1,179,624 ක් වටිනා චෙක්පත් 117 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2015 ජනවාරි 28 දිනැති ලිපිය අනුව 2014 ජනවාරි සිට ක්‍රියාත්මක වූ නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකයන්ගේ ජීව දත්ත පිළිබඳ සමීක්ෂණ කටයුතු දිස්ත්‍රික් කාර්යාල විසින් 2015 පෙබරවාරි 28 දිනට පෙර සම්පූර්ණ කළ යුතු වුවද, දිස්ත්‍රික් කාර්යාල 25 න් 14 ක සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. පරිගණක පද්ධතිය සකස් කිරීමට ආසන්න වශයෙන් රු.2,705,000 ක් ද සමීක්ෂණය සඳහා සහභාගි වූ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් වෙත දිරිදීමනා හා වෙනත් වියදම් ලෙස රු.1,726,875 ක මුදලක් වැය කර තිබුණ ද සමීක්ෂණය සම්පූර්ණ කර නොතිබීම හා ලැබෙන තොරතුරු මත පදනම්ව පද්ධතිය යාවත්කාලීන කර නොතිබීම නිසා ඒ වෙනුවෙන් දරන ලද වියදම නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් නොපාන අවස්ථාවලදී එසේ හිමිකම් නොපෑමට හේතු සොයා බැලීමකින් තොරව මාස 07 සිට 11 දක්වා වාර ප්‍රමාණයක් දිසා ගිණුම් කාර්යාල වෙත නැවත නැවත යවා තිබුණි. හිමිකම් නොපාන ලද විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් වෙත වාර තුනකට වඩා වැඩි වාර ගණන් ගෙවීම් චෙක්පත් යැවීමට සිදුවීමේදී එයට හේතු සොයා කටයුතු කිරීමට දිස්ත්‍රික් කාර්යාල හෝ මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2015 වර්ෂයේ මාතර දිස්ත්‍රික්ක ගොවි විශ්‍රාම වැටුප් සමීක්ෂණයට සම්බන්ධ වූ ගොවිජන මධ්‍යස්ථාන 22 ක කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ට ගෙවීමට නියමිත රු.120,850 ක දිරිදීමනා එම නිලධාරීන්ට නොගෙවා අනුමැතියකින් තොරව මාතර දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් මාතර දිස්ත්‍රික් සහකාර කොමසාරිස්ට රු. 15,000 ක්ද ගොවිජන සේවා මධ්‍යස්ථාන සංවර්ධන නිලධාරීන් 22 දෙදෙනකු සඳහා රු. 4000 බැගින් රු. 88,000 ක්ද වශයෙන් ගෙවා තිබුණි. ඉතිරිව පැවති රු.17,850 ක මුදල 2017 ඔක්තෝබර් 25 වන විගණන දින වන විටද දිස්ත්‍රික් කාර්යාලයට පියවා නොතිබුණි. එමෙන්ම රු.17,850 ක් 2015 දෙසැම්බර් 21 දින කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ට ගෙවීම සඳහා දිස්ත්‍රික් කාර්යාලයෙන් ලබාගෙන තිබුණ ද එය නිලධාරීන්ට ගෙවූ බවට කිසිදු තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

5. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් වීම මත ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය විසින් සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු අරමුණු වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු වන දරිද්‍රතාවය එහි සෑම ආකාරයකින්ම සෑම තැනකින්ම අවසන් කිරීම සඳහා ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන තිබුණ ද, එහි විෂය පථයට ගැනෙන 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරණ ගැසට් පත්‍රය මඟින් නව යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාවට නැංවීම සඳහා කර තිබූ සංශෝධනයන් සම්පූර්ණයෙන්ම ක්‍රියාවට නැංවීම ආයතනය කටයුතු කර නොතිබුණි. එසේ හෙයින් යෝජනා ක්‍රමයේ සංශෝධන මඟින් ලඟා කර ගැනීමට අපේක්ෂා කරන ලද ඉලක්ක ඉටු කර ගැනීමට හැකි වී නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යෝජනා ක්‍රමයේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, සමාජ සවිබල ගැන්වීමේ හා සුබසාධන අමාත්‍යාංශය,

මුදල් අමාත්‍යාංශය, ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය, ගොවි සංවිධාන හා ගොවීන් යනාදී පාර්ශවයන් හඳුනාගත හැකි වුවද නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයක් සැකසීමට 2016 සැප්තැම්බර් 13 දින ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා "නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ඇති කිරීමට මූල්‍යමය වශයෙන් ස්ථාවර හා තිරසර යෝජනාවක් ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස " 2016 ඔක්තෝබර් 26 දින අමාත්‍ය මණ්ඩල තීරණයෙන් යෝජනා කර තිබුණ ද 2018 ජූනි විගණන අවස්ථාව වන විටත් ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) නිවැරදි කාර්යසාධනයක් මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සඳහා සාමාජිකයන්ගේ ජීව දත්ත පිළිබඳ සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සමීක්ෂණයක් කර නොතිබීම, 2015 වර්ෂයේ කරන ලද සමීක්ෂණ කටයුතු නිසි ලෙස කළමනාකරණය නොකිරීම, 2007 වර්ෂයෙන් පසු සක්‍රිය ගොවි දායකයින් පිළිබඳ ආයුගණක තක්සේරුවක් කර යන කරුණු හේතු වී ඇති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ඈ) තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට සූදානම් වීමේදී මණ්ඩලය සමඟ බැඳී පවතින අනෙකුත් ආයතන වන දිසා ගිණුම් කාර්යාල, ගොවිජන සේවා මධ්‍යස්ථාන, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාමීය බැංකු සමඟ මනා සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ලඟා වීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

### 6.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 18 සිට සියයට 81 අතර විචලනයන් වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6.2 සමාජ වගකීම ඉටුකිරීම

ශ්‍රී ලංකාවේ ගොවිතැන් කටයුතු වල නිරතවන ගොවි ජනතාව වයස්ගත වූ විට හෝ බෙලහීනතාවයට පත් වූ විට හෝ අකල් මරණයකට පත් වූ විටක මුහුණ පෑමට සිදුවන සමාජ සහ ආර්ථික ගැටළු වලදී යම් සහනයක් ලබාදීමට මෙම යෝජනා ක්‍රමය හඳුන්වා දී තිබුණි. මෙම යෝජනා ක්‍රමයට බැඳුනු ගොවීන්ට ආයතනයෙන් ලබාදිය යුතු සේවාව කාර්යක්ෂමව, ඵලදායිව හා අපේක්ෂා කළ පරිදි ඉටුනොවීමේ තත්වයක් පවතින බව පහත කරුණු අනුව අනාවරණය විය.

(අ) ගොවි විශ්‍රාම වැටුප් අංශයට දිස්ත්‍රික් කාර්යාල 29 න් ලද ශුද්ධ වාරික අයදුම්පත්‍ර වලින් 2016 වර්ෂයේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත් 466 කට හා 2017 වර්ෂයේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත් 217 කට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෙවීම් කර නොතිබුණි. එසේම පරීක්ෂා කළ නියැදියට අනුව (2017 අගෝස්තු හා දෙසැම්බර්) දිස්ත්‍රික් කාර්යාල වලින් ලද ශුද්ධ වාරික ගෙවීම් ගණනය කිරීම සඳහා වර්ෂ 2 ½ ත් 5 ½ ත් අතර වූ කාල පරාසයක ප්‍රමාදයන් සිදු වී තිබුණි.

(ආ) 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 13(2) (ආ) ඡේදය පරිදි දායකයාට ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුපෙන් එක් එක් මාසයේදී රු. 50 ක මුදලක් අඩුකර තිබුණ ද මෙම මුදලින් ගනු ලබන ක්‍රියාමාර්ග ගැසට්පත්‍රය මගින් අනාවරණය කර නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මූල්‍ය පාලනය | හිමිකම් නොපාන ලද විශ්‍රාම වැටුප් ප්‍රමාදයකින් තොරව ආපසු ගෙන්වා නොගැනීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දායක මුදල් රැස්කිරීම, ගෙවීම හා ගිණුම්ගත කිරීම | (i). | දායක වාරික ගෙවීම් පැහැර හරින සාමාජිකයන් දැනුවත් කර සාමාජිකත්වය අහෝසි වීම වැළැක්වීමට කටයුතු නොකිරීම. |
| | | (ii). | පරිගණක පද්ධතිය නිසි පරිදි යාවත්කාලීන කර යෝජනා ක්‍රමයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා තොරතුරු ලබා ගැනීමට කටයුතු නොකිරීම. |
| | | (iii). | ශුද්ධ වාරික ගෙවීම් ඉල්ලුම්පත් සැකසීම කාල ප්‍රමාදයකින් තොරව සිදු නොකිරීම. |

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

C-006

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඒජීඑල්/ඊ/එෆ්අයිඑස්එච්/ 01/17/03 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2018 ජුනි 20 දින | | |

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

පිටපත් : 1. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය.

2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

...ාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒපීඑල්/ඊ/එෆ්අයිඑස්එච්/01/17/03 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය } 2018 ජුනි 20 දින

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2018 මාර්තු 23 දින මණ්ඩලයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

යෝජනා ක්‍රමයේ සමාලෝචිත වර්ෂය අවසානයට ධීවර විශ්‍රාම වැටුප් වගකීම රු.3,297,559,198 ක් වූ අතර එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 8.8 ක වැඩි වීමකි. එසේම යෝජනා ක්‍රමයේ මුළු ශුද්ධ වත්කම් රු.2,631,291,860 ක සෘණ අගයක් වී තිබුණි. එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 9.9 ක වැඩිවීමකි. ඒ අනුව මෙම අහිතකර මූල්‍ය තත්ත්වය ඉදිරියේදී තවදුරටත් වර්ධනය විය හැකි බැවින්ද මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ප්‍රතිඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බවට ආයතනය විසින් තහවරු කර නොමැති බැවින්ද යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත තත්වයක පවතින බව නිරීක්ෂණය විය.

**2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

2017 දෙසැම්බර් 31 දිනට රු.663,955,406 ක් වූ ලැබිය යුතු ණය ශේෂය ප්‍රමිතයේ 64 ඡේදය ප්‍රකාරව ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

ප්‍රමිතයේ 59 ඡේදය ප්‍රකාරව සක්‍රිය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් සඳහාම සමාලෝචනය කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව එය සිදුකර නොතිබුණි. ඒ අනුව විශ්‍රාම වැටුප් වගකීම සඳහා වෙන්කිරීමේ දී ඒ සඳහා සැලකිය යුතු බලපෑමක් කළ හැකි පොළී අනුපාතය, බඳවා ගැනීම්, ඉවත්වීම්, මරණ, අබලතාවයන් වැනි මූලික සංරචකයන් සහ සක්‍රිය දායකයන්ගේ සහ ධීවර විශ්‍රාමිකයන්ගේ වෙනස්වීම් කෙරෙහි සැලකිල්ලක් දක්වා නොතිබීම හේතුවෙන් 2007 වර්ෂයේදී 54,248 ක් වූ සක්‍රිය දායකයන් හා විශ්‍රාමලාභීන් සංඛ්‍යාව 2017 වර්ෂයේදී 29,472 ක් දක්වා එනම් සියයට 46 කින් අඩුවී තිබූ නමුත් එම කාලයට අදාළ ප්‍රතිපාදනය රු.1,242,006,539 සිට රු.3,297,559,198 දක්වා එනම් සියයට 166 කින් වැඩිවී තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

යෝජනා ක්‍රමය මගින් ගොවි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ලබා දී තිබූ රු.518,000,000 ක ණය සහ ඒ මත අයකරන රු.330,905,406 ක් වූ ණය පොලිය ආදි කොන්දේසි ඇතුළත් ගිවිසුම විගණනයට ඉදිරිපත් කිරීමට ආයතනය අපොහොසත් වූ අතර ඒ හේතුවෙන් එම ගනුදෙනුවේ නිවැරදිභාවය හා සම්පූර්ණත්වය තහවුරු කර ගැනීමට නොහැකි විය .

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,417,697 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු නිරවුල් කිරීමෙන් තොරව 1998 වර්ෂයේ සිට අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ආ) ගෙවිය යුතු මුද්‍රණ වියදම් සඳහා වාර්ෂිකව වෙන් කර තිබූ එකතුව රු.515,000 ක් වූ මුදල නිරවුල් කිරීමෙන් තොරව 2011 වර්ෂයේ සිට ගිණුම්වල අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ඇ) 2007 වර්ෂයේ සිට ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා අවස්ථා කිහිපයක දී ලබා දී තිබූ ණය සඳහා 2017 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.663,955,406 ක් වූ ණය සහ පොලිය අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

## 2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත** | |
| (i) 16 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව සාමාජික ගාස්තු ගෙවීම පැහැර හරින ලද සාමාජිකයන්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාළ සාමාජිකයන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් අවලංගු වූ සාමාජිකත්වය නැවත වලංගු කරවා ගැනීමට දායකයෙකුට ඇති අයිතිය ද අහිමි වී තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතුවලින් රු.28,891,442 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,420,592 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.26,470,850 ක එනම් සියයට 1094 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ලංකා බැංකුවට එරෙහිව පවරා තිබූ නඩුවක් මණ්ඩලයට වාසි සහගත ලෙස තීරණය වීමෙන් ලැබිය යුතුව තිබූ මුදලින් කොටසක් වන රු.37,672,911 ක් මණ්ඩලයට ලැබීම ඉහත අතිරික්තය ඇති වීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.12,194,196 ක අතිරික්තයක් ඇති වී තිබූ නමුත් 2014 හා 2015 වර්ෂවල දී එය ක්‍රමයෙන් පිරිහී තිබූ අතර පිළිවෙලින් රු. 7,170,305 ක හා රු.15,147,293 ක ඌනතාවයක් ඇති වී

තිබුණි. එහෙත් 2016 හා 2017 වර්ෂවලදී නැවතත් අතිරික්තයක් ඇති වී තිබූ අතර එය 2017 වර්ෂයේ දී රු.28,891,442 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද ඉහත මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේ දී 2013 වර්ෂයේ රු.14,622,327 ක් වූ දායකත්වය 2014 හා 2015 වර්ෂයන්හිදී පිළිවෙලින් රු. 4,358,373 ක හා රු.11,983,314 ක සෘණ අගයක් දක්වා පිරිහී තිබූ නමුත් 2016 හා 2017 වර්ෂයන්හිදී නැවතත් පිළිවෙලින් රු.5,601,658 ක් හා රු.32,281,870 ක් දක්වා යෝජනා ක්‍රමයේ දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2017<br>රු. | 2016<br>රු. | වෙනස්වීම වැඩිවීම / (අඩුවීම)<br>% |
|---|---|---|---|
| ආදායම | | | |
| පොලී ආදායම | 58,753,600 | 63,046,648 | (7) |
| ධීවරයින්ගේ දායක මුදල | 920,022 | 928,732 | (1) |
| පුනරාවර්තන වියදම් සඳහා ප්‍රදාන | 1,500,000 | 1,500,000 | - |
| වෙනත් ආදායම් | 37,672,911 | | 100 |
| **මුළු ආදායම** | **98,846,533** | **65,475,380** | 51 |
| අඩුකලා - වියදම් | | | |
| විශ්‍රාම ගෙවීම් | (59,897,422) | (53,821,700) | 11 |
| වෙනත් මෙහෙයුම් වියදම් | (3,865,686) | (4,148,448) | (7) |
| පරිපාලන හා මූල්‍ය වියදම් | (6,191,984) | (5,084,640) | 22 |
| **මුළු වියදම** | **(69,955,092)** | **(63,054,788)** | 11 |
| **වර්ෂය සඳහා ලාභය (පාඩුව)** | **28,891,441** | **2,420,592** | |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මුළු දායකය රු.920,022 ක් වූ නමුත් මුළු විශ්‍රාම වැටුප් ගෙවීම් රු.59,897,422 ක්, ශුද්ධ වාරික ගෙවීම් රු.1,354,615 ක් හා මරණ බෙලහීන ප්‍රතිලාභ ගෙවීම රු.463,800 ක් වූයෙන් දායකය ඉක්මවා ගෙවීම් රු.60,795,815 ක් හෙවත් සියයට 6,608 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ ධීවරයින්ගේ දායක මුදල් සියයට එකකින් අඩු වී ඇති අතර මුළු විශ්‍රාම වැටුප් ගෙවීම් සියයට 11 කින් ද විශ්‍රාම වැටුප් වගකීම සියයට 8.8 කින් ද වැඩි වී තිබුණි.

(ආ) යෝජනා ක්‍රමයේ ප්‍රධාන ආදායම ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ දායක මුදල විය යුතු වුවත් ප්‍රධාන ආදායම, සමාලෝචිත වර්ෂයේදී පොලී ආදායමින් සියයට 55 ක් එනම් රු.54,394,779 ක් ගොවි යෝජනා ක්‍රමය වෙත ලබාදී තිබුණු ණය මත අයකල පොලී ආදායමින් සමන්විත වී තිබුණි.

(ඇ) අයවැය ඇස්තමේන්තු අනුව සමාලෝචිත වර්ෂය තුළදී යෝජනා ක්‍රමයට නව දායකයින් 100 ක් බඳවා ගැනීමට ඇස්තමේන්තු කළ ද දායකයින් 109 දෙනෙක් බඳවා ගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය තුළදී දායකයින් 144 දෙනෙකු යෝජනා ක්‍රමයෙන් ඉවත් වී තිබුණි.

### 3.3 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධීන්

මණ්ඩලය විසින් 1996 වර්ෂයේදී භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද ආයෝජනයන් කල්පිරීමේදී ලංකා බැංකුව වරදවා කටයුතු කිරීම මත ධීවර විශ්‍රාම වැටුප් අරමුදලට අහිමි වූ පොළිය අය කර ගැනීම සඳහා එම බැංකුවට එරෙහිව මණ්ඩලය විසින් නඩු පවරා තිබුණි. ඒ සඳහා 2003 ඔක්තෝම්බර් 07 දින නඩු ගාස්තුවද ඇතුලත්ව අහිමි වූ පොළිය හා මුදල් මණ්ඩලයට ලබාදීමට දිසා අධිකරණය විසින් ලබාදුන් තීන්දුවම 2015 අගෝස්තු 14 දින අභියාචනාධිකරණය මගින්ද ලබා දී තිබුණි. මණ්ඩලයේ ගණනය කිරීමට අනුව, 2017 මාර්තු 31 දිනට ලංකා බැංකුවෙන් ලැබිය යුතු මුදල රු.103,248,251 ක් ව පැවතුන අතර 2017 පෙබරවාරි 17 දින රු.31,618,396 ක් හා 2017 අප්‍රේල් 07 වන දින රු.6,054,515 ක් ලෙස එකතුව රු.37,672,911 ක් පමණක් බැංකුව විසින් ගෙවා තිබුණි. දෙන ලද තීන්දුව ක්‍රියාත්මක කරවා ගැනීමට කළමනාකරණය ප්‍රමාද වීම හා කාලීනව අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ඉතිරි මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් නැවතත් 2017 ජූලි 25 දින ආයතනය විසින් ලංකා බැංකුවට එරෙහිව නඩු පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ධීවරයින්ගේ මහලු වයසේ දී හෝ දුබලතාවයක දී ධීවරයන්ට සමාජ ආරක්ෂණය සැලසීම, ධීවරයකු මියගිය විට එම ධීවරයාගේ යැපෙන්නන්ට සහන සැලසීම, තම ජීවනෝපායෙහි දිගටම නියැලීම සඳහා ධීවරයන් උනන්දු කරවීම, තරුණ අය ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම, ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩි දියුණු කිරීම යන පරමාර්ථ ඉටු කිරීම පිණිස ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ස්ථාපිත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 – 2016 සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේ දී 2014 වර්ෂයෙන් පසු අරමුදල ක්ෂය වන තත්ත්වයක් ආරම්භ වී 2020 දී එය ශුන්‍ය වන තත්ත්වයක් පවතින බැවින් එය ප්‍රතිසංවිධානය කළ යුතු බව කළමනාකරණය විසින් හඳුනාගෙන වර්ෂ 03 ක් ඉක්ම ගොස් තිබුනද කිසිදු ප්‍රතිසංවිධාන කටයුත්තක් සිදු කිරීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) තම ජීවනෝපායෙහි දිගට ම නියැලීම සඳහා ධීවරයන් උනන්දු කරවීම, තරුණ අය ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම, ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩි දියුණු කිරීම යන පරමාර්ථ ඉටු කිරීම සම්බන්ධයෙන් යෝජනා ක්‍රමයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ දායකයින්ගෙන් රු.3,684,000 ක දායක මුදල් ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණද, තථ්‍ය දායක මුදල් ලැබීම් රු.920,022 ක් පමණක් විය.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

දායක ප්‍රතිලාභ ගෙවීම ප්‍රමාද වීම, ධීවරයින් යෝජනා ක්‍රමයෙන් අපේක්ෂා කළ ප්‍රතිලාභ අනපේක්ෂිතව අහිමි වීම, දායකයින් පිළිබඳ තොරතුරු යාවත්කාලීන නොවීම, බඳවා ගැනීම ක්‍රමයෙන් හීන වීම තුලින් කර්මාන්තය තුළට යොමු කරවීමේ අඩු ප්‍රවණතාව හා ඉතිරි කිරීමේ පුරුද්ද අහිමි වී යාම යනාදිය හේතුවෙන් ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් ධීවර ජනතාවට ලබා දිය යුතු සේවාව කාර්යක්ෂමව, ඵලදායීව හා අපේක්ෂා කළ පරිදි ඉටුනොවීමේ තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 34 සිට සියයට110 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01 /2014 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. අරමුදලේ පැවැත්ම කෙරෙහි අවිනිශ්චිත තත්ත්වයක් ඇතිවෙමින් තිබියදීත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල නොකිරීමෙන් ඇතිවිය හැකි තත්ත්වයට මුහුණ දීමට ආයතනය තුළ කිසිදු සූදානමක් හෝ සැලැස්මක් නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | දායක මුදල් කළමනාකරණය | ගෙවීමට යවන ලද විශ්‍රාම වැටුප් වලින් නොගෙවා ඉතිරිවන මුදල් කාලීනව නැවත ගෙන්වා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) | කළමනාකරණ තොරතුරු පද්ධතිය | (i) ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් කාර්යාල හරහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර විශ්‍රාම වැටුප් අංශය තුළ ලේඛණගත නොකරන බැවින් වර්ෂය තුල ලද ඉල්ලුම් පත්‍ර ප්‍රමාණය, දැනට පිළියෙල කර ඇති ප්‍රමාණය, පිළියෙල කිරීමට ඇති ප්‍රමාණය පහසුවෙන් හඳුනාගත හැකි ක්‍රමවේදයක් නොතිබීම. |

(ii) තොරතුරු ලේඛණගත නොකිරීම හේතුවෙන් වර්ෂය තුළ ලද සමස්ත ඉල්ලුම් පත්‍ර ප්‍රමාණය අතුරින් විශ්‍රාම වැටුප් ගෙවීම, ශුද්ධ වාරික ගෙවීම්, මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම් ලෙස වෙන් කර ඇති ප්‍රමාණයන් පහසුවෙන් හඳුනා ගෙන ඒ පිළිබඳ විශ්ලේෂණය කිරීමට නොහැකි වීම.

(iii) ජීව දත්ත තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන නොයාම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

Answer .

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
**AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD**

විදුලි පණිවිඩ / தந்தி / Telegrams } රක්ෂණ / ரக்ஷன / Rakshana

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd, Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. } 2017/4/5/මු/ර/2
ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. }
දිනය / திகதி / Date } 2018.07.05

විගණන අධිකාරී,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

2017 වර්ෂයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.

2017 වර්ෂයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14(2)(C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමග ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

| | සභාපති / தலைவர் | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 011-2812571 | 011-5732397 | 011-5384000 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011-2812572<br>011-2812573 | 011-2812574 | |

**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම**

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ස්ථාවර වත්කම් ගිණුම් ගත කිරීමේදී මණ්ඩලයේ ප්‍රතිපත්තිය වන්නේ පිරිවැය අගය මත වත්කම් ගිණුම්ගත කිරීමයි. ඒ අනුව සියළුම ස්ථාවර වත්කම් නිසි පරිදි ගිණුම් ගත කර ඇත.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18**

ගොවීන්ගේ සියළු නිශ්චල හා චංචල දේපල රක්ෂණයන්ට අදාල ආදායම් කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ දක්වා ඇති අතර, එක් එක් රක්ෂණයන්ගේ ආදායම් විස්තර උපලේඛණ මගින් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37**

ගොවීන්ගේ මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම සඳහා වෙන් කිරීම ගොවි විශ්‍රාම වැටුප් අරමුදල මගින් ගණනය කොට ගොවීන්ගේ මරණ හා බෙලහීන පාරිතෝෂික අරමුදලට බැර කරන අතර, ඊට අදාල තොරතුරු ජ'නල් සටහන් අංක 12 මගින් අනාවරණය කර ඇත.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

මෙම රථය ඉදිරි වර්ෂයේදී දේපල පිරියත උපකරණ යටතේ ගිණුම්තුල ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ)** මණ්ඩලයේ සේවයෙන් ඉවත් වී ගිය/ විශ්‍රාම ගිය නිළධාරීන්ගේ, ගෙවීම් පැහැර හැර ඇති ණය ශේෂයන් හා පොළී මුදල් අයකර ගැනීම සඳහා එන්තරවාසි යවා ඇති අතර, ඒ අනුව ගෙවීම් නොකලහොත් ඉදිරියේදී ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. තවද, මෙසේ පැහැර හැර තිබූ බොහෝ නිලධාරීන්ගේ ණය ශේෂයන් ඔවුන් සේවක අර්ථසාධක අරමුදල් ලබාගැනීම සඳහා අවශ්‍ය ලිපිලේඛණ ලබාගැනීමට මණ්ඩලය වෙත පැමිණෙන අවස්ථාවලදී අයකර ගැනීමට කටයුතු කල අතර, අනෙකුත් නිලධාරීන්ගේ ණය ශේෂයන් ඇපකරුවන් මගින් අයකර ගැනීමටත් කටයුතු කරමින් පවතී.

(ආ) මණ්ඩලයට විවිධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු රු. 708,347/- ක මෙම ශේෂය අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා දැනටමත් කටයුතු කරමින් පවතී.

(ඇ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය දැනට සම්පූර්ණයෙන්ම මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමයකි. ඉදිරියේදී මෙම යෝජනා ක්‍රමය මූල්‍ය ශක්‍යතාවයකින් යුතු නව යෝජනා ක්‍රමයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයද වාරික ආදායම ඉක්මවා විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකරන යෝජනා ක්‍රමයක් බැවින් එම යෝජනා ක්‍රමයද ඉදිරියේදී ධීවර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව ප්‍රතිව්‍යුහගත කිරීමට බලාපොරොත්තු වන බැවින් ඉන්පසු එම මුදලද අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) විගණන ගාස්තු ක්‍රමිකව ගෙවීමට කටයුතු කරනු ලැබේ.

## 2.4 <u>නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

(අ) මෙම නිළධාරියා හට විධිමත් චෝදනා පත්‍රයක් නිකුත් කිරීම සඳහා මේ වන විටත් සාක්ෂි ගොනු කරමින් පවතින අතර, ප්‍රමාණවත් සාක්ෂි ගොනු කිරීමකින් අනතුරුව කඩිනමින් චෝදනා පත්‍ර නිකුත් කිරීමට බලාපොරොත්තු වේ.

(ආ) මණ්ඩලයේ ව්‍යාපාරික ස්වභාවය අනුව, බොහෝ විට ක්ෂේත්‍ර රාජකාරී වල යෙදීමට සිදුවන අතර ගංවතුර, නියං හා වෙනත් ආපදාවන් සිදුවන අවස්ථාවන්හිදී මණ්ඩලයේ විධායක නිලධාරීන්ට වෙනත් දිස්ත්‍රික්ක වල රාජකාරී කටයුතු සඳහා නිරන්තරයෙන් සහභාගී වීමට සිදුවේ. මෙහිදී මෙම නිලධාරීන් වෙනත් දිස්ත්‍රික්ක වල රාජකාරී කටයුතු වල නියැලීමේදී නවාතැන් පහසුකම් සලසා ගතයුතු අතර, ඒ සඳහා ප්‍රමාණවත් මුදලක් ලබාදිය යුතු බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව මෙම ගෙවීම් සිදුකරනු ලබයි. මෙලෙස නිසි පරිදි නවාතැන් පහසුකම් ලබා නොදෙන්නේ නම් එය මණ්ඩලයේ රාජකාරී කටයුතු වලට බාධාවක් වනු ඇත.

(ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේක අංක PED1/2015 දරණ චක්‍රලේඛයට අනුව ප්‍රවාහන පහසුකම් හිමි නිළධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට මණ්ඩලය සතුව භාවිතයේ පවතින වාහන ප්‍රමාණවත් නොවන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව මෙම දීමනාව ලබාදී ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

(අ) 2017 වර්ෂය සඳහා සැලසුම් සකස් කිරීමේදී හා සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී පැවති තත්ත්වයන් අනපේක්ෂිත ලෙස වෙනස් වීම මත අපේක්ෂිත ආදායම් ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි විය. විශේෂයෙන් 2017 වර්ෂය තුලදී පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා ගොවීන් බොහොමයක් වගා කටයුතු වල නියැලීමට පසුබට වීමත්, රජය විසින් ගොවීන් හට නියං සහනාධාර ලෙස වන්දි ගෙවීමත් හේතු කොට ගෙන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන වගා රක්ෂණ යෝජනා ක්‍රමයන් යටතේ රක්ෂණාවරණයන් ලබාගැනීමට ගෙවීන්ගේ නැඹුරුතාවයේ අඩුවීමක් ඇතිවූ අතර, එය මණ්ඩලයේ වගාරක්ෂණ යෝජනා ක්‍රමයන්ගේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමෙහිලා මූලික වශයෙන් බලපාන ලදී.

එහෙත් කෘෂි උපකරණ ඇතුළු තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමය 437% කින් ආදායමේ ප්‍රගතියක් වාර්තා කර ඇති අතර, පශු රක්ෂණ යෝජනා ක්‍රමයද 27% ක ප්‍රගතියක් වාර්තා කර ඇත.

(ආ,ඇ) කෘෂි උපකරණ සඳහා වන ආපදාවන් අවම වීම හා රෝහල් ගත වීම් ඉතා අවම තත්ත්වයක පවතින බැවින් ජනතාව තුළ ඇති විශ්වාසය මත කෘෂි උපකරණ, සුවසෙත සෞඛ්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රමය හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් අපේක්‍ෂිත ඉලක්කයන් සපුරා ගැනීමේ අඩුවක් ඇතත්, පවත්නා තත්ත්වය යටතේ ලබා ඇති 50%ක ප්‍රගතිය තව දුරටත් වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කෙරෙනු ඇත.

(ඇ) ගබඩා රක්‍ෂණ කටයුතු මණ්ඩලය ආරම්භ කරන ලද්දේ රජයේ ගබඩා රක්‍ෂණය කිරීමේ අරමුණින් වුවද, එම රක්‍ෂණ කටයුතු වෙනත් රක්‍ෂණ ආයතනයකට පැවරීම මත මණ්ඩලයට ගබඩා රක්‍ෂණය යටතේ අපේක්‍ෂිත ඉලක්කයට ළඟාවීමේ හැකියාවක් නොවූ අතර අදාල වර්ෂයේ පැවති දැඩි නියං තත්ත්වය යටතේ වගා අස්වැන්න අඩුවීම මත පෞද්ගලික ගබඩා පවත්වාගෙන යෑමේ අඩුවීම ද ඒ සඳහා හේතු විය.

(ඉ) ලෝක බැංකුව හා අනුබද්ධ ජාත්‍යන්තර මූල්‍ය සමාගමේ (IFC) තාක්ෂණික සහාය ඇතිව, දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමේ ව්‍යාපෘතියේ (ව්‍යාපෘති අංක 600663) ප්‍රධාන පරමාර්ථය වන්නේ කෘෂිකාර්මික රක්ෂණයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සහ එමඟින් ශ්‍රීලංකාවේ කෘෂි රක්ෂණය, රක්ෂණ වෙළඳපොළ තුල ව්‍යාප්ත කිරීමයි.

කාලගුණ දත්ත ලබා ගැනීමේ හැකියාව, ගොවිප්‍රජාවගේ පැතිරීම සහ කෘෂිකාර්මිකවගාබිම් ව්‍යාප්තිය යන සාධකයන්ට අනුව අනුරාධපුර, පොලොන්නරුව, කුරුණෑගල, වව්නියාව සහ අම්පාර වැනි දිස්ත්‍රික්කයන්මෙහි නියමු ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලදී.දර්ශකයක් යනු ගණිතමය ක්‍රමයක් වන අතර මෙමගින් වන්දි ගණනය කිරීම පහසු වුවද, එය ක්ෂත්‍රයේ හානි මට්ටම් සමඟ සැසදීම සඳහා හා ඒ අනුව දර්ශක මට්ටම් සුසර කිරීම සඳහා යම් කාලයක් ගතවේ.

මේ වන තෙක් ශ්‍රී ලංකාවේ වගා හානි හා ඉහත කරුණු අතර සම්බන්ධතාවයන් පිලිබඳ පර්යේෂණයන් සිදු කර නොමැති බැවින් යම් ප්‍රදේශයකට/දිස්ත්‍රික්කයකට වර්ෂාව මත පදනම් වූ දර්ශකය යොදා ගැනීමේදී ප්‍රදේශයේ සාමාන්‍ය වර්ෂාපතනය, ගොවිතැන්කිරීම් සඳහා ජලය ලැබෙන ජල මූලාශ ( මහාවාරි/ මධ්‍යවාරි / සුළුවාරි ) වාරිමාර්ග වල, ගොවීන් වෙත ජලය ලැබෙන ජල මුර ගණන ආදිය සියුම්ව අධ්‍යනය කිරීමට සිදුව ඇත.

එසේම වර්ෂාපතන දත්ත මත පදනම් වූ දර්ශකයක් සැදීමේදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් වර්ෂාපතන දත්ත ලබා ගැනීමට හැකි වේ යැයි, එම ආයතනයෙන් මුලින් ප්‍රකාශ කලත් වවුනියාව වැනි දිස්ත්‍රික්ක වල එක් වර්ෂාපතන මිනුම් ස්ථානයක් පමණක් ඔවුන් සතු වූ අතර අනෙකුත් ආයතන මගින් පවත්වා ගෙන යන කාලගුණික මධ්‍යස්ථාන වල පැතිරීමද අවශ්‍ය මට්ටමින් නොපැවතුනි. එම නිසා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ නව වර්ෂාපතන මිනුම් ගන්නා ස්ථාන 4ක් මෙම ව්‍යාපෘතිය යටතේ කාලගුණික විද්‍යා ජාතික ජාලයට එක් කිරීම සිදු කරන ලදී. ඒ අනුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ වවුනියා දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ශාඛා වන ඕමන්තෙයි, උළුක්කුලම්, වෙඩ්ඩිකුලම් හා නැදුන්කර්නි ජාතික කාලගුණ විද්‍යා දත්ත ජාලයට එකතු කරන ලදී.

මෙම නියමු ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද දිස්ත්‍රික් කාර්යාලවල කාර්ය මණ්ඩල සාමාජිකයින් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු වල ඉහත දිස්ත්‍රික්කයන්හි අදාළ විෂයභාර නිලධාරීන් සහභාගී කරවා ගනිමින් තොරතුරු හුවමාරු කර ගැනීම හා දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමය පිළිබඳව දැනුම ඉහල නැංවීම සඳහා 2017 වර්ෂයේදී වැඩමුළු සහ පුහුණු සැසි කිහිපයක් පැවැත්වීමට කටයුතු සකස් කරන ලදී. මේ වනවිට වව්නියාව දිස්ත්‍රික් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

මීට අමතරව දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමයේ වන්දි නිර්ණය කිරීමේ කටයුතු ඉතා නිරවද්‍යාව සිදුකිරීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන ආයතන වල සහයෝගය ලබා ගනිමින් මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ වන විට දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය මගින් වවුනියා දිස්ත්‍රික්කයේ 2017/18 මහ කන්නයේ හානි ගණනය කිරීමේ කටයුතු සිදු කර අවසන් වන අතර, මණ්ඩලයේ රක්ෂණ අංශය මගින් දැනට පවතින ඇස් මට්ටමින් හානි තක්සේරුව අනුව වන්දි ගණනය කිරීම් සමඟ සංසන්දනාත්මක විශ්ලේෂණයන් කිරීමට අපේක්ෂිතය.

**(ඊ)** රතු ළූණු, කුරක්කන්, උඳු, රටකජු, කව්පි, මුං, තල, බුලත්, ගම්මිරිස්, ඉගුරු, කොකෝවා, තේ, පොල්, එළවළු, පලතුරු, මල්වගා, කජු, උක් හා පුවක් යන රක්ෂණ ඔප්පු මණ්ඩලය සතුව පවතින නමුත් ගොවීන්ගේ ඉල්ලුම පරිදි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක වේ. මෑතකදී රතු ළූණු හා උක් වගාව සඳහා රක්ෂණ ඔප්පු යාවත්කාලීන කරන ලදී.මෙහි දක්වා ඇති භෝගයන් ශ්‍රී ලංකාව තුල වගා කිරීමේ කටයුතු සුළු පරිමාණයෙන් සිදු වේ. කෙසේ නමුත් මෙම භෝග වගාවන් සඳහා ප්‍රචලිත දිස්ත්‍රික්කයන්හි මෙම රක්ෂණ කටයුතු ඉතා හොද මට්ටමකින් ක්‍රියාත්මක වේ. කොකෝවා, තේ, පොල් ආදී බෝග සඳහා පවතින අවධානම අවම බැවින් වගාකරුවන් රක්ෂණය සඳහා යොමු වීම අවම මට්ටමක පවතී. කෙසේ වුවද, ප්‍රවර්ධන හා ප්‍රචාරක වැඩ සටහන් වලදී ද මෙම භෝග වර්ග සඳහා මණ්ඩලය සතුව රක්ෂණ යෝජනා ක්‍රම පවතින බව දිගින් දිගටම ගොවීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

**(උ)** ධීවර බෝට්ටු ඇතුළු ධීවර ආම්පන්න රක්ෂණය කිරීම සඳහා නව රක්ෂණ යෝජනා ක්‍රම ආරම්භ කිරීම සම්බන්ධයෙන් මේ වන විටත් මණ්ඩලයේ දැඩි අවධානය යොමු වී ඇති අතර, ඉදිරියේදී කෘෂි රක්ෂණ පනත මගින් මණ්ඩලයට පවරා ඇති වගකීම ඉටුකිරීමෙහි ලා නව රක්ෂණ යෝජනා ක්‍රම සැකසීමට අපේක්ෂා කරනු ලැබේ.

වාණිජ බැංකු මගින් ලබාදෙන වගා ණය සහ පොහොර සහනාධාර යටතේ රක්ෂණය ලබාගන්නා ගොවීන් සඳහා වඩා ඵලදායී හා ආකර්ශණීය රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීමට අපේක්ෂිතය.

**4.2** **<u>කළමනාකරණ ක්‍රියාකාරකම්</u>**

**(අ)** මහවැලි අධිකාරිය විසින් 1986 වර්ෂයේ සිට මෙම මණ්ඩලය වෙත පවරා දී ඇති ඉඩමෙහි ඇඹිලිපිටිය කාර්යාලය පවත්වාගෙන යනු ලබයි.

1986 වර්ෂයේ සිට මෙහි කාර්යාලය පවත්වාගෙන යන නමුදු 1986 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලය සඳහා මෙම ඉඩම වෙනුවෙන් බදු මුදල් වශයෙන් රු.1,996,625/-ක මුදලක් ගෙවන ලෙස මහවැලි අධිකාරියේ වලව නේවාසික ව්‍යාපාර කළමනාකාරවරයාගේ අංක:මඅ/ව/ඉ/න/Vii/88 හා 2012.12.11 දිනැති ලිපිය මගින් දැනුම් දෙන තුරු බදු මුදල් ගෙවීමක් පිළිබඳව මණ්ඩලය වෙත දැනුම්දීම් කර නොතිබිණි.

ඒ අනුව මෙම බදු මුදල ගෙවීම සම්බන්ධ තීරණය සඳහා 2012.12.28 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අංක:442/05 යටතේ ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සලකා බැලූ අධ්‍යක්ෂ මණ්ඩලය “දැනට ආයතනයේ මූල්‍ය තත්ත්වය අනුව මෙම මුදල

ගෙවීමට හැකියාවක් නොමැති බවත්, මේ ආකාරයට බදු මුදල් ගෙවිය යුතු බවට කිසිදු දැනුම් දීමක් පෙර කාලය තුලදී සිදුකර නොමැති බවද දන්වා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලිපියක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත". ඒ අනුව 2013.01.18 දින මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකාර වෙත මේ පිළිබඳව ලිඛිත දැනුම් දීමක් කර ඇත.

2013.04.03 දිනැතිව එම ලිපියට පිලිතුරු ඉදිරිපත් කරමින් ගෙවිය යුතු බදු මුදල් ගැන නිවේදනයක් එවා නොතිබීම මහවැලි අධිකාරියේ එවකට සිටි නිලධාරීන්ගේ අතපසුවීමක් බව පිළිගෙන ඇති අතර, රජයට අනුබද්ධ ආයතනයක් වශයෙන් මෙම බදු මුදල හැකි ඉක්මනින් ගෙවන ලෙස මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් නැවත දන්වා ඇත.

ඒ අනුව එකවර මෙම බදු මුදල් ගෙවීමට මණ්ඩලයට හැකියාවක් නොමැති බැවින්, සහනදායී වැඩපිළිවෙලක් සකසා දෙන ලෙස හා මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දෙන ලෙස මහවැලි අධිකාරියේ අධ්‍යක්‍ෂ ජනරාල් වෙත 2013.07.01 දිනැතිව ලිපියක් මඟින් දැනුම් දුන්නද ඊටද කිසිදු ප්‍රතිචාරයක් ලැබී නැත.

2015.01.19 දාතමින් වළිකා වැව කොට්ඨාශ කළමනාකාර කාර්යාලය විසින් "ඇඹිලිපිටිය කෘෂි රක්‍ෂණ මණ්ඩලයේ කාර්යාලය පවත්වා ගෙන යනු ලබන ඉඩම සඳහා වාර්ෂික බදු අය කිරීම" හිසින් 2015 වර්ෂය දක්වා රු.2,270,750/-ක බදු මුදලක් ගෙවිය යුතු බව නැවත දන්වා එවා ඇත. මේ සම්බන්ධව ගරු කෘෂිකර්ම අමාත්‍යවරයාට 2015.04.29 දිනැතිව මණ්ඩලයේ සභාපතිතුමන් විසින් කරුණු දක්වමින් මෙම බදු මුදල් ගෙවීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර අදාල ඉඩම කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා මණ්ඩලයට පවරාදීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ඉල්ලීම් කර ඇත. ඊටද මේ දක්වා පිළිතුරු ලැබී නොමැත.කරුණු මෙසේ තිබියදී "හිඟ බදු මුදල් අය කර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීම" මැයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්‍ෂිකා (නීති) විසින් එන්තරවාසියක් 2015.09.10 දින එවා ඇත. මෙම හිඟ බදු මුදල ගෙවීම් නොකලහොත් එම මුදල අය කර ගැනීමට හා ගොඩනැගිල්ලෙන් නෙරපා හැරීම සඳහා මණ්ඩලයට එරෙහිව නඩු පැවරීමට කටයුතු කරන බවද එමඟින් දැනුම් දී ඇත.

මේ සම්බන්ධව නැවත කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත 2015.10.20 දිනැතිව අධ්‍යක්‍ෂ ජනරාල්තුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් මෙම ඉඩම කෘෂිකර්ම අමාත්‍යාංශයට පවරාගෙන මණ්ඩලයේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලීමක් කර තිබුණද ඊටද මේ දක්වා පිළිතුරු ලැබී නොමැත.

මෙම ඉඩම අප මණ්ඩලය වෙත බැහැර කර ඇත්තේ වාර්ෂික බදු ගෙවීමේ පදනම මත වන බැවින් ඒ සඳහා බදු ගෙවීමට අප මණ්ඩලය නීතියෙන් බැඳී ඇති බවත්, ඒ අනුව හිඟ බදු මුදල් ද සමඟ 2016 වර්ෂය දක්වා වූ මුළු බදු මුදල වන රු.2,573,750/-ක මුදල වහාම ගෙවන ලෙසත් එසේ නොගෙවන්නේ නම් බදු මුදල අයකර ගැනීමට හා ඉඩම සඳහා වූ බද්ද අවසන් කිරීමට නීති මඟින් කටයුතු කරනු ලබන බවත්, මහවැලි අධිකාරිය 2016.02.05 දිනැති ලිපිය

මඟින් නැවත වරක් දැනුම් දී ඇත. ඒ අනුව මෙම බදු මුදල ගෙවීම සඳහා සහනයක් ලබා ගැනීමට ඉහත පරිදි අඛන්ඩව ඉල්ලීම් කර ඇත. ඒ පිළිබඳව මේ දක්වා සහනයක් ලැබී නොමැති වීමෙන්, 1986 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ රු. 2,764,344/- ක මෙම බදු මුදල් සම්බන්ධයෙන් සහනයක් ලබාගැනීම සඳහා තවදුරටත් මහවැලි අධිකාරිය සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

**(ආ)** මේ වන විට විනය පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත.

**(ඇ) (i)** මෙම ගොවීන් 32 කට අදාල එකම ගිණුම් අංකයට බැර කරන ලද මුදල් බැංකුව විසින් රඳවාගෙන ඇති අතර, ගෙවීම් ප්‍රතික්ෂේපිත ගොවීන් සඳහා නැවත ගිණුම් අංක නිවැරදි කර එවන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. එසේ ලද විගස ගෙවීම් සිදුකරනු ලැබේ.

**(ii)** 2016 වර්ෂයේ පටන් දිවයිනට බලපෑ නියං තත්වය නිසා පීඩාවට පත්වූ ගොවීන් හට වන්දි ගෙවීම් සිදුකරන ලදී. මෙහිදී හානිවූ ගොවිබිම් පරීක්ෂා කොට, නිර්දේශ කර අනුමත කිරීමේ වගකීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරයා ගොවිජන සේවා මධ්‍යස්ථාන වල සංවර්ධන නිලධාරීන් හා කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් විසින් සිදු කරන ලද අතර, අවසානයේ දිස්ත්‍රික් ලේකම්වරයාගේද අනුමැතිය මෙම ලේඛණ සඳහා හිමි වී ඇත. විගණන විමසුමේ සඳහන් වන්දි ගෙවීම් වලට අදාලව හානි වූ වගා බිම් ද්විගණනය වී නොමැත. මෙම වන්දි ලේඛණයට අදාලව ගොවි බිම, ගොවියා, ඉඩමේ අයිතිය හා බැංකුව හඳුනා ගැනීම සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් භාවිතා කරන ලද මූලික ලේඛණය වන ඉල්ලුම් පත්‍ර අංකය (DO Serial No) පරීක්ෂා කිරීමේදී වෙනම මූලික ලේඛණ ඇති බව තහවුරු විය. එම මූලික ලේඛණයන්හි අංකයන් උපලේඛණය මගින් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

**(iii)** ගෙවීම් ප්‍රතික්ෂේපිත වූ ගොවීන් සඳහා සංශෝධිත ලේඛණ සකස් කර එවන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති අතර, එසේ ලැබුණු සංශෝධිත ලේඛණ සඳහා ගෙවා ඇත. එසේ ලැබෙන නිවැරදි ලේඛණ ලද වහාම ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ.

**(ඇ)** නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි) විසින් දිස්ත්‍රික් කාර්යාල වල ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගී වන අවස්ථාවලදී එම දිස්ත්‍රික් භාර විධායක නිලධාරීන් විසින් කරනු ලබන ඉල්ලීම් අනුව, තෙවන පාර්ශවීය රථ වාහන රක්ෂණ වැඩසටහන් සඳහා කඩිනමින් භාර දීමේ අවශ්‍යතාවය මත එම දිස්ත්‍රික්ක වලට අවශ්‍ය ලිපි ලේඛන හා ද්‍රව්‍ය ප්‍රධාන කාර්යාලයෙන් රැගෙන ගොස් භාර දී ඇත. මේ අනුව ප්‍රධාන කාර්යාලය වෙතින් ලබාගත් රථ වාහන රක්ෂණ කාඩ්පත්, රථවාහන රක්ෂණ අයදුම්පත් හා ටී ෂර්ට් නිසි පරිදි මාතර දිස්ත්‍රික් කාර්යාලය සඳහා භාර දුන් බවට සහකාර අධ්‍යක්ෂ (අලෙවි) විසින් ලිඛිතව දන්වා ඇති අතර, මාතර දිස්ත්‍රික්

නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙතින් ලබාගත් ටී ෂර්ට් 110 ක් භාර ගත් බවට සහතික කරන ලද ලිපියක්ද ඉදිරිපත් කර ඇත.

දිස්ත්‍රික් නියෝජිත ජාලය ශක්තිමත් කිරීම තුලින් මණ්ඩලීය ආදායම ඉහල නැංවීම සඳහා ආරම්භ කරන ලද තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී නිසි වේලාවට රක්ෂණ ආවරණයන් රක්ෂිතයා වෙත ලබාදිය යුතු බැවින්, ආරම්භයේදී අයදුම් පත්‍ර, තාවකාලික ආවරණ පත්‍ර හා රක්ෂණ කාඩ්පත් දිවයින පුරා බෙදාහැරීමේදී ගැටළු සහගත තත්වයක් පැවතුනද මේ වන විට එම තත්වය මගහරවා කාර්යක්ෂම ලෙස රක්ෂණ ආවරණ කාඩ්පත් දිස්ත්‍රික් මට්ටමින් මුද්‍රණය කර ලබාදීමට අවශ්‍ය පියවර ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස එම යෝජනා ක්‍රමයේ ආදායමද සීඝ්‍රයෙන් ඉහල ගොස් ඇත.

**(ඉ)** දැනට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වී ඇති අතර, ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මාසිකව මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන සලසනු ලබයි. ඉදිරියේදී මෙම ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ස්වයං මූල්‍ය පදනමකින් යුක්තව පවත්වාගෙන යාම සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට බලාපොරොත්තු වන අතර, කෘෂි රක්ෂණ අරමුදලට ලැබිය යුතු රක්ෂණ වාර මුදලද අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**(ඊ)** මණ්ඩලයේ මේ වන විට පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර වශයෙන් තනතුරුගතව අයදුම්පත් කැඳවීම් සිදුකර තිබෙන අතර ඉදිරියේදී මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු සිදුකරනු ලැබේ. එසේම සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇති කලමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදුකිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ද ඉදිරිපත් කර ඒ සඳහා මේ වන විට අනුමැතිය ද ලැබී ඇත. ඉදිරියේදී මෙම කලමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු ද සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. ස්ථිර නිලධාරීන් බඳවා ගන්නා විට ස්ථිර තනතුරු නොදරන නිලධාරීන් (පුහුණු, කොන්ත්‍රාත්) සීමා කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**(උ)**

i. ජීවගණක පර්යේෂණ කටයුතු සඳහා විශේෂඥ දැනුමක් ඇති ස්ථිර නිලධාරියෙකු බඳවාගැනීම පිණිස අධ්‍යක්ෂ (රක්ෂණ) තනතුර සඳහා 2018.04.23 හා 24 යන දින වල පුවත්පත් දැන්වීම් පලකර අයදුම්පත් කැඳවීම් කල ද ඒ සඳහා කිසිදු අයදුම්පතක් ලැබී නොමැත.

ii. නිපුණතාවයකින් හෙබි කාර්යමණ්ඩලයක් පැවතියද තාක්ෂණික උපකරණ හිඟතාවය මෙම නිලධාරීන්ගේ නිපුණතාවය ක්‍රියාත්මක කිරීමට බාධාවක් වී ඇත. මෙම තත්වය බොහෝ දුරට අවම කර ගැනීමට මණ්ඩලය මේ වන විට පියවර ගෙන ඇත.

iii. මණ්ඩලය විසින් සිදු කරනු ලබන නව බඳවා ගැනීම් හේතුවෙන් නව තාක්‍ෂණය සමඟ කටයුතු කල හැකි නිලධාරීන් මණ්ඩලයට එක්වන බැවින් ඉදිරියේදී මෙම තත්වය මඟහැරී යනු ඇත.

iv. මේ වන විට ප්‍රධාන කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී.

v. මේ වනවිට මණ්ඩලය විසින් ඉහල තාක්‍ෂණික උපකරණ මිලට ගනිමින් පවතින බැවින් මෙම ගැටළුව ඉදිරියේදී නිරාකරණය කර ගත හැක.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

බාහිර නියෝජිත ජාලයේ නියොජිතයින් වෙත ටී ෂර්ට් ලබා දීම සිදු කෙරෙනු අතර නියෝජිතයින් පත්කර පුහුණු කිරීමෙන් අනතුරුව නියෝජිකත්වය ලබා දෙන අවස්ථාවලදී ඔවුන් වෙත ටී ෂර්ට් දිස්ත්‍රික් කාර්යාල විසින් ලබා දී ඇත. ඒ අනුව, පත්කෙරෙන නියෝජිතයින් ප්‍රමාණය අනුව දිස්ත්‍රික් කාර්යාල විසින් අවශ්‍ය ප්‍රමාණයට ටී ෂර්ට් ඉල්ලුම්කර ලබා ගෙන ඇත. මේ වන විටත් දිස්ත්‍රික් කාර්යාල කීපයක නියෝජිතයන් බඳවා ගැනීමේ නව නියෝජිතයෙකු කටයුතු අවසන්ව නොමැති අතර නියෝජිතයකු ඉවත්වන අවස්ථාවකදී ඒ වෙනුවෙන් බඳවා ගැනීමටද කටයුතු කෙරෙන බැවින් එම අවස්ථාවලදී දිස්ත්‍රික් කාර්යාල විසින් කෙරෙන ඉල්ලීම් අනුව ගබඩාවේ රඳවා ඇති ටී ෂර්ට් දිස්ත්‍රික් කාර්යාල වෙත නිකුත් කිරීමට නියමිතය.

## 4.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

(අ) මණ්ඩලය සතුව ධාවනය කළ හැකි සංචිත වාහන 07 ක් පවතී. ඒවා පහත පරිදි වර්ගීකරණය කර දැක්විය හැක.

- වෑන් රථ 02
- කාර් රථ 03
- ජීප් රථ 01
- ත්‍රීවිල් 01

මෙම සංචිත වාහනවලින් වෑන් රථ 02 බොහෝවිට භාවිතා වනුයේ කණ්ඩායමක් වශයෙන් ගොස් රාජකාරී ඉටුකරන අවස්ථාවලදීය. ( උදා: වන්දි නිදහස් කිරීමේ රාජකාරී, වන්දි ගණනය කිරීමේ රාජකාරී හා අනෙකුත් රාජකාරී) කාර් රථ 03 හා ජීප් රථය රාජකාරී අවශ්‍යතාවය මත දිනපතා භාවිතා වන අතර ත්‍රීවිල් රථය භාවිතා වන්නේ තැපැල් කටයුතු සඳහාය. එසේම මණ්ඩලය සතු වාහන බොහොමයක් වසර 20 ක් පමණ පැරණි ඒවා වේ. එම නිසා වරින් වර අළුත්වැඩියා කිරීම් කටයුතු සිදුකිරීමට අවශ්‍ය වන අතර, සේවා අවශ්‍යතාවය අනුව අළුත්වැඩියා නිමවන තෙක් මණ්ඩලීය සංචිත වාහන එම දිස්ත්‍රික් කාර්යාලයක් වෙත නිදහස් කිරීමට ද කටයුතු කරනු ලැබේ. රියදුරන් තිදෙනෙකු පමණක් ප්‍රධාන කාර්යාලය සතුව පැවතිය ද රාජකාරි අවශ්‍යතාවය මත දිස්ත්‍රික් කාර්යාලවල රියදුරන් ප්‍රධාන කාර්යාලය වෙත

අදාල රාජකාරී කාලසීමාව තුල අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ. එම නිසා මෙම සංචිත වාහන ඌන උපයෝජන තත්වයේ නොපවතින බව කාරුණිකව දන්වා සිටිමි.

**(ආ)** අදාල වත්කම් ප්‍රතිසංස්කරණය කර භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

## 4.5 <u>අනාර්ථික ගනුදෙනු</u>

**(අ)** සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කරන ලද Digital Agriculture විෂය යටතේ Real time Agriculture Information Collection System පිළිබඳ යෝජනාවට අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලැබීමෙන් ඒ සඳහා නියමු ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා රුපියල් මිලියන 30 ක මුදලක් වෙන් කරන ලදී. මෙමඟින්,

| | |
|---|---|
| * වගා ණය කලමනාකරණය<br>* වගා හානි කලමනාකරණය<br>* වගා සුපරීක්ෂණය<br>* එලදා තක්සේරුව<br>* සංඛ්‍යාන තොරතුරු | සෘජු ප්‍රතිලාභ |
| * ගොවි පුහුණු හා අධ්‍යයන<br>* වගා උපදේශන සේවා<br>* ජල කලමනාකරණය<br>* පොහොර කලමනාකරණය<br>* පාංශු කලමනාකරණය<br>* එලදා පුරෝකථනය<br>* කෘෂි වෙළඳපල තොරතුරු කළමනාකරණය | වක්‍ර ප්‍රතිලාභ |

යන ප්‍රතිලාභ අපේක්ෂා කර මෙම නියමු ව්‍යාපෘතිය දියත් කිරීම අපේක්ෂා කරන ලදී.

මෙම ව්‍යාපෘතියෙහි මුලික අදියරේදී තෝරාගත් කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් (අනුරාධපුර දිස්ත්‍රික්කයේ පමණක්) 1000 දෙනෙකු යොදාගනිමින් නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් ඉදිරියේදී සියළුම දිස්ත්‍රික්කයන්හි ගොවිජන සේවා මට්ටමින් පුළුල් කිරීම පිළිබඳව සලකා බැලීම සඳහා අපේක්ෂා කරන ලද නියමු ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ තාක්ෂණික අවශ්‍යතාව මණ්ඩලයේ සිදුකිරීමට යෝජිත තාක්ෂණික සංවර්ධනය මඟින් සපුරා ගැනීමට සැලසුම්කර තිබිණ.

පරිගණක සහ උපාංග මිලදී ගැනීම හා මෘදුකාංග මිලදී ගැනීම යන ප්‍රසම්පාදනයන්හි සිදුවූ අඩාලවීම් හා එවකට පැවති දේශපාලන තත්ත්වයන් (මැතිවරණය ප්‍රකාශිත කාලපරිච්ඡේදයක් බැවින් මැතිවරණ නීති රීති හි බලපෑම) හේතුවෙන් අදාල නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක විය.

ඒ කෙසේ නමුත්, කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලයෙහි අත්‍යවශ්‍ය තාක්‍ෂණික සංවර්ධනයට සමගාමීව උක්ත නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකිවූයේ නම්, මණ්ඩලයට වාසි සහගත තත්ත්වයන් අත්කර ගැනීමට හැකියාව පැවතිනි.

**(ආ)** 2006 වර්ෂයේදී පළමුවරට ජීවන වියදම් දීමනාව ගෙවන විට සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව ඇතුලත් කිරීම සම්බන්ධයෙන් නිසි උපදෙස් ලබාදී නොතිබුණු බැවින්, මෙම කාලය තුල ජීවන වියදම් දීමනාව අර්ථ සාධක අරමුදල් ගණනය කිරීම සඳහා ඇතුලත් කර නොගත් අතර, කම්කරු කොමසාරිස්ගේ උපදෙස් අනුව 2013 මැයි මස සිට සේවක අර්ථ සාධක අරමුදල් දායකය ගණනය කිරීම සඳහා ජීවන වියදම් දීමනාව ඇතුලත් කර ගන්නා ලදී. මෙහිදී මහා භාණ්ඩාගාරයේ උපදෙස් ලබාගැනීමෙන් අනතුරුව මෙම හිඟ මුදල් ගෙවීමට කටයුතු කර ඇත.

**(ඇ)** 1973 වර්ෂයේ ආරම්භ කරන ලද කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට මේ වන තෙක් ප්‍රධාන කාර්යාලයක් නොමැත. ප්‍රධාන කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඉඩමක් වෙන්කර දෙන ලෙස ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයෙන් කල ඉල්ලීමේ ප්‍රතිඵලයක් ලෙස රජමල්වත්ත පාර, බත්තරමුල්ලේ පිහිටි භූමියකින් හෙක්ටෙයාර් 0.502 න් යුත් ඉඩම් කොටසක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට පවරා දෙන ලදී.එම භූමියේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මූලික සංඛ්‍යා වාර්තාවක් ලබාගැනීම වෙනුවෙන් ඉඩම් ගොඩකිරීමේ අධිකාරිය වෙත මෙමරු. 565,800/- ක මුදල ලබාදී ඇත. එම වාර්තා පදනම් කොටගෙන ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කර ඇති අතර, භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගැනීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත එම වාර්තාව ඉදිරිපත් කර ඇත.

**4.6** **<u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>**

**(අ)** මණ්ඩලීය බඳවා ගැනීම් පරිපාටිය සංශෝධනය කර කෙටුම්පතක් මේ වන විට පිළියෙල කර ඇති අතර මේ සඳහා මණ්ඩලයේ වෘත්තීය සමිති වලින් ලබා ගත් අදහස් හා යෝජනා ද ඇතුලත් කිරීමට කටයුතු කල බැවින් මෙම ප්‍රමාදය සිදුවිය.

මණ්ඩලයේ මේ වන විට පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර වශයෙන් තනතුරුගතව අයදුම්පත් කැඳවීම් සිදුකර තිබෙන අතර ඉදිරියේදී මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු සිදුකරනු ලැබේ. එසේම සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇති කළමණාකරණ සහකාර තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ද ඉදිරිපත් කර ඒ සඳහා මේ වන විට අනුමැතිය ද ලැබී ඇත. ඉදිරියේදී මෙම කළමණාකරණ සහකාර තනතුරු පුරප්පාඩු ද සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. ස්ථිර නිලධාරීන් බඳවා ගන්නා විට ස්ථිර තනතුරු නොදරන නිලධාරීන් (පුහුණු, කොන්ත්‍රාත්) සීමා කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**(ආ)** 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතෙහි 08 වන වගන්තියෙහි 'ඔ' හි " මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය යයි හෝ ආනුෂංගික යයි හෝ මණ්ඩලය අදහස් කරන අනෙකුත් සියළු දේ කිරීම " සහ 9. (1) හි "මණ්ඩලයේ කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන්, මණ්ඩලය විසින් වරින් වර නියාමනය කරනු ලබන නියම හා කොන්දේසි අනුව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම මණ්ඩලය විසින් කල හැකිය" යන්න අදාල කරගෙන මණ්ඩලයට පැවරී ඇති බලතල ඉටුකිරීමට කටයුතු කර ඇත. ඒ අනුව, කෘෂි රක්ෂණ පනතේ විධිවිධාන චක්‍රලේඛ විධිවිධාන අභිබවා යන බැවින් මෙලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව මෙම නිළධාරීන් බාහිර නියෝජිත අලෙවි ජාලය ස්ථාපිත කිරීමට හා පුළුල් කිරීමට බඳවාගෙන ඇත.

මේ අනුව 2015 වර්ෂයේ ස්ථාපිත කල බාහිර නියෝජිත අලෙවි ජාලය තුලින් මේ වන විට මණ්ඩලය උපයා ගන්නා අදායමේ ප්‍රගතිය සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින අතර, 2015 වර්ෂයේ රුපියල් මිලියන 2,136,980/- ක් වූ අදායම 2016 වර්ෂයේ රුපියල් මිලියන 8,474,131.10 ක් දක්වාද, 2017 වර්ෂයේ රුපියල් මිලියන 44,289,406.83 ක් දක්වාද වර්ධනය වී ඇත. තවද, 2018 වර්ෂයේ පළමු මාස 06 සඳහා වූ ආදායම රුපියල් මිලියන 54,387,562.45 කි.

**5.** <u>**තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**</u>

**(අ)** කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් වේ. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල සතුව පවතින දිස්ත්‍රික් කාර්යාල 29 යෙහි ඒ ඒ දිස්ත්‍රික්කයන්හි කෘෂි රක්ෂණය ලබා ගත් හා පොහොර සහනාධාර ලබා ගත් ගොවීන්ගේ විස්තර ඇතුලත් දත්ත පද්ධතියක් සක්‍රීය මට්ටමින් ක්‍රියාත්මක වේ.

තවද ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් එක් එක් ගොවියාගේ ගොවි බිම් හඳුනාගැනීම හා ලකුණු කිරීමේ කාර්යය සඳහාද කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහයෝගය මේ වන විටත් ලබා දෙමින් පවතී.

මෙහි පළමු අදියරය ලෙස දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනට සමගාමීව වවුනියා දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන අටෙහි ගොවීන්ගේ විස්තර ඇතුලත් දත්ත පද්ධතියක් සකස් කිරීමේ මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී.

(ආ) 2017 වර්ෂය දිළිඳුකම පිටුදැකීමේ වර්ෂය ලෙස යොදවා ගනිමින් කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ශ්‍රී ලාංකික ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ දැමීම සඳහා දිවයින පුරා විශාල වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

උදාහරණයක් වශයෙන් 2017 වර්ෂය තුළදී මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 17ට අදාලව කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් හරහා ගොවීන්, ගොවි සංවිධාන සෘජුව සම්බන්ධකර ගනිමින් රක්‍ෂණ යෝජනා ක්‍රම පිළිබඳව ගොවීන්ට කරුණු පැහැදිලි කර දීම මගින් රක්‍ෂණ යෝජනා ක්‍රම වලට ප්‍රචාරයක් ලබා දී ඇත.

තවද, 2017 වර්ෂය තුලදී බදුල්ල දිස්ත්‍රික්කයේ පහත පරිදි රක්ෂණ යෝජනා ක්‍රම සඳහා ප්‍රචාරණ කටයුතු සිදු කර ඇත.

| අනු අංකය | ස්ථානය | දැනුවත් කළ අය | දැනුවත් කළ යෝජනා ක්‍රම | දිනය | ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 01 | නාගදීප | ගොවීන් | සුවසෙත,හදිසි අනතුරු,පශු රක්ෂණය | 2017/01/06 | 50 |
| 02 | රොබේරිය වතු යාය | වතු කම්කරුවන් කණ්ඩායම් නායකයන් | සුවසෙත,හදිසි අනතුරු | 2017/10/29 | 400 |
| 03 | මඩොල්සිම වතු යාය | කළමණාකරු | සුවසෙත,හදිසි අනතුරු | 2017/11/10<br>2017/11/23 | 01<br>අපේක්ෂිත කණ්ඩායම 1000 |
| 04 | සියඵම ගො.සේ.ම | ගොවිජන සංවර්ධණ නිළධාරීන්, කෘ.ප.නි.ස වරුන් | වගා රක්ෂණය, පශු රක්ෂණ යෝජනා ක්‍රමය | 2017/11/12 | 175 |
| 05 | මහියංගණය (Dole Farm) | කළමනා කරු ගොවීන් | සුවසෙත,හදිසි අනතුරු,යෝජනා ක්‍රමය | 2017/11 | 75 |
| 06 | කන්න රැස්වීම් මහියංගණය,බත්මැඩිල්ල, රිදීමාලියද්ද,දෙමෝදර | ගොවි සංවිධාන නිළධාරීන් ,ගොවීන් | සුවසෙත,හදිසි අනතුරු,වගා රක්ෂණය, පශු රක්ෂණ යෝජනා ක්‍රමය | 2017/10/04<br>2017/10/09<br>2017/10/17 | 160 |
| 07 | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු | ප්‍රා/ලේ ඇතුළු නිළධාරීන් | සුවසෙත,හදිසි අනතුරු, වගා රක්ෂණය, පශු රක්ෂණ යෝජනා ක්‍රමය | සෑම මසකම | 150 |
| 08 | ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු | ප්‍රා/ලේ ඇතුළු නිළධාරීන් | සුවසෙත,හදිසි අනතුරු, වගා රක්ෂණය, පශු රක්ෂණ යෝජනා ක්‍රමය | සෑම මසකම | 150 |

මෙලෙස මණ්ඩලය මගින් ක්‍රියාත්මක කෙරෙන වගා රක්ෂණය හා අනිකුත් රක්ෂණ ක්‍රමයන් ගොවියා වෙත රැගෙන යාම සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් විශාල වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ සේවය කරන කෘෂි උපදේශකවරුන්, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්, ගොවි සමිති නායකයන් හා අනෙකුත් ගොවීන්හරහා නිරන්තර දැනුවත් කිරීම් සිදු කරන ලදී.

කෘෂිකර්ම අමාත්‍යාංශය හා සමගාමීව පොහොර සහනාධාරය ලබා ගන්නා දිවයින පුරා විසිරි සිටින ගොවින් සහනදායි වාරික ක්‍රමයක් යටතේ රක්ෂණය කිරීමේ කටයුතු සිදු කරන ලදී. මේ පිළිබඳව 2017 මහ කන්නයේ සිට පුළුල්ව ප්‍රචාරණ කටයුතු සිදු කරන ලදී.

මීට අමතරව දරිද්‍රතාවය පිටු දැකීමේ අරමුණින් 2017 වර්ෂය තුලදී අදාල දිස්ත්‍රික්කයන්හි වගා හානි වීම හේතුවෙන් සිදුවන ආර්ථික බිඳවැටීම් වලදී වන්දි මුදල් ප්‍රදානය කිරීමෙන් ගොවිජනතාව වෙත මෙම මණ්ඩලය විශාල සේවයක් ලබා දී ඇත. තවද එම දිස්ත්‍රික්කයන්හි ගොවි හා ධීවර විශ්‍රාම ලාභීන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමෙන් ඔවුන්ගේ දරිද්‍රතාවය අවම කිරීමට කටයුතු කර ඇත.

(ඇ) ලෝක බැංකුව හා අනුබද්ධ ජාත්‍යන්තර මූල්‍ය සමාගමේ (IFC) තාක්ෂණික සහාය ඇතිව, දර්ශක මත පදනම් වු රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමේ ව්‍යාපෘතියේ (ව්‍යාපෘති අංක 600663) ප්‍රධාන පරමාර්ථය වන්නේ කෘෂිකාර්මික රක්ෂණයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සහ එමඟින් ශ්‍රී ලංකාවේ කෘෂි රක්ෂණය, රක්ෂණ වෙළඳපොළ තුළ ව්‍යාප්ත කිරීමයි.

කාලගුණ දත්ත ලබා ගැනීමේ හැකියාව, ගොවිප්‍රජාවගේ පැතිරීම සහ කෘෂිකාර්මිකවගාබිම් ව්‍යාප්තිය යන සාධකයන්ට අනුව අනුරාධපුර, පොලොන්නරුව, කුරුණෑගල, වව්නියාව සහ අම්පාර වැනි දිස්ත්‍රික්කයන්මෙහි නියමු ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලදී.දර්ශකයක් යනු ගණිතමය ක්‍රමයක් වන අතර මෙමගින් වන්දි ගණනය කිරීම පහසු වුවද, එය ක්ෂේත්‍රයේ හානි මට්ටම් සමග සැසඳීම සඳහා හා ඒ අනුව දර්ශක මට්ටම් සූසර කිරීම සඳහා යම් කාලයක් ගතවේ.

මේ වන තෙක් ශ්‍රී ලංකාවේ වගා හානි හා ඉහත කරුණු අතර සම්බන්ධතාවයන් පිලිබඳ පර්යේෂණයන් සිදු කර නොමැති බැවින් යම් ප්‍රදේශයකට/දිස්ත්‍රික්කයකට වර්ෂාව මත පදනම් වූ දර්ශකය යොදා ගැනීමේදී ප්‍රදේශයේ සාමාන්‍ය වර්ෂාපතනය, ගොවිතැන්කිරීම් සඳහා ජලය ලැබෙන ජල මූලාශ ( මහාවාරි/ මධ්‍යවාරි / සුළුවාරි ) වාරිමාර්ග වල, ගොවින් වෙත ජලය ලැබෙන ජල මුර ගණන ආදිය සියුම්ව අධ්‍යනය කිරීමට සිදුව ඇත.

එසේම වර්ෂාපතන දත්ත මත පදනම් වූ දර්ශකයක් සැදීමේදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් වර්ෂාපතන දත්ත ලබා ගැනීමට හැකි වේ යැයි, එම ආයතනයෙන් මුලින් ප්‍රකාශ කලත් වවුනියාව වැනි දිස්ත්‍රික්ක වල එක් වර්ෂාපතන මිනුම් ස්ථානයක් පමණක් ඔවුන් සතු වූ අතර අනෙකුත් ආයතන මගින් පවත්වා ගෙන යන කාලගුණික මධ්‍යස්ථාන වල පැතිරීමද අවශ්‍ය මට්ටමින් නොපැවතුනි. එම නිසා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ නව වර්ෂාපතන මිනුම් ගන්නා ස්ථාන 4ක් මෙම ව්‍යාපෘතිය යටතේ කාලගුණික විද්‍යා ජාතික ජාලයට එක් කිරීම සිදු කරන ලදී. ඒ අනුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ වවුනියා දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ශාඛා වන ඕමන්තෙයි, උළුක්කුලම්, චෙඩ්ඩිකුලම් හා නැදුන්කර්නි ජාතික කාලගුණ විද්‍යා දත්ත ජාලයට එකතු කරන ලදී.

මෙමනියමු ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද දිස්ත්‍රික් කාර්යාලවල කාර්ය මණ්ඩල සාමාජිකයින් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු වල ඉහත දිස්ත්‍රික්කයන්හි අදාළ විෂයභාර නිලධාරීන් සහභාගී කරවා ගනිමින් තොරතුරු හුවමාරු කර ගැනීම හා දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමය පිළිබඳව දැනුම ඉහල නැංවීම සඳහා 2017 වර්ෂයේදී වැඩමුළු සහ පුහුණු සැසි කිහිපයක් පැවැත්වීමට කටයුතු සකස් කරන ලදී. මේ වනවිට වව්නියාව දිස්ත්‍රික් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

මීට අමතරව දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමයේ වන්දි නිර්ණය කිරීමේ කටයුතු ඉතා නිරවද්‍යව සිදුකිරීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන ආයතන වල සහයෝගය ලබා ගනිමින් මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ වන විට දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය මගින් වවුනියා දිස්ත්‍රික්කයේ 2017/18 මහ කන්නයේ හානි ගණනය කිරීමේ කටයුතු සිදු කර අවසන් වන අතර, මණ්ඩලයේ රක්ෂණ අංශය මගින් දැනට පවතින ඇස් මට්ටමින් හානි තක්සේරුව අනුව වන්දි ගණනය කිරීම් සමග සංසන්දනාත්මක විශ්ලේෂණයන් කිරීමට අපේක්ෂිතය.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අයවැය පාලනය

2017වර්ෂය සඳහා සැලසුම් සකස් කිරීමේදී හා අයවැය වාර්තා පිළියෙල කිරීමේදී පැවති තත්වයන් අනපේක්ෂිත ලෙස වෙනස් වීම මත අපේක්ෂිත ආදායම් ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි විය. විශේෂයෙන් කෙතට අරුණ රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාපටිපාටියේ ඇතිවූ වෙනස්කම් මෙම තත්වයට සෘජුව බලපාන ලදී.

## 6.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම

කෘෂි රක්ෂණ මණ්ඩලය පෞද්ගලික අංශයේ රක්ෂණ ආයතන සමග තරඟකාරීත්වයෙහි යෙදෙන ආයතනයක් බැවින් අලෙවි කටයුතු සිදු කිරීමේදී දිරි දීමනා හා කොමිස් මුදල් ලබාදීම අත්‍යාවශ්‍ය කාරණාවක් වේ. මණ්ඩලයේ ව්‍යාපාරික ස්වභාවය අනුව දිරි දීමනා ලබාදීමකින් තොරව තරඟකාරී ලෙස අලෙවි කටයුතු වල නියැලී අපේක්ෂිත ඉලක්ක ළඟා කරගත නොහැක. එබැවින් කෘෂි රක්ෂණ පනත මගින් මණ්ඩලයට පවරා ඇති බලතල වලට අනුව අලෙවි දිරි දීමනා හා කොමිස් මුදල් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ගෙවීමට කටයුතු කර ඇත.

මෙහි සඳහන් කර ඇති අනෙකුත් දීමනාවන්ද කෘෂි රක්ෂණ කටයුතු වලට අමතරව විටින් විට මණ්ඩලයට පවරන ලද අනෙකුත් රාජකාරී කටයුතු ඉටු කිරීම වෙනුවෙන්, එනම් 1987 ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා 1990 ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ රාජකාරී කටයුතු ඉටු කිරීම වෙනුවෙන් එම යෝජනා ක්‍රම මණ්ඩලය වෙත පවරන අවස්ථාවලදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලබාදුන් දීමනා වේ.

## 7. පද්ධති හා පාලනයන්

සියළු දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කර ගනිමින් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා සියළුම දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කොට කළමනාකරණ තොරතුරු පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන අතර, එමගින් මණ්ඩලයේ සියළුම පාලන ක්ෂේත්‍රයන්හි පවත්නා දුර්වලතා මගහරවා ගනිමින් වඩා කාර්යක්ෂමව කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

### (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

i. කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය මගින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වෙත ලබාදුන් ණය මුදල් කෙටි කාලීනව ආපසු අයකර ගැනීමේ පදනම මත ලබාදී ඇති බැවින් ජංගම වත්කම් ලෙස දක්වා ඇත. දැනට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන්ම මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන අතර, ඉදිරියේදී මූල්‍ය ශක්‍යතාවයකින් යුතු යෝජනා ක්‍රමයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව මෙම ණය මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**ii,iii**

### (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 - රජයේ ප්‍රදාන සඳහා ගිණුම් තැබීම සහ රජයේ සහය හෙළිදරව් කිරීම.

මෙම මුදල මණ්ඩලයේ ආරම්භක ප්‍රාග්ධනය වන බැවින් ක්‍රමක්ෂය නොකරයි.

**2.2.4** **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**(අ)** මන්නාරම් දිස්ත්‍රික්කයේ වර්ග අඩි 100 ක පමණ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන ලද මන්නාරම් දිස්ත්‍රික් කාර්යාලය දිසාපතිතුමාගේ මැදිහත් වීම මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පළමු මහලේ වර්ග අඩි 920 ක බිම් ප්‍රමාණයක් තුල ඉදිකරන ලදී. මෙහිදී ඉදිකිරීමේ වියදම් වශයෙන් රුපියල් මිලියන 02 ක මුදලක් මණ්ඩලය මගින් දරා ඇති අතර, ඉදිකරන ලද ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගිවිසුමක් ඉදිරියේදී ඇතිකර ගැනීමට බලාපොරොත්තු වේ.

**(ආ)** අදාල කුලී ගිවිසුම් ඒ ඒ වර්ෂ වලදී රජයේ විගණනය වෙත ඉදිරිපත් කර ඇත. 2016 වර්ෂයට අදාල මහනුවර හා කෑගල්ල දිස්ත්‍රික් කාර්යාල වල බදුකුලී ගිවිසුම් ද මේ වන විට රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත.

**(ඇ)** තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ වැඩ සටහන ආරම්භ කිරීමත් සමඟම බාහිර නියෝජිත ජාලය ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ වූ අතර එම වැඩ සටහන යටතේ විශේෂ ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී අදාල බාහිර නියෝජිතයින්ගේ අනන්‍යතාවයපවත්වා ගැනීම සඳහා ඔවුන් වෙත මණ්ඩලීය නිල නාමය මුද්‍රිත ටී ෂර්ට් එක බැගින් ලබා දීම යෝග්‍ය බවට දිස්ත්‍රික් භාර විධායක නිලධාරීන්ගෙන් ලැබුණු ඉල්ලීම් අනුව, අදාල ටී ෂර්ට් දිස්ත්‍රික් කාර්යාල වලින් ලැබුණු ඉල්ලීම් ප්‍රමාණයන් සලකා බලා ප්‍රධාන කාර්යාලය මඟින් දිස්ත්‍රික් කාර්යාල වෙත නිකුත් කර ඇත. බාහිර නියෝජිතයින් තෝරා පුහුණු කිරීමෙන් අනතුරුව ඔවුන් වෙත නියෝජිත සහතිකපත් ප්‍රධානය කරන ලද අවස්ථාවේදීම ටී ෂර්ට් එක බැගින් ලබා දීම සිදු කෙරී ඇති අතර, දිස්ත්‍රික් කාර්යාල විසින් එම රැස්වීම්වලට සහභාගී වූ නියෝජිතයින්ගේ පැමිණීමේ ලේඛන ටී ෂර්ට් බෙදාහැරීමේ නාම ලේඛන වශයෙන්ද භාවිතා කර ඇත.මේ වන විට නියෝජිතයින් 2288 ප්‍රමාණයක් මෙම නියෝජිත අලෙවි ජාලය සඳහා බඳවාගෙන ඇති අතර, මෙමගින් සිදුකරන රක්ෂණ විකුණුම් වල ප්‍රගතිය දිනෙන් දින වර්ධනය වෙමින් පවතී.

**(ඇ) (i)** ඒ වන විට දකුණු පළාතේ පැවති ගංවතුර ආපදා තත්වය මත ජනාධිපතිතුමා විසින් එක් එක් ප්‍රදේශ අධීක්ෂණ කටයුතු අමාත්‍යවරුන් වෙත පවරා තිබූ අතර කෘෂිකර්ම අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මහතා වෙත පවරා තිබූ ප්‍රදේශය සඳහා වාහන යෙදවීමේ හිඟයක් අමාත්‍යාංශය තුල පැවති බැවින් එම ගංවතුර ආපදා තත්වය පැවති ප්‍රදේශ වෙත යොමුකිරීම සඳහා අමාත්‍යාංශය යටතේ පැවති අනෙකුත් ආයතන වෙතින් වාහන ලබා ගන්නා ලෙස උපදෙස් දී තිබිණි.

ඒ අනුව කෘෂිකර්ම අමාත්‍යාංශ ලිපි ශීර්ෂයෙන්, ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්ගේ අධිකාරිය යටතේ සිදුකල ඉල්ලීමක් අනුව මණ්ඩලය සතුව පැවති KI -2554 කැබ් රථය එවකට පැවති ආපදා තත්වයට සහන සැලසීමේ කාර්යයක් සඳහා යොමු කරන ලදී. මණ්ඩලීය සංචිතය තුල අදාල කාර්යය සිදුකිරීම සඳහා යෝග්‍ය රථයක් නොමැති වීමත්

බොහොමයක් රථ වසර 20 ඉක්මවා තිබීමත් හේතුවෙන් අදාල කාර්යය සඳහා මණ්ඩලය වෙතින් නිදහස් කල හැකිව පැවතියේ උක්ත කාර් රථය පමණි.

KI - 2554 දරණ මණ්ඩලීය කාර් රථය කෙටි දුර දිවීම සඳහා යොදවා ගනිමින් අනෙකුත් අපේක්ෂිත කාර්යය සඳහා අමාත්‍යාංශයේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සතු වෙනත් සුදුසු වාහනයක් යොදවා ගැනීම සිදුකර ඇති බව මාගේ හැඟීමයි. අදාල රථය වෙන් කර දීමෙන් අනතුරුව සිදුකරනු ලබන කාර්යයන් පිළිබඳව සොයා බැලීම රාජකාරී කටයුත්තකින් පරිබාහිර කරුණක් මෙන්ම දුෂ්කර කාර්යයක් බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

කෙසේ නමුත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක (PED) 12හි 8.3.9 වගන්තිය ප්‍රකාරව ඉදිරියේ දී කටයුතු කිරීමට වග බලා ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.

**(ii)1.** රාජකාරී කටයුතු ඉටුකිරීමේදී දිවයින පුරා විසිරී පවතින දිස්ත්‍රික් කාර්යාල වලට යාමටත් විශේෂයෙන් index base insuranceව්‍යාපෘතිය හා සම්බන්ධව අදාල ක්ෂේත්‍ර කටයුතු සඳහා සහභාගී වීමටත්, සභාපතිවරයාට සිදුවූ අතර ඒ සඳහා මෙම අතිරේක ඉන්ධන ලබාගෙන ඇත. අතිරේක ඉන්ධන ලබාදීම සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සඳහා ලිපි යොමු කර ඇත.

**11.**

**3.2** <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

**3.3** <u>අවිධිමත් ගනුදෙනු</u>

**(අ)** 2017/මැයි මාසයේ දිවයිනට ඇද හැළුණු අධික වර්ෂාව හේතුවෙන් ගාල්ල, මාතර, රත්නපුර දිස්ත්‍රික්කයන් හට දැඩි ගංවතුර බලපෑමක් ඇතිවූ අවස්ථාවේදී පවතින චක්‍රලේඛ උපදෙස් බාධාවක් කොට නොගෙන ගංවතුරෙන් පීඩාවට පත්වූ ජනතාව වෙත සහන සලසන ලෙස මාධ්‍ය මගින් රාජ්‍ය සේවකයන් වෙත ලබාදුන් උපදෙස් මත කෘෂි රක්ෂණ මණ්ඩලයද ක්‍රියාත්මක වෙමින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහන වැඩපිළිවෙලට සමගාමීව මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන ලදී.

ඉතා කඩිනමින් අවශ්‍ය කටයුතු සිදුකල යුතුව තිබූ බැවින් භාණ්ඩ හා සේවා ලබාගැනීමේදී සාමාන්‍ය ක්‍රමවේදයන් අනුගමනය කිරීමට අපහසු වීම නිසා මෙම තත්වය උද්ගත විය. එම සහන සඳහා වැයකල මුදල වන රු. 1,102,700/- මණ්ඩලය විසින් දැරූ අතර, ඉන් රු. 253,000/- ක මුදලක් පරිත්‍යාග ලෙස මණ්ඩලය වෙත ලැබුණි.

මෙයින් රු. 49,700/- ක මුදල පමණක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල බැවින්, රු.800,000/- ක ඉතිරි මුදල සභාපතිවරයාගේ පෞද්ගලික මුදලින් ප්‍රතිපූර්ණය කරන ලදී.

(ඇ) **සංයුක්ත සැලැස්ම**

(i) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වර්තමානයේදී ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමඟ එක්ව රාජ්‍ය ප්‍රතිපත්ති සෘජුවම ක්‍රියාත්මක කරන ආයතනයක් ලෙස හඳුන්වාදිය හැක. රාජ්‍ය ප්‍රතිපත්ති යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින පොහොර සහනාධාර වැඩසටහනට අදාලව සියලු රක්ෂණ කටයුතු සිදු කරන්නේ මණ්ඩලයයි. මෙම වැඩසටහනට අදාල රක්ෂණ කටයුතු රාජ්‍ය ප්‍රතිපත්තීන් සමග වෙනස් වීම් වලට භාජනය වේ.

මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන අනිකුත් රක්ෂණ යෝජනා ක්‍රම වෙළඳපොළ තත්ත්වය හා ඉල්ලුමට අනුව සුදුසු පරිදි වෙනස් වීම් වලට ලක් කරනු ලැබේ.

උදාහරණ වශයෙන් පසුගිය වර්ෂයේදී උක් වගාව හා රතුළූණු වගාව යන වගාවන් දෙකෙහි රක්ෂණ ක්‍රම යාවත්කාලීන කොට ඇත.

තවද වගා ණය ලබා ගැනීමට ඉල්ලුම් කෙරෙන වගාවන් සඳහා රක්ෂණ ආවරණය ලබා දීමේ එකඟතාවයක්ද රාජ්‍ය බැංකු සමඟ මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබයි.

මීට අමතරව වෙළඳපොළ ඉල්ලුම අනුව නව රක්ෂණ යෝජනා ක්‍රම සකස් කිරීමේ හා හඳුන්වාදීමේ කටයුතු සිදු කරනු ලබයි. උදාහරණ වශයෙන් පසුගිය කාල සීමාව තුල පාම් ඔයිල් වගාව හා කිරි වගාව සඳහා රක්ෂණ ආවරණයන් ලබාදීමට ඇති හැකියාව පිළිබඳව පර්යේෂණ මට්ටමින් තොරතුරු සොයා බලන ලදී.

රක්ෂණ ආයතනයක් සඳහා තත්ත්ව සහතික ලබා ගැනීමේදී සලකා බලන ප්‍රධාන කරුණක් වන්නේ ජාත්‍යන්තර රක්ෂණ ආයතනය ආවසරික සාමාජිකත්වය ලබා ගත් නිලධාරීන් (Charted Insurers) ආයතනයේ කාර්ය මණ්ඩලයේ සිටීද යන්නයි. එවැනි නිලධාරීන්ගේ සාමාන්‍ය වැටුප, රාජ්‍ය වැටුප් තල සමඟ සම කල නොහැක. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය රාජ්‍ය ආයතනයක් බැවින් මෙම ප්‍රශ්නයට දැඩිව මුහුණ දීමට සිදුව ඇත. නමුත් ආයතනයේ සිටින නිලධාරීන් එම තත්ත්වයට පුහුණු කිරීම සඳහා ලෝක බැංකුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ඇතිව නිලධාරීන් 50 දෙනෙකුට රක්ෂණ පාඨමාලාව හැදෑරීමට අවස්ථාවක් ලබා දී ඇත. එම නිලධාරීන් අතුරින් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට නිලධාරීන් සඳහා අයදුම්පත් කැඳවීමක් ද සිදු කර ඇත. ආයතනය තත්ත්ව සහතික ලබා ගැනීමට මූලික අඩිතාලම සකස් කරමින් පවතී.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, රේඛීය අමාත්‍යාංශය වන කෘෂි කර්ම අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය ප්‍රධාන කොට ගෙන අනෙකුත් අමාත්‍යාංශ හාආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින්, ඒ ඒ අමාත්‍යාංශ හා ආයතන සඳහාලබා දිය යුතු මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්තා හා අනෙකුත් වාර්තා සපයමින්මනා සම්බන්ධතාවයකින් යුක්තව කටයුතු කෙරේ.

එසේම මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන රක්ෂණ වැඩ පිළිවෙල සකස් කිරීමේදී ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ මනා සම්බන්ධතාවයකින් යුක්තව කටයුතු කෙරේ.

කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය රක්ෂණ කටයුතු සඳහා වූ එකම රාජ්‍ය ආයතනය වශයෙන් ගොවීන් විසින් ඉල්ලීම් කල ඕනෑම අවස්ථාවක ඕනෑම වගාවක් සඳහා රක්ෂණ ආවරණයක් ලබා දීම කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ කාර්ය භාරය වේ.

මණ්ඩලයපසුගිය වර්ෂයන්හි මෙන්ම මෙම වර්ෂයේදී ද  මණ්ඩලය මගින් ක්‍රියාත්මක කෙරෙන රක්ෂණ යෝජනා ක්‍රම ජනතාව වෙත හඳුන්වා දීමට උපක්‍රම රාශියක් යොදා ගනු ලැබීය. මෙම වර්ෂයේදීද දිස්ත්‍රික්ක කිහිපයක නියෝජිත ජාලය ස්ථාපන කටයුතු  සිදු කරන ලදී. මෙමඟින් ගොවියාට කෘෂි රක්ෂණ මණ්ඩලයේ සේවය ගම් මට්ටමින් ඉතා පහසුවෙන් ලබා ගැනීමට හැකි වේ. තව දුරටත් මෙම වැඩපිළිවෙල පුළුල් කිරීමට ආයතනය බලාපොරොත්තු වන අතර එමගින් පාරිභෝගික තෘප්තිය ඉහල යනු ඇත. තවද රජය සමඟ එක්ව ගොවිජනතාවට ඉහල සේවාවක් සැලසීමේ අරමුණින් රාජ්‍ය ප්‍රතිපත්තීන් සකස් කරමින් තෘප්තිමත් පාරිභෝගික කණ්ඩායමක් පවත්වා ගැනීමට උත්සාහ ගනී.

(ii) ඒ ඒ අංශ වල නිලධාරීන්ගේ විෂය පථය පිළිබඳ දැනුම හා නිපුණතාවය ඉහල නැංවීම සඳහා මණ්ඩලය නිරන්තරයෙන් අවධානය යොමු කෙරේ. ඔවුන්ගේ විෂයයන්ට අදාල පුහුණු වීම් සඳහා අවස්ථාව සලසා දෙනු ලබන අතර 2017 වසරේ පුහුණුවීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

- දේශීය පුහුණු

| අනු අංකය | පාඨමාලාව/ ආයතනය | නම | තනතුර | කාල සීමාව |
|---|---|---|---|---|
| 1 | Sri Lanka Insurance Institute - Insurance Foundation Course | කාර්ය මණ්ඩලයේ 50 දෙනෙකු පමණ | මණ්ඩලයේ නිලධාරීන් | 2017.02.11 - 2017.05.27 |
| 2 | PRAG Institute - බඳවා ගැනීම් පටිපාටිය පිළිබඳ පුහුණු වැඩමුළුව | A. ජයනි නිසංසලා මිය | සංවර්ධන නිලධාරි | 2017.02.28 |
| | | H. නිල්මිණි ප්‍රියංගනී මෙය | කළමනාකරණ සහකාර | |
| 3 | Actuarial Association of SriLanka - | I.U.K. කළුආරච්චි මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2017/06/12 -2017/06/13 |
| | | S.M.U.G.S.K.සුභසිංහ | සහකාර අධ්‍යක්ෂ | |

| | | | | |
|---|---|---|---|---|
| | 1st South Asian Actuarial Conference -2017 | මහතා | | |
| | | D.K. දිසානායක මෙය | සහකාර අධ්‍යක්‍ෂ | |
| 4 | University Of Colombo School Of Computing - JAVA SE | I.S.E. ජයසූරිය මහතා | දෘඩාංග හා ජාලකරණ ශිල්පී | දින 08 |
| 5 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - විධායක නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | D.S.R.හෙට්ටිආරච්චි මෙය | සහකාර අධ්‍යක්‍ෂ | 2017/09/07, 2017/09/14, 2017/09/21 |

- විදේශීය පුහුණු

| අනු අංකය | පාඨමාලාව/ආයතනය | නම | තනතුර | විදේශ පුහුණුව ලද රට | කාල සීමාව |
|---|---|---|---|---|---|
| 1 | GIIF Asia Insurance - Intensive Technical Trainingon Fundamentals of Named Peril index Insurance GIIF Transfer Process - International Financial Corporation | S.M.U.G.S.K. සුභසිංහ මයා | සහකාර අධ්‍යක්‍ෂ | ඉන්දුනීසියාව | 2017/05/15-2017/05/19 |
| | | D.K.දිසානායක මෙය | සහකාර අධ්‍යක්‍ෂ | | |
| | | M.C.P.කුමාර මයා | ව්‍යාපෘති කණ්ඩායම් නියෝජිත | | |

**(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම හා එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පරීක්ෂාව</u>**

**(iv,v)** අදාල වර්ෂයේ වගා රක්‍ෂණ ආදායම් වලට ඇතුළත් වනුයේ 2016/2017 මහ කන්නයේ සහ 2017 යල කන්නයේ ආදායම් වේ. මෙම වගා කන්න දෙකේදීම දිවයිනේ ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්කවල පැවති දැඩි නියං තත්ත්වය හේතුවෙන් බීමට පවා ජලය නොමැති වීම තුල ජන ජීවිත අඩපණ වී රට පුරා මහත් ව්‍යසන තත්ත්වයක් උද්ගත වී තිබුණි. බොහෝ ජලාශ සම්පූර්ණයෙන්ම සිඳී යාම නිසා ජලය නිකුත් කිරීමට නොහැකි වීමෙන් වගා කිරීමට හැකි වූ ඉඩම් ප්‍රමාණයද සීමා විය. වගා කල ඉඩම්වලටද අවශ්‍ය ජල ප්‍රමාණය ලබා දීමේ ගැටළු තත්ත්වය මත එම වගාවන් විනාශ වීමට තිබූ ඉඩකඩ ප්‍රමාණය වැඩි වීම මත වගා රක්‍ෂණ කටයුතු වලට ජනතාව උනන්දු කිරීමටද මණ්ඩලයට හැකියාවක් නොවීය. එසේ වුවද, වගා

ණය යටතේ රක්‍ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමට බැංකු සමඟ ඇති එකඟතාවයන් මත අදාල වගාවන් සඳහා රක්‍ෂණ ආවරණය ලබා දීමට මණ්ඩලයට සිදුවිය. එමෙන්ම, නියඟය නිසා ගොවිජනතාවගේ ආර්ථිකයට දැඩි බලපෑමක් සිදු වූ අතර මණ්ඩලීය අනෙකුත් රක්‍ෂණ යෝජනා ක්‍රම ව්‍යාප්ත කිරීමේදී හා අදාල වර්ෂයේ ආදායම් උපයා ගැනීමේදී ද එම තත්ත්වය අහිතකර ලෙස බලපා ඇත. රක්ෂිත වගාවන් සඳහා නියමිත වන්දි මුදල ගෙවීම මණ්ඩලයේ වගකීමක් වූ අතර රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව වගා හානි වූ සියළුම ගොවීන් වෙත වන්දි මුදල් ගෙවීමට සිදුවීම හේතුවෙන් රජයේ ප්‍රතිපාදන මත විශාල වන්දි මුදලක් ගෙවීමට සිදු වී ඇත.

**(vi)** මණ්ඩලය මඟින් තෙවන පාර්ශවීය රථ වාහන රක්‍ෂණ වැඩ සටහන ක්‍රියාත්මක කරන ලද්දේ කෘෂිකාර්මික වාහන සඳහා රක්‍ෂණ ආවරණය ලබා දීමට පමණක් නොව පනත මඟින් මණ්ඩලය වෙත ලැබී ඇති කෘෂිකාර්මිකයාගේ සියළුම චංචල හා නිශ්චල දේපල රක්‍ෂණය කිරීමේ බලතල පදනම් කරගෙනය.එබැවින්, කෘෂිකාර්මික වාහන පමණක් නොව කෘෂිකාර්මිකයා විසින් භාවිතා කරනු ලබන සියළුම වාහන රක්‍ෂණය කිරීම් කටයුතු ක්‍රියාත්මක කර ඇති අතර ප්‍රතිලාභ ගෙවීමකින් තොරව ශුද්ධ ආදායමක් ලබාගත හැකි එකම රක්‍ෂණ යෝජනා ක්‍රමය වශයෙන් මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීම සඳහා නිලධාරීන් විසින් වැඩි අවධානයක් මෙම රක්‍ෂණ වැඩ සටහන සඳහා දැක්වීම මත අනෙකුත් රක්‍ෂණ ආදායම් අභිබවා මෙම රක්‍ෂණ වැඩසටහන යටතේ වැඩි ආදායමක් උපයා ගැනීමට හැකිවී ඇත.

**(viii)** ඉදිරියේදී මේ සඳහා අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව මෙම රක්ෂණ යෝජනා ක්‍රම නිසි අයුරින් ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරනු ලැබේ.

මේ වන තෙක් ශ්‍රී ලංකාවේ වගා හානි හා ඉහත කරුණු අතර සම්බන්ධතාවයන් පිළිබඳ පර්යේෂණයන් සිදු කර නොමැති බැවින් යම් ප්‍රදේශයකට/දිස්ත්‍රික්කයකට වර්ෂාව මත පදනම් වූ දර්ශකය යොදා ගැනීමේදී ප්‍රදේශයේ සාමාන්‍ය  වර්ෂාපතනය, ගොවිතැන් කිරීම් සඳහා ජලය ලැබෙන ජල මූලාශ ( මහාවාරි/ මධ්‍යවාරි / සුළුවාරි ) වාරිමාර්ග වල, ගොවීන් වෙත ජලය ලැබෙන ජල මුර ගණන ආදිය සියුම්ව අධ්‍යනය කිරීමට සිදුව ඇත.

එසේම වර්ෂාපතන දත්ත මත පදනම් වූ දර්ශකයක් සෑදීමේදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් වර්ෂාපතන දත්ත ලබා ගැනීමට හැකි වේ යැයි, එම ආයතනයෙන් මුලින් ප්‍රකාශ කලත් වවුනියාව වැනි දිස්ත්‍රික්ක වල එක් වර්ෂාපතන මිනුම්  ස්ථානයක් පමණක් ඔවුන් සතු වූ අතර අනෙකුත් ආයතන මගින් පවත්වා ගෙන යන කාලගුණික මධ්‍යස්ථාන වල පැතිරීමද අවශ්‍ය මට්ටමින් නොපැවතුනි. එම නිසා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ නව වර්ෂාපතන මිනුම් ගන්නා ස්ථාන 4ක් මෙම ව්‍යාපෘතිය යටතේ කාලගුණික විද්‍යා ජාතික ජාලයට එක් කිරීම සිදු  කරන ලදී. ඒ අනුව ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ වවුනියා දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා

දෙපාර්තමේන්තුවේ ශාඛා වන ඕමන්තෙයි, උළුක්කුලම්, වෙඩ්ඩිකුලම් හා නැදුන්කර්නි ජාතික කාලගුණ විද්‍යා දත්ත ජාලයට එකතු කරන ලදී.

මෙමනියමු ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද දිස්ත්‍රික් කාර්යාලවල කාර්ය මණ්ඩල සාමාජිකයින් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු වල ඉහත දිස්ත්‍රික්කයන්හි අදාල විෂයභාර නිලධාරීන් සහභාගී කරවා ගනිමින් තොරතුරු හුවමාරු කර ගැනීම හා දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමය පිළිබඳව දැනුම ඉහළ නැංවීම සඳහා 2017 වර්ෂයේදී වැඩමුළු සහ පුහුණු සැසි කිහිපයක් පැවැත්වීමට කටයුතු සකස් කරන ලදී. මේ වනවිට වව්නියාව දිස්ත්‍රික් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

මීට අමතරව දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමයේ වන්දි නිර්ණය කිරීමේ කටයුතු ඉතා නිරවද්‍යව සිදුකිරීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන ආයතන වල සහයෝගය ලබා ගනිමින් මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ වන විට දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය මගින් වවුනියා දිස්ත්‍රික්කයේ 2017/18 මහ කන්නයේ හානි ගණනය කිරීමේ කටයුතු සිදු කර අවසන් වන අතර, මණ්ඩලයේ රක්ෂණ අංශය මගින් දැනට පවතින ඇස් මට්ටමින් හානි තක්සේරු ව අනුව වන්දි ගණනය කිරීම් සමග සංසන්දනාත්මක විශ්ලේෂණයන් කිරීමට අපේක්ෂිතය.

## 4.3 <u>හඳුනාගත් පාඩු</u>

**(අ)** තෙවන පාර්ශව බාහිර නියෝජිත ජාලය වෙනුවෙන් ටී ෂර්ට් 6000 ක් ලබා දිය යුතු බව මුලදී තීරණය කර තිබුණ ද නියෝජිතයන් බඳවා ගැනීම වරින්වර සිදුකල බැවින් මෙසේ අවස්ථා කීපයකදී ටී ෂර්ට් මුද්‍රණය කිරීමට සිදුවිය. මෙය විධිමත්ව සිදුකල යුතු බැවින් ඉන් පසුව සිදුකල මිලදී ගැනීම් නියමිත මිල ගණන් කැඳවීම් සිදුකර අවම මිල යොදා ටී ෂර්ට් මුද්‍රණය කරන ලදී. එහෙත් මින් ඉදිරියට නියමිත ප්‍රසම්පාදන නියමයන් ප්‍රකාරව සිදු කරන බව දැනුම් දෙමි.

**(ආ)** මණ්ඩලයසතුව ඩුප්ලෝ යන්ත්‍රයක් පැවතියද එමගින් මණ්ඩලයේ සියළුම මුද්‍රණ කටයුතු ප්‍රධාන කාර්යාලයේ ඇති මෙම ඩුප්ලෝ යන්ත්‍රය මගින් සිදු කිරීම ප්‍රායෝගික නොවේ.

විශේෂයෙන් 2015,2016 වර්ෂ වලදී ක්‍රියාත්මක කරන ලද කෙතට අරුණ රක්ෂණ යෝජනා ක්‍රමය හා 2017 වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලද 2016/2017 මහ කන්නයේදී නියඟය නිසා පීඩාවට පත් ජනතාවට වන්දි ගෙවීම වැනි මුළු දිවයිනම ආවරණය වන දැවැන්ත වන්දි ගෙවීම් යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික් කාර්යාල වල මුද්‍රණ අවශ්‍යතාවයන් ප්‍රධාන කාර්යාලයේ ඩුප්ලෝ යන්ත්‍රය භාවිතා කොට සිදු කිරීම ප්‍රායෝගික නොවන අතර, විශාල

වන්දි ඉල්ලුම්පත් ප්‍රමාණයක් කඩිනමින් දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදා හැරීමට අවශ්‍ය වී තිබියදී යම් ප්‍රමාදවීමක් සිදුවුවහොත් සමස්ථ වන්දි ගෙවීම් ක්‍රියාවලියම ප්‍රමාදවීමේ සම්භාවිතාවක් ඇති බැවින්, විශේෂයෙන් මෙම කඩිනම් වන්දි ගෙවීමේ යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාදයකින් තොරව ගොවීන් හට වන්දි නිදහස් කිරීම සඳහා අවශ්‍ය වන්දි ඉල්ලුම්පත් අතුළු දිස්ත්‍රික් කාර්යාල වල අනෙකුත් මුද්‍රණ අවශ්‍යතාවයන් දිස්ත්‍රික්ක මට්ටමින් සිදුකර ගැනීමට අවශ්‍ය අත්තිකාරම් ප්‍රධාන කාර්යාලය මගින් ලබාදීමට කටයුතු කරන ලදී.

කෙසේ වුවද, ඉදිරියේදී සියළුම අංශ වලින් හා දිස්ත්‍රික් කාර්යාල වලින් ඔවුනොවුන්ගේ මුද්‍රණ අවශ්‍යතාවයන් කල් වේලා ඇතිව පුරෝකථනය කොට පාලන අංශය වෙත ලබා ගනිමින්, මණ්ඩලයේ සියළුම මුද්‍රණ කටයුතු වඩාත් ඵලදායීව මධ්‍යගතකොට එතුලින් පිරිවැය පාලනය කිරීමටද අපේක්ෂා කෙරේ.

ඉදිරියේදී දිස්ත්‍රික් කාර්යාල වෙතින් මුද්‍රණ කටයුතු ඉටු කරගැනීම වලක්වා ප්‍රධාන කාර්යාලය තුලින් මුද්‍රණ කටයුතු කිරීමට වැඩපිලිවෙලක් සකස්කරමින් පවතී. එසේම දිස්ත්‍රික් කාර්යාල සඳහා අත්‍යවශ්‍ය ලේඛණයන් මුද්‍රණය කිරීමට අවශ්‍ය වන අවස්ථාවල ඒ සඳහා විශේෂ අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**4.6** <u>මූල්‍ය කළමනාකරණයේ දුර්වලතා</u>

**(ඇ)(i)** මෙසේ ගෙවා ඇති මුදලින් රු. 354,700/- ක මුදලක් ගොවීන් හට පොහොර සහනාධාර ලබාදීමේදී ද, රු. 60,500/- ක මුදලක් ගොවීන්ගෙන් සෘජුවමද අයකරගෙන ඇත. මේ අනුව ඉහත ගෙවීමට අදාලව නියමිත පරිදි මුදල් අයකර ගෙන ඇත.

**(අ)**

vi. මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන මූලික රක්ෂණ යෝජනා ක්‍රමය වන වගා රක්ෂණ යෝජනා ක්‍රමය තුල පවත්නා දැඩි අවධානම් තත්වය හේතු කොට ගෙන මණ්ඩලයේ අරමුදල් දිගු කාලීන ආයෝජන තුල ආයෝජනය කිරීම ප්‍රායෝගික නොවේ. එබැවින් මුදල් ප්‍රවාහ පුරෝකථන තුලින් මණ්ඩලයේ ද්‍රවශීලතා අවශ්‍යතාවය හඳුනා ගනිමින් උපරිම පොළී ආදායමක් උපයාගත හැකි පරිදි මණ්ඩලයේ ආයෝජන කටයුතු දැනටමත් සිදුකරනු ලබයි. ඉදිරියේදී හැකි සෑම විටම ආයෝජන වලින් උපරිම ප්‍රතිඵල ලැබෙන පරිදි දිගුකාලීන ආයෝජනයන් සිදුකිරීමට බලාපොරොත්තු වේ.

vii. මණ්ඩලය විසින් මේ වන විට තෙවන පාර්ශව රක්ෂණය සඳහා දිරිදීමනා ක්‍රමයක් සලස්වා දී ඇති අතර ඉදිරියේදී එය පුළුල්ව ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ.

viii. ආයතනය සඳහා අනුප්‍රාප්ති සැලසුම් ව්‍යාප්ත කිරීමට ඉදිරියේදී කටයුතු කෙරෙමින් පවතින අතර මණ්ඩලීය නිලධාරීන් පුහුණු වැඩමුළු සඳහා බාහිර අංශයන් වෙත යොමු කිරීම මේ වන විටත් සිදුවේ. ඉදිරියේදී එය වර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

xi. කාර්යමණ්ඩල අවශ්‍යතාවයන් දිගුකාලීනව හඳුනාගෙන පැවතිය ද මූල්‍ය ප්‍රතිපාදන සීමා සහිත වීම නිසා බඳවාගැනීම් සිදුකිරීමට ගැටළු පැනනැගීම මෙයට හේතුවේ.

(අ) විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි රක්ෂණ කාඩ්පත් නිකුත් කිරීම විධිමත් කර ගැනීම සඳහා අළුතින් මුද්‍රණය කිරීමට නියමිත කාඩ්පත් ලක්ෂයක ප්‍රමාණයක් මුද්‍රණය කිරීමේදී එම කාඩ්පත්වල අංක TP-00001 සිට අනු අංක සහිතව මුද්‍රණය කරවීමට කටයුතු කරන ලෙස පාලන හා සැපයුම් අංශය වෙත දැනුම් දී ඇත.

(ආ) රු.40,000ක රක්ෂණ ආවරණය ලබා දීමට අදාල අමාත්‍යාංශ චක්‍රලේඛනය 2017.12.13 දින නිකුත් කෙරුණු අතර එම චක්‍රලේඛනයට අනුව, රක්ෂණ වැඩ සටහන 2017/2018 මහ කන්නයේ සිට ක්‍රියාත්මක කළ යුතු විය. කන්න කීපයක් තිස්සේ අඛණ්ඩව පැවති නියඟය හේතුවෙන් වැව් අමුණු සිඳී යාමත්, වර්ෂාව නොලැබීම නිසා බොහෝ කෘෂිකාර්මික දිස්ත්‍රික්කවල ජල හිඟය හේතු කොට ගෙන එම කන්නයේ වගා කටයුතු නියමිත දිනවලදී ආරම්භ කිරීමට නොහැකි තත්ත්වයක් යටතේ වගා කටයුතු දිස්ත්‍රික් මට්ටමේ අදාල නිලධාරීන්ගේ තීරණ මත අත්හැරීමට හා මාස කීපයක් ඉදිරියට ගෙන යාමට කටයුතු කර ඇත. එබැවින්, එම කන්නයේ වගා කටයුතු ආරම්භ කිරීම ප්‍රමාදව ඇති බැවින්, රක්ෂණ වැඩසටහනට අදාල ලිපි ලේඛන චක්‍රලේඛනය නිකුත් කිරීමෙන් අනතුරුව දිස්ත්‍රික් කාර්යාල වෙත ලබා දීම වගා රක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී විශේෂ බලපෑමක් සිදුවී නොමැත.

(ඇ) රු.40,000ක රක්ෂණ ආවරණ ලබා දෙන ලදරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ගොවීන්ගෙන් නියමිත රක්ෂණ වාරික මුදල් අයකර රක්ෂණ ආවරණය ලබා දීමේ වගකීම අදාල චක්‍රලේඛනය මඟින් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වෙත පවරා ඇත. සෑම කුවිතාන්සි පොතකම භාර දෙන අවස්ථාවේදී වාරික මුදල් අයකිරීම පිළිබඳව එම නිලධාරීන්ට ලබා දෙන ලද ලිඛිත උපදෙස් පත්‍රිකාව මඟින් වගාවන් පරීක්ෂාකර බලා සුදුසු හොඳ තත්ත්වයේ ඇති වගාවන්ට පමණක් රක්ෂණ ආවරණය ලබා දෙන ලෙස උපදෙස් ලබා දී ඇත. මෙම මණ්ඩලයේ කාර්යයන් සඳහා සහයෝගය දක්වන එම නිලධාරීන් අතින් යම් අතපසු වීමක් සිදුවී තිබුණද, වන්දි මුදල් ගෙවීමේදී අදාල අංශය විසින් වගා හානිය පිළිබඳව ඉදිරිපත් වී ඇති තොරතුරු පරීක්ෂා කිරීමෙන් අනතුරුව පමණක් වන්දි මුදල් නිදහස් කෙරෙනු ඇත.

(ඈ) 2017 යල කන්නයේ මේ වන විට ගොවීන් 23,582 සඳහා රුපියල් මිලියන 199 ක මුදලක් ගෙවා ඇත. අංශයට ලේඛණ ලද විගස ගෙවීම් කර ඇත .

(ඉ) 2017/18 මහ කන්නය වගා කාලසටහන් සාමාන්‍යයෙන් අවසන් වනුයේ මාර්තු අප්‍රේල් මාසවලදීය. කුඹුරු වල ගොයම් තිබියදී (විශේෂ ආපදාවක දී හැර) වන්දි ගෙවීම් කල නොහැකිය. කන්නය අවසන් වී හානි තක්සේරු කර නිර්දේශ ලබා දීමෙන් පසු ගෙවීම් කිරීම ආරම්භ කල හැකිය. කන්නය අවසන්වී ඇති නිර්දේශ ලබා දී ඇති ගොවීන් තෝරා ගෙන

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන් 532 කට මුදල් ගෙවා ඇත. සෙසු ලේඛණ සඳහා මේවන විට චන්දි ගණනය කරමින් සිටී.

චන්ද්‍රිකා තාක්ෂණය මගින් ලබා ගන්නා ලද තොරතුරු මත හානියේ ස්වභාවය වෙනස් විය හැකි බැවින් එම තොරතුරු ලැබෙන තෙක් හා රක්ෂණය වීම සිදුවූයේ කන්නය ආරම්භ වී කලක් ගතවීමෙන් පසු බැවින් අක්කරයට උපරිමය රු. 20,000/-ක් වනසේ ගෙවීම් කිරීමට කටයුතු කර ඇත.

**(ආ)** 2018 අයවැය යෝජනා මගින් නිර්දේශිතව ක්‍රියාත්මක වූ රු.40,000ක රක්‍ෂණ ආවරණය ලබා දීමේ නව රක්‍ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම මණ්ඩලය වෙත පැවරීම මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කර ගැනීමට ලද මහඟු අවස්ථාවක් විය. එම වැඩසටහන යටතේ වාරික මුදල් අයකර ගැනීමේ කටයුතු කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වෙත පැවරුනද, බාහිර ආයතනයක නිලධාරීන් වශයෙන් සියළුම ගොවීන් හමුවී ඒ පිළිබඳව දැනුවත් කිරීම සිදුවෙතැයි පසුගිය කාලය තුළ මණ්ඩලීය රක්‍ෂණ යෝජනා ක්‍රම ව්‍යාප්ත කිරීම දෙස බලන විට අපේක්‍ෂා කල නොහැක. එබැවින්, අදාල ගොවීන් දැනුවත් කර ඔවුන් එම නිලධාරීන් වෙත යොමු කිරීම වඩාත් සාර්ථක විය හැකි බැවින්ද, කෙටි කාලයක් තුල එය සිදුකල යුතු බැවින්ද, ඒ සඳහා සුදුසුම මාධ්‍යක් වන රූපවාහිනී සහ ගුවන්විදුලි මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දීම අත්‍යාවශ්‍ය කරුණක් බවට දිස්ත්‍රික් භාර නිලධාරීන් හා අංශ ප්‍රධානීන් විසින් යෝජනා කරන ලදී. ඒ අනුව, අදාල ප්‍රචාරක වියදම් අත්‍යාවශ්‍යම කටයුත්තක් වෙනුවෙන් මණ්ඩලය විසින් දරා ඇති අතර වගා රක්‍ෂණ වැඩ සටහන ප්‍රචාරය සඳහා දීර්ඝ කාලීන ප්‍රතිඵල අපේක්‍ෂාවෙන් සිදු කරන ලද ආයෝජනයක් වශයෙන්ද සැලකිය යුතුව ඇත.

**(ඇ)** මීට පෙර මණ්ඩලය විසින් සිදු කරගෙන යන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුමැතිය නොලැබීම මත නවත්වනු ලැබිය. එහිදී ලංසු ඉදිරිපත් කරන ලද ආයතන හතරෙන් තුනක්ම නව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහාද ලංසු ඉදිරිපත් කරන ලද බැවින් එම මුදල් නව ක්‍රියාවලියට හිලවු කරගන්නා ලද අතර, ඉතිරි ආයතනය සඳහා අදාල මුදල් ආපසු ගෙවනු ලැබීය

**5.2** **<u>පාරිසරික හා සමාජ වගකීම ඉටුකිරීම.</u>**

**(අ)**

**(ඇ)** මණ්ඩලය මගින් රක්‍ෂණ යෝජනා ක්‍රම රාශියක් ක්‍රියාත්මක කෙරෙන අතර එක් එක් යෝජනා ක්‍රමයට අදාල ගොවීන්ගේ ඉල්ලීම් එක් ලිපි ගොනුවක පවත්වාගෙන යාමේදී කඩිනමින් ඒ සම්බන්ධයෙන් සොයා බැලීමේ අපහසුතාවය මත එක් එක් යෝජනා ක්‍රමයට අදාලව ගොවීන්ගේ ගැටළු සඳහා විසඳුම් ලබාදීමේදී, දිස්ත්‍රික් මට්ටමින් ගනු ලබන ක්‍රියාමාර්ග හා

ප්‍රධාන කාර්යාලයෙන් ක්‍රියාමාර්ග ගැනීම සඳහායොමු කිරීමට අදාල ලිපි පිටපත්ද සමඟ එක් එක් යෝජනා ක්‍රම අනුව වෙන් වෙන්ව ලිපි ගොනු පවත්වාගෙන යනු ලැබේ.

(ඈ) මේ වන විට 2017/18 මහ කන්නයේ වගා හානි සඳහා වන්දි ගෙවීම් කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව වන්දි අයදුම්පත් සම්පූර්ණ කර ඇති දිස්ත්‍රික්ක වෙත ප්‍රධාන කාර්යාලයෙන් නිළධාරී කණ්ඩායම් ගොස් වන්දි ගණනය කිරීම් සිදුකරමින් පවතී. වන්දි ගෙවීම් සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදනයන් මහා භාණ්ඩාගාරයෙන් හා ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ලබා ගැනීමට අපේක්ෂිතය.

(ඉ) ඉදිරියේදී සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කෙරීගෙන යන බැවින් මෙම තත්වය ඉදිරියේදී මගහැරී යනු ඇත.

විදුලි පණිවිඩ } රක්ෂණ
தந்தி } ரக்ஷன
Telegrams } Rakshana

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

117, සුභද්රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd, Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. 2017/4/5/මු/ගො/2
ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. ..................
දිනය / திகதி / Date 2018.05.15

විගණන අධිකාරී,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

**<u>2017 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.</u>**

2017 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමග ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

| දුරකථන / தொலைபேசி / Telephones | සභාපති / தலைவர் | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் |
|---|---|---|---|
| | 011-2812571 | 011-5732397 | 011-5384000 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011-2812572 | 011-2812574 | |
| | 011-2812573 | | |

**ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම.**

අංක 153/49 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සංශෝධනය කිරීමට කටයුතු කර ඇති අතර ස්වයං මූල්‍ය පදනමකින් පවත්වාගෙන යා හැකි නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් එමගින් හඳුන්වාදෙන ලදී. ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වුවද විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ගොඩ නැගී ඇති විශ්‍රාම වැටුප් වගකීමට සාපේක්ෂව අරමුදල ගොඩනැගීම සඳහා මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

**2.2.2 සම්බන්ධිත පාර්ශව ගනුදෙනුහෙළිදරව් නොකිරීම.**

ගොවීන්ගේ මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් කෘෂි රක්ෂණ අරමුදලට ගෙවිය යුතු මෙම මුදල ගිණුම් සටහන් අංක 9 මගින් හෙළිදරව් කර ඇත. වර්ෂයට අදාලව එම අරමුදලට සිදු කරන බැර කිරීම් ජ'නල් සටහන් අංක 16 මඟින් ඉදිරිපත් කර ඇති අතර, ඊට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කර ඇත.

**2.2.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති.**

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ස්ථාවර වත්කම් ගිණුම් ගත කිරීමේදී මණ්ඩලයේ ප්‍රතිපත්තිය වන්නේ පිරිවැය අගය මත වත්කම් ගිණුම්ගත කිරීමයි. ඒ අනුව සියළුම ස්ථාවර වත්කම් නිසි පරිදි ගිණුම් ගත කර ඇත.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

(i) 2007 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිළිබඳ සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් ඉදිරියේදී මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර නිසි පරිදි වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) 15,000 කට අධික ගොවීන් සංඛ්‍යාවක් විශ්‍රාම වැටුප් ලැබීම සඳහා පොරොත්තු ලේඛණයේ සිටි බැවින් එම ගොවීන් කඩිනමින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විශ්‍රාම වැටුප් ලේඛණයට

ඇතුලත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. ඉදිරියේදී කිසිම හිඟ මුදලක් ඇති නොවන පරිදි විශ්‍රාම වැටුප් හිමිකම ලබන අවස්ථාවේදීම විශ්‍රාම වැටුප් ලේඛණයට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. මෙම හිඟ මුදල භාණ්ඩාගාර ප්‍රතිපාදනයන් අනුව ඉදිරියේදී ක්‍රමිකව ගෙවීමට කටයුතු කරනු ලබන අතර, විශ්‍රාම වැටුප් ගෙවනු ලබන අවස්ථාවේදී ගිණුම්ගත කිරීම කරනු ලැබේ.

**2.2.4 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මෙය රජයේ ප්‍රධානයක් නොවන අතර, එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානය මගින් ලබාදුන් මූල්‍ය ආධාරයක් වන අතර, ඉදිරි වර්ෂයේදී ක්‍රමක්ෂය කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.**

**(අ)** විගණන ගාස්තු ක්‍රමිකව ගෙවීමට කටයුතු කරනු ලැබේ.

**(ආ)** නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේදී වැඩි ප්‍රතිලාභ ගොවියා වෙත ලැබෙන බැවින් මෙම මුදල් ඒ සඳහා හිලව් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

මහා භාණ්ඩාගාරය මගින් ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වූ අවස්ථාවේදී විශ්‍රාම වැටුප් ගෙවීමට මණ්ඩලය සතු අනෙකුත් අරමුදල් යොදා ගන්නා ලෙසට ලබාදුන් උපදෙස් අනුව, කෘෂි රක්ෂණ අරමුදලින් හා ධීවර විශ්‍රාම වැටුප් අරමුදලින් අවශ්‍ය අරමුදල් ණයක් ලෙස ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට ලබා ගන්නා ලදී.

**2.3 නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**(අ) 15(2),(3) වගන්ති**

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායක වී ඇති ගොවීන් අඛණ්ඩව වාරික 05 ක් ගෙවීම පැහැර හැරියහොත් ඔවුන්ගේ දායකත්වය අවලංගු වන අතර ඒ පිළිබඳව අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කර ඇත. එසේ දායකත්වය අවසන් වූ ගොවීන්ගේ ගෙවූ වාර මුදල් ඔවුන්ගේ වයස 60 සම්පූර්ණ වන අවස්ථාවේදී ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ආ) 20 වගන්තිය**

ඉදිරියේදී පුරප්පාඩුව පවතින උපදේශක කාරක සභා සාමාජිකයින් සියළුම දෙනා පත්කිරීමෙන් අනතුරුව රැස්වීම් පැවැත්වීම ද නිසි පරිදි සිදුකිරීමට අපේක්ෂා කරනු ලබයි .

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

දැනට මෙම යෝජනා ක්‍රමය මූල්‍ය ශක්‍යතාවයකින් තොරව මහා භාණ්ඩාගාරයේ පූර්ණ අනුග්‍රහය මත පවත්වාගෙන යනු ලබන අතර, දායකයින්ගේ සක්‍රියභාවය තහවුරු කර ගැනීම හා විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් පූර්ණ අවධානය යොමු කර ඇත. ඉදිරියේදී මූල්‍ය ශක්‍යතාවයකින් යුතු නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී විස්තරාත්මක ක්‍රියාකාරී සැළැස්මක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

(අ) 2014 වර්ෂයේ දී නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමත් සමග නව බඳවා ගැනීම් සිදුකිරීමට අපේක්ෂා කළ ද රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් වීමත් සමගම නව රජයේ දින සියයේ වැඩසටහන යටතේ නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලෙස මණ්ඩලය වෙත උපදෙස් ලැබුණි. ඒ අනුව ක්‍රියාත්මක වී නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස්කොට කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමුකර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමුකරන ලදී. මෙහි දී මෙම යෝජනා ක්‍රමය විශේෂඥ කමිටුවකට යොමු කිරීමෙන් උපදෙස් ලබාගත යුතු බවට අතිගරු ජනාධිපතිතුමා සහ අග්‍රාමාත්‍යතුමා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇති බැවින් නව රජයේ ප්‍රතිපත්තියට අනුව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහ ගතකොට නව බඳවාගැනීම් සිදුකිරීමට අපේක්ෂා කරනු ලැබේ.

(ආ) දායකයින් පිළිබඳ සියළු තොරතුරු පරිගණක ගත කරමින් පරිගණක පද්ධතිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට බලාපොරොත්තු වේ.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරණ ගොවි විශ්‍රාම වැටුප් අති විශේෂ ගැසට් නිවේදනය පරිදි විශ්‍රාම වැටුප් ගෙව්වද මෙම යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු වාරිකය ඉහල අගයක් ගත් බැවින් මේ සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවන්හිදී ලබාදුන් උපදෙස් පරිදි මෙම යෝජනා

ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කරන ලද අතර ඒ අනුව මෙම යෝජනා ක්‍රමයට බඳවා ගැනීම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීමට සිදු විය. නව රජයේ දින සියයේ වැඩසටහන යටතේ නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලෙස මණ්ඩලය වෙත උපදෙස් ලැබුණි. ඒ අනුව ක්‍රියාත්මක වී නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස්කොට කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමුකර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමුකරන ලදී. මෙහි දී මෙම යෝජනා ක්‍රමය විශේෂඥ කමිටුවකට යොමු කිරීමෙන් උපදෙස් ලබාගත යුතු බවට අතිගරු ජනාධිපතිතුමා සහ අග්‍රාමාත්‍යතුමා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇති බැවින් නව රජයේ ප්‍රතිපත්තියට අනුව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහ ගතකොට නව බඳවාගැනීම් සිදුකිරීමට අපේක්ෂා කරනු ලැබේ.

(ආ) වයස අවුරුදු 60 සම්පූර්ණ වීමත් සමගම විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ලබන බව දායකත්වය ලබන අවස්ථාවේදීම ගොවීන්ට දැනුවත් කිරීමට කටයුතු කරන අතර, ඒ සම්බන්ධව අදාල දායකත්ව ඔප්පුවේද සඳහන් කොට ඇත. තවද, දිස්ත්‍රික් කාර්යාල මගින් විටින් විට දායකයින් සඳහා පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී ද අදාල දැනුවත් කිරීම් සිදු කරනු ලබයි.

(ඇ) දිස්ත්‍රික් කාර්යාලවලට ලැබෙන විශ්‍රාම වැටුප් අයදුම්පත් හා ඊට අදාල ලේඛණ වල ඇති අඩුපාඩු හේතු කොටගෙන මූලික වශයෙන්ම මෙම ප්‍රමාදවීම් සිදුවේ. කෙසේ වෙතත් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සියළු දායකයින්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් ඉදිරියේදී ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන අතර, එතුලින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුල කාර්යක්ෂම ක්‍රමවේදයක් ස්ථාපිත කරමින්, ඉදිරියේදී දායකයින් හට කඩිනම් සේවාවක් සැපයීමට බලාපොරොත්තු වේ.

(ඈ) 2014 නව ගැසට් පත්‍රයට අනුව ප්‍රතිව්‍යුහගත කරන ලද නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට පැරණි සාමාජිකයින් අනුයුක්ත කිරීම සිදුකරන ලදී. එහිදී නව ගැසට් පත්‍රය අනුව සාමාජිකයින් විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ලැබීමෙන් පසු මියගියහොත් කලත්‍රයාට විශ්‍රාම වැටුප් හිමි නොවේ. ඉදිරියේදී එම සංඛ්‍යාලේඛණ විගණනයට ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

(ඉ) දිස්ත්‍රික් කාර්යාල වෙත ලැබෙන සියළුම මහජන ඉල්ලීම් සහ විශ්‍රාම වැටුප් ලේඛණගත කිරීම සිදුකරනු ලැබේ. නමුත් පැමිණිලි සහ ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීමේදී ඇතැම් දායකයන් සඳහා ප්‍රමාදයන් සිදුවී ඇත.

මෙම තත්වය සඳහා ඔවුන් භාරදෙනු ලබන ලිපි ලේඛණවල සිදුවන අඩුපාඩු ද හේතු සාධක වී ඇත.

කෙසේ වෙතත් ඉදිරියේදී දිස්ත්‍රික් කාර්යාල වෙත ලැබෙන සියළුම ඉල්ලීම් පරිගණක ගතකර e-mail මගින් ලේඛණ ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා අධීක්ෂණය කිරීමටත්, ගොවීන් විසින් කරනු ලබන ඉල්ලීම් පසු විපරම් කිරීම පහසු වීම සඳහා ඉල්ලීම් අංකයක් ලබාදීමටත් කටයුතු කරනු ඇත.

(ඊ) නොගෙවූ විශ්‍රාම වැටුප් කඩිනමින් ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර දැනටමත් ගනු ලබන අතර, අවශ්‍ය විටදී සිහිකැඳවීම් පවා යවනු ලැබේ.

(උ) මෙම ශේෂයන් වසර 15-25ක් අතර පැරණි ශේෂයන් වන අතර 2003 වර්ෂයේදී මේ පිළිබඳ සොයා බලා නිවැරදි කල හැකි සියළුම ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කල අතර එසේ සොයා ගත නොහැකි වූ ශේෂයන් මෙලෙස ඉදිරියට ගෙනවිත් ඇත. මෙම තත්වයට බොහෝ විට හේතු වී ඇත්තේ එකම චෙක්පතට දෙවරක් රිසිට්පත් නිකුත් කිරීම වේ. මේ පිළිබඳව දිගින් දිගටම විගණන කමිටු වලදී හා මහා භාණ්ඩාගාරයේදී පැවති විශේෂ සාකච්ඡා වලදී කරුණු සොයා බැලීමෙන් පසුව, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එහි අනුමැතිය ලැබූ පසු ගිණුම් වලින් කපාහැරීමට බලාපොරොත්තු වේ.

**4.3 <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්</u>**

(අ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්ව තොරතුරු යාවත්කාලීන කිරීමේ වැඩසටහනේදී, තොරතුරු ඉදිරිපත් කර තිබූ ගොවීන්ගේ සංඛ්‍යාව අඩු අගයක් ගත්ත ද ලැබී ඇති තොරතුරු දිස්ත්‍රික් මට්ටමින් පරිගණක ගත කොට යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත.

(ආ) දැනටමත් දායකයා මිය ගිය බවට මණ්ඩලයට විධිමත්ව දැනුම් දීමෙන් අනතුරුව එම දායකයාගේ විශ්‍රාම වැටුප් අත්හිටුවීමට කඩිනමින් පියවර ගන්නා අතර, දායකයා මියගිය බවට විධිමත්ව දැනුම් දීමක් නොකලද, අඛණ්ඩව වාරික 06 ක විශ්‍රාම වැටුප් ලබා නොගත් දායකයින්ගේද විශ්‍රාම වැටුප් ගෙවීම අත්හිටුවීමට කටයුතු කරනු ලැබේ.

**4.4 <u>මතභේදයට තුඩු දෙන ගනුදෙනු</u>**

මෙම ගෙවීමට අදාල නිවැරදි පාර්ශවයන් වෙත කඩිනමින් ගෙවීම් සිදුකර මෙය නිවැරදි කරන ලෙස අදාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වෙත දන්වන ලදී.

**5. <u>තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම</u>**

වයස අවු: 60 සම්පූර්ණ වූ ගොවි ජනතාව වෙත විශ්‍රාම වැටුපක් ලබා දීම හා සමාජ සුභසාධනය අරමුණු කර කොට ගෙන 1987 අංක 12 දරන විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය ස්ථාපිත කොට ක්‍රියාත්මක කරන ලදි. මෙම යෝජනා ක්‍රමයේ වර්තමානය වන විට දායක වී ඇති මුළු ගොවීන් සංඛ්‍යාව 959,254 කි.

2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරණ ගොවි විශ්‍රාම වැටුප් අති විශේෂ ගැසට් පත්‍රයේ පරිදි විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කලද එම යෝජනා ක්‍රමයේදී දායකයා විසින් ගෙවිය යුතු වාරිකය ඉහල අගයක් ගත් බැවින් මේ සම්බන්ධව පැවති සාකච්ඡා වලදී ලබා දුන් උපදෙස් පරිදි මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කරන ලද අතර ඒ අනුව මෙම යෝජනා ක්‍රමයට බඳවා ගැනීම් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද විය. නව රජයේ දින සියයේ වැඩ සටහන යටතේ නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට මණ්ඩලය වෙත උපදෙස් ලැබුණි. ඒ අනුව නව යෝජනා ක්‍රමයක් සකස් කර කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කරන ලදී. එහිදී එම යෝජනා ක්‍රමය විශේෂඥ කමිටුවකට යොමු කර උපදෙස් ලබා ගත යුතු බව අතිගරු ජනාධිපතිතුමා හා අග්‍රාමාත්‍යතුමා නිරීක්ෂණය කර ඉදිරිපත් කර ඇති බැවින් රජයේ ප්‍රතිපත්ති වලට අනුව පවතින විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහ ගත කොට නව බඳවා ගැනීම් සිදුකිරීමට අපේක්ෂා කරනු ලැබේ.

ඒ අනුව විශේෂඥ කමිටුවකට ලබා දීම සඳහා නව යෝජනා ක්‍රම සහිත වාර්තාවක් නැවත 2018 අප්‍රේල් මසදී අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. එම විශේෂඥ කමිටුවෙන් තීරණය ලබා ගැනීමෙන් පසු ඒ අනුව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීමටත් ඒ සම්බන්ධව පැන නගින ගැටලු නිරාකරණය කිරීමටත් බලාපොරොත්තු වේ.

ගොවි විශ්‍රාම වැටුප් දායකත්වය ලබා ඇති තවමත් වයස අවුරුදු 60 සම්පූර්ණ නොවූ දායකයින්ගේ වාරික ගෙවීම් පිළිබඳ තොරතුරු පරිගණක පද්ධතියට ඇතුලත් කොට පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු යොදා ඇති අතර 2018 ජනවාරි මස සිට පසු වාරික පරිගණක ගත කිරීමද සිදු කරනු ලබයි.

මාසික විශ්‍රාම වැටුප් ගොවීන් හට ගෙවීම් කටයුතු වලදී තැපැල් දෙපාර්තමේන්තුව හා දිසා ගණකාධිකාරීවරුන් අප සමඟ සම්බන්ධීකරණය වන අතර එම ගෙවීම් කටුයුතු වලදී අප නිරන්තරයෙන් ඔවුන් හා සම්බන්ධවේ. තවද ඒ හා සම්බන්ධ ගැටලු වලදී අප නිරතුරුවම ඔවුන්ව දැනුවත් කිරීම් කටයුතුද සිදු කරනු ලබයි. එසේම ගොවිජන සේවා මධ්‍යස්ථානද ගොවීන්ගේ නිත්‍යානුකුලභාවය තහවුරු කර ගැනීම් වලදී හා වාර මුදල් ලබා ගැනීම් වලදී අප හා සම්බන්ධීකරණය වේ.

## 6. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

### 6.1 <u>අයවැය පාලනය</u>

යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමට ලක් කරමින් තිබූ නිසා අයවැය මගින් බලාපොරොත්තු වූ ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි වී ඇත.

## 6.2 සමාජ වගකීම ඉටු කිරීම

**(අ)** දායකත්වය අවලංගු වූ ගොවීන්ට ශුද්ධ වාරික ගෙවීම් කිරීමේදී යම් ප්‍රමාදයක් සිදුවී ඇත. මෙම අංශය සඳහා අනුයුක්තව ඇති නිළධාරීන්ගේ හිඟතාවය මත නිළධාරීන් මේ සඳහා අනුයුක්ත කිරීමේ ගැටළුව මෙම ප්‍රමාදයට හේතුවිය. එසේ වුවද මේ වන විට කාර්ය මණ්ඩලය යොදවා මෙම ගෙවීම් යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත.

**(ආ)** මෙම මුදල් මාසිකව ගිණුම්ගත නොකරන අතර, වර්ෂ අවසානයේදී මෙය ජ’නල් සටහන් මගින් ගිණුම්ගත කොට ඇත.

## 7. පද්ධති හා පාලනයන්

නොගෙවූ විශ්‍රාම වැටුප් කඩිනමින් ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර දැනටමත් ගනු ලබන අතර, අවශ්‍ය විටදී සිහිකැඳවීම් පවා යවනු ලැබේ. කළමනාකරණ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් මේ වනවිටත් දැඩි අවධානයක් යොමු වී ඇත.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams: රක්ෂණ / ரக்ஷன / Rakshana
117, සුභද්රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117 Subadrarama Rd, Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No.: 2017/4/5/මූ/ර/2
ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No.:
දිනය / திகதி / Date: 2018.04.24

විගණන අධිකාරී,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

**<u>2017 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.</u>**

2017 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමග ඉදිරිපත් කරමි.

සභාපති,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

දුරකථන / தொலைபேசி / Telephones
ෆැක්ස් / பெக்ஸ் / Fax

සභාපති / தலைவர்: 011-2812571, 011-2812572, 011-2812573
අධ්‍යක්ෂ ජනරාල්: 011-5732397, 011-2812574
ප්‍රධාන කාර්යාලය / தலைமையகம்: 011-5384000

**<u>ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්ථාව සඳහා පිළිතුරු</u>**

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මතය</u>

### 2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 2.2.1 <u>විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම</u>

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අනාගත වගකීම ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය වාර්තා වල හෙළිදරව් කර ඇත. මෙම යෝජනා ක්‍රමය මූල්‍ය ශක්‍යතාවයක් නොමැති රාජ්‍ය සහනාධාරය මත පදනම් වූ යෝජනා ක්‍රමයක් බැවින් මෙලෙස අනාගත වගකීම ඉහළ ගොස් ඇත. ඉදිරියේදී ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කොට මූල්‍ය ශක්‍යතාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

#### 2.2.2 <u>ගිණුම්කරණ ප්‍රමිති</u>

**(අ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 01</u>**

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ලබාදුන් මෙම ණය මුදල කෙටි කාලීනව අයකර ගැනීමේ පදනම මත ලබාදී ඇති බැවින් ජංගම වත්කමක් ලෙස දක්වා ඇත. දැනට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන්ම මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන අතර, ඉදිරියේදී මූල්‍ය ශක්‍යතාවයකින් යුතු යෝජනා ක්‍රමයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව මෙම ණය මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**(අ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 37</u>**

2007 වර්ෂයේදී ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිළිබඳ සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් ඉදිරියේදී මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර නිසි පරිදි වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

මහා භාණ්ඩාගාරය මගින් ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වූ අවස්ථාවේදී විශ්‍රාම වැටුප් ගෙවීමට මණ්ඩලය සතු අනෙකුත් අරමුදල් යොදා ගන්නා ලෙසට ලබාදුන් උපදෙස් ලිපියට අනුව මෙම ණය මුදල ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ලබාදී ඇත.

## 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) විගණන ගාස්තු ඉදිරියේදී ක්‍රමිකව පියවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මෙම වියදම දරා ඇත්තේ වාර්ෂික වාර්තා මුද්‍රණ කටයුතු සඳහා වන අතර, එම සියළුම වියදම් කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය තුලින් පියවා ඇත. මෙම යෝජනා ක්‍රමයට අදාල වියදම ඉදිරියේදී ක්‍රමිකව කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය වෙත ගෙවීමට කටයුතු කරනු ඇත.

(ඇ) දැනට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන්ම මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන අතර, ඉදිරියේදී මූල්‍ය ශක්‍යතාවයකින් යුතු යෝජනා ක්‍රමයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව මෙම ණය මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවීම

### (අ) (i) 16 වගන්ගතිය

අඛන්ඩව වාරික 10 ක් නොගෙවූ දායකයින්ගේ දායකත්වය අහෝසි වන බව යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේ ධීවරයින්ට පූර්ව දැනුම් දීමක් කර ඇත.

තවද, එසේ දායකත්වය අවලංගු වීම පිළිබඳව දැනුම් දීම ධීවර දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර, දායකත්වය අවලංගු වූ ධීවරයින්ට ධීවර දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල මගින් නව දායකයකු ලෙස නැවත ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීමට හැකියාව ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

## 3.3 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධීන්

2003 ඔක්තෝබර් නඩුතීන්දුව අනුව රුපියල් 5,411,930.85 ක මුදලක් මණ්ඩලයට ලබාදෙන ලෙස තීරණය වුවද, ලංකා බැංකුව මගින් මෙම මුදල් ගෙවීමට නොහැකි බව පවසා අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. එහිදී ලබාදුන් තීරණය මත රුපියල් 37,672,911 ක් අයකර ගැනීමට මණ්ඩලයට හැකිවූ අතර, එම මුදල ප්‍රමාණවත් නොවන බව අධිකරණය වෙත දැනුම් දී ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන්නේ ධීවර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව වන අතර සාමාජිකයින් බඳවා ගැනීම ඇතුලුව කාර්ය සාධනය ක්‍රියාත්මක වනුයේ ධීවර දෙපාර්තමේන්තුව මගිනි. කෙසේ වුවද, ඉදිරියේදී ධීවර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කොට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකයින් බඳවා ගැනීම් ඉහල නැංවීමටත්, වඩා කාර්යක්ෂමව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පවත්වාගෙන යාමටත්, මූල්‍ය ශක්‍යතාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීමටත් බලාපොරොත්තු වේ.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය.

අයවැය ලේඛනය ඵලදායීව කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම.

මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන්නේ ධීවර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව වන අතර සාමාජිකයින් බඳවා ගැනීම ඇතුලුව කාර්ය සාධනය ක්‍රියාත්මක වනුයේ ධීවර දෙපාර්තමේන්තුව මගිනි.ඉදිරියේදී ධීවර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව මෙම යෝජනා ක්‍රමය මූල්‍ය ශක්‍යතාවයකින් යුතු නව යෝජනා ක්‍රමයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමට අපේක්ෂා කරන අතර, ඒ අනුව වඩා ඵලදායී ක්‍රියාත්මක සැලැස්මක් අනුව යෝජනා ක්‍රමය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

## 6. පද්ධති සහ පාලනයන්

### (අ) දායක මුදල් කළමනාකරණය

නොගෙවූ විශ්‍රාම වැටුප් කඩිනමින් ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර දැනටමත් ගනු ලබන අතර, අවශ්‍ය විටදී සිහිකැඳවීම් පවා යවනු ලැබේ.

### (ආ) කළමනාකරණ තොරතුරු පද්ධතිය

කළමනාකරණ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් මේ වනවිටත් දැඩි අවධානයක් යොමු වී ඇත.